# ඇ නියමුවා

ISSN 1391 - 1031 | 2021 ජූලි විද්‍යුත් මුද්‍රණය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, 'දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය' වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළි නොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**19 පිටුව**



උදා තරුවකි
වැටී නොමියෙන
බලන් පෙරඹර අහස
බැබලෙන
හෙටක් ගැන ගී ගයා
ඇහැරෙන

අඳුර පමණක් රැගෙන
දෝතට
දුවන ලෝකෙක අනාගතයට
එළිය මේ යැයි කියා
ඉර ඇවිත් පායා ගියා

ඉරේ පැහැයට පිපුණු මල්වල
සුවඳ මහපොළොවට උරා
ගිරි දුර්ගවල ශුෂ්ක බිම්වල
මහ පොළොව ඇත දළු ලලා

නියං සායේ පිපෙන මල්වල
වසන්තය ඇත ලියවෙලා
සහෝදර වැහි ලිහිණි
හඬකට
ගිමන් කල යයි හේදිලා

උදා තරුවේ උපත අභිමුව
ගන අඳුර ගිය හේදිලා
තෙකල් දුටු ඒ දෙනෙත්
හමුවේ
මහා පොදු මඟ ඇහැරිලා

**(ජූලි 14 දිනට යෙදෙන සදාදරණීය නායක රෝහණ විජේවීර සහෝදරයාගේ උපන් දිනය වෙනුවෙනි)**


දේශපාලන විවරණ ......03
තරුණ .................... 04
කාලීන .................... 05
ජාත්‍යන්තර.................. 06
ආර්ථිකය .................... 07
කාන්තා .................... 08
දැක්ම .................... 09
විශ්ලේෂණ.................... 10
වේදිකාව.................... 11


# බියවැද්දීමේ කතා

# ආණ්ඩුවේ බංකොලොත්භාවයේ ප්‍රකාශනයක්

මේ වන විට ආණ්ඩුවක් ලෙස මෙහෙය වනු ලබන සියලු ක්ෂේත්‍රයන්හි අසාර්ථක වී සිටින වත්මන් ආණ්ඩුව එම අසාර්ථකභාවයන්ට පිළිතුරු සොයාගැනීමට අසමත්වීම හමුවේ විපක්ෂයේ බලවේග, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන් හා සිවිල් ක්‍රියාකාරිකයින් ඇතුළු ජනතාව බියවැද්දීමේ නිර්ලජ්ජිත උත්සාහයක නිරත වී සිටින බව පෙනෙන්නට තිබේ.

මේ වන විට ආණ්ඩුවක් ලෙස මෙහෙය වනු ලබන සියලු ක්ෂේත්‍රයන්හි අසාර්ථක වී සිටින ආණ්ඩුව එම අසාර්ථකභාවයන්ට පිළිතුරු සොයාගැනීමට අසමත්වීම හමුවේ විපක්ෂයේ බලවේග, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන් හා සිවිල් ක්‍රියාකාරිකයින් ඇතුළු ජනතාව බියවැද්දීමේ නිර්ලජ්ජිත උත්සාහයක නිරත වී සිටින බව පෙනෙන්නට තිබේ.

මේ පිළිබඳ නවතම උදාහරණය වූයේ ජොන්ස්ටන් ප්‍රනාන්දු මහාමාර්ග අමාත්‍යවරයා පසුගිය 29වැනි දින රාජ්‍ය නිලධාරීන් සමග පැවති සාකච්ඡාවකදී ජනාධිපතිවරයා සහ ආණ්ඩුව හොඳ වැඩි බැවින් ප්‍රශ්න වැඩි වී ඇති බවත් කාක්කෙකු මරා තටුව එල්ලුවේනම් සියල්ල අවසන් වන බවත් පැවසීමය. කෙසේ වුවද ඔහු මෙසේ පළමුව මරා දැමිය යුතු කපුටා කවුදැයි නිශ්චිතව ප්‍රකාශ කර තිබුණේ නැත.

ආණ්ඩුව බරපතළ මූල්‍ය අර්බුදයක ගිලී සිටින අතර රුපියල් බිලියන 208ක මුදල් මුද්‍රණය කර තිබුණේ පසුගිය 28දාය. ඩො.බි. 4.5ක විදෙස් සංචිත ප්‍රමාණවත් වනුයේ මාස 03ක කාලයක භාණ්ඩ ආනයනයට පමණය. 2021 වසර තුළ ගෙවිය යුතු විදෙස් ණය ප්‍රමාණය ඩොලර් බිලියන 04කි. ණය ගෙවීමේ හැකියාව අනුව ශ්‍රී ලංකාව සිටින්නේ ශ්‍රේණිගත කිරීමේ අවසන් රටවල් 10 අතරය. එනම් බංකොලොත්භාවය අද්දරය. මෙම දුර්වල ආර්ථික තත්වය හමුවේ ආණ්ඩුව ලබා දුන් පොරොන්දු ඉටු කිරීම තබා පවතින සහනාධාර පවත්වා ගෙන යාම පවා ආණ්ඩුවට දුෂ්කර වී තිබේ.

ආණ්ඩුව මහත් පාරම්බාමින් ගන්නා ලද බොහෝ තීරණ ඒ ක්ෂණයකින්ම ආපසු හැරවීමට සිදුව ඇති අතර වේගයෙන් ඉදිරියට යමින් ඇත්තේ මහජන දේපළ විකිණීම, පෞද්ගලීකරණය වැනි නව ලිබරල්වාදී ව්‍යාපෘති සහ වංචා දූෂණ

*02 වැනි පිටුවට*




2021.06.29 රිදීමාලියද්ද නගරයේදී...

## තෙල් සංස්ථාව බහුජාතික සමාගම්වලට පැවරීමේ පනත පැරදවිය යුතුයි

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික **වසන්ත සමරසිංහ සහෝදරයා**



**ආණ්ඩුව තමන්ගේ හා හිතවතුන්ගේ ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් ඛනිජ තෙල් සංස්ථාව බහු ජාතික සමාගම්වලට පැවරීමට අරඅඳින බවට චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වසන්ත සමරසිංහ සහෝදරයා, ව්‍යාජ දේශප්‍රේමය ගැන කියවූ ගම්මන්පිල අමාත්‍යවරයා විසින් ගෙන එනු ලබන පනත පරාජය කිරීමේ සටන වෙනුවෙන් ඒකරාශි වන ලෙස ප්‍රගතිශීලී සියලු දෙනාට ආරාධනා කළේය.**

වසන්ත සමරසිංහ සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 09වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පැවති මාධ්‍ය හමුවේදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද කියා සිටියේය.

"ඛනිජ තෙල් සංස්ථාවට තෙල් ආනයනය කරන්න එල්.සී. එක ඕපන් කරන්න බැරි තත්වයට පත්කර තිබෙන්නේ මේ රටේ ජනතාව ණයට තෙල් ගහලා නෙවෙයි. තෙල් එක්ක බැඳිලා තියෙන්නේ වාහනවලට තෙල් ගහන එක විතරක් නෙවෙයි. කර්මාන්ත, බලශක්තිය, විදුලි බල නිෂ්පාදනය, කියන සියල්ල බැඳිලා තියෙනවා. ඒනිසා ඛනිජ තෙල් බලය අත්කර ගන්නා සමාගම් ආණ්ඩුව බිත්තියට හේත්තු කරලා තමන්ගේ වැඩ කරගන්න උත්සාහ කරනවා.

අපේ රටේ තෙල් සංස්ථාව විකුණනවා කියන්නේ සරල කාරණයක් නෙවෙයි. මේ රටේ ජනතාවගේ අයිතියක් හැටියට තියෙන තෙල් සංස්ථාව ඇමතිවරයාගේ තනි පෑන් පහරෙන් තමන් කැමති ඕනෑම කෙනෙකුට දෙන්න යනවා. සංස්ථාව ගොඩගන්න බැරි තරම් පාඩුවක හිරවෙලා තියෙන බව නොකියා ඩොලර් මිලියන 3,000ක ආයෝජකයෙක් එන බව කියනවා. වෘත්තීය සමිති ව්‍යාපාරය, ප්‍රගතිශීලී සංවිධාන, දේශපාලන පක්ෂ හැටියට අපි ජනතාවගෙන් ඉල්ලන්නේ මේ දේශද්‍රෝහී වැඩේට ඉඩ දෙන්න එපා කියලා."

## ඉන්ධන මිල වැඩි කිරීමේ තීරණය වහා හකුළා ගත යුතුයි

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් **විජිත හේරත් සහෝදරයා**



**ගොවි ජනතාව හා ධීවර ජනතාව මේ ලක්වෙලා ඉන්න පීඩනයෙන් මුදා ගැනීම සඳහා වහාම තෙල් මිල අඩු කළ යුතු බවත් ජනතාවට බොරු නාඩගම් නොපෙන්වා සැබෑ ජනතා ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතු බවත් ඛනිජ තෙල් මත පනවා ඇති රජයේ බදු අඩු කර ජනතාවට සහන මිලට තෙල් ලබා දිය යුතු බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ඉන්ධන මිල වැඩි කිරීමේ තීරණය වහා හකුළාගන්න ලෙස ආණ්ඩුවට බල කර සිටියේය.**

විජිත හේරත් සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 17වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"ගම්මන්පිල ඇමතිවරයා කියනවා තෙල් ගෙන්වන්න විදියක් නැහැ ඩොලර් හිඟයක් කියලා. නමුත් ජනාධිපතිවරයා නිවේදනයක් දාලා කියනවා තෙල් මිල වැඩි කළේ දේශීය ආර්ථිකය නගාසිටුවන්න කියලා. අපි ජනාධිපතිවරයාට කියනවා ඔබ දන්න ආර්ථික විද්‍යාව අනුව තෙල් මිල වැඩි කළාම දේශීය ආර්ථිකය නගින්නේ කොහොමද කියලා අපිට කියල දෙන්න. ජනතාව මේක පැහැදිලි කරගන්න කැමතියි. රටේ ඕනෑම පොඩි ළමයෙක් පවා දන්නවා තෙල් මිල වැඩි කළාම සියලුම බඩුවල මිල වැඩිවෙනවා කියලා.

සමගි ජන බලවේගය විශ්වාසභංගයක් ගෙනල්ලා උදය ගම්මන්පිලට එරෙහිව. අහක ඉන්න පෙත්තප්පු කෙනෙක්ට එරෙහිව විශ්වාශභංගයක් ගෙනල්ලා ආණ්ඩුවට එරෙහි විරෝධය යටගහන්න දෙන්න පුළුවන්ද? දැන් ආණ්ඩුවේම විශ්වාසය භංගවෙලා තියෙන්නේ. ජනතාවගේ අටඅනූවක් දෝෂ භංග කරගැනීමේ අභියෝගයට මුහුණ දීලා ඉන්නේ. ගිනිකෙළි සංදර්ශනවලින් මේවා යටපත් කරන්න දෙන්න බැහැ."

*යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!*

# සටන් බිම

## කොවිඩ් අවසන් කිරීමේ ඉලක්කයක් ආණ්ඩුවට තිබිය යුතුයි

### ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා



මේ වන විට ආණ්ඩුව කොරෝනා මර්දනයේදී සියලු පැතිවලින් අසාර්ථක වී ඇති බවත් දැන් සිදුවන්නේ කොරෝනා පාවිච්චි කරමින් ආණ්ඩුවේ දේශපාලනික වුවමනාවන් සපුරාගැනීමේ කටයුතු බවත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා පවසයි.

'කොරෝනා සමග ජීවත් වෙමු' යන්න තේමාව වීමෙන්ම කොරෝනා මර්දනයට තමන් අසමත් වී ඇති බව ආණ්ඩුව විසින් පිළිගෙන ඇති බවත් ආණ්ඩුවේ සැලසුමකින් තොර අවිද්‍යාත්මක ක්‍රියාමාර්ග නිසා එසේ වී ඇති බවත් ඒ තුළ රට දැවැන්ත අර්බුද ගණනාවකට මුහුණ දී ඇති බවත් ලාල් කාන්ත සහෝදරයා පැවසුවේ පසුගිය 23වැනි දින මාධ්‍ය හමුවක් අමතමිනි.

කොරෝනා සමග ජීවත්වෙනවා වෙනුවට නිවැරදි වැඩපිළිවෙළක් සහිතව කොරෝනා අවසන් කිරීමට ආණ්ඩුව කටයුතු කළ යුතුව ඇති බවද එම නිවැරදි පිළිවෙත අනුගමනය කරන්නේ නම් රටේ වැඩකරන ජනතාව සහාය දීමට සූදානම් බවද ඔහු මෙහිදී ප්‍රකාශ කළේය. එවැනි වැඩපිළිවෙළක් වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය වෘත්තීය සමිති විසින් ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇති නමුත් එයට තවම කිසිදු ප්‍රතිචාරයක් ලබාදී නැති බවත් ඔහු මෙහිදී පැවසීය. නමුත් දැන් ආණ්ඩුව අනුගමනය කරමින් සිටින පිළිවෙත ජනතාව තව තවත් පීඩනයකට පත් කිරීමේ පිළිවෙතක් බවද එයට එරෙහිව දැන් වැඩකරන ජනතාව ඇතුළු සියලු ක්ෂේත්‍රවල ජනතාව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් ලාල්කාන්ත සහෝදරයා මෙහිදී පැවසීය.

මෙම මාධ්‍ය හමුව සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, ලංකා ගුරුසේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ, සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සමන්ත කෝරලේආරච්චි යන සහෝදරවරුද එක්ව සිටියහ.

## ගැටලු නොවිසඳීමට විරෝධය පා සෞඛ්‍ය කාර්යමණ්ඩල වෘත්තීය ක්‍රියාමාර්ගවල



කොවිඩ් වසංගත තත්වය හමුවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මුහුණ දෙන ගැටලු විසඳන ලෙස සෞඛ්‍ය ඇමතිවරිය ඇතුලු බලධාරීන්ට කොතෙක් ඉල්ලීම් කළද මේ දක්වා එම ගැටලු සඳහා විසඳුමක් ලබා නොදී ඇති බවත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සේවය නොසලකා හැරීමක් සිදු කිරීම හේතුවෙන් සමස්ත ලංකා සුව සේවා සංගමයේ මූලිකත්වයෙන් රට පුරා පළාත් මට්ටමින් විරෝධතා ක්‍රියාමාර්ග සිදු කරන ලදී.

ඒ අනුව ඌව පළාතේ බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවලින් ආරම්භ කරන ලද පැය 04ක වර්ජනයක් සහ උද්ඝෝෂණ පැවැත්වීමට කටයුතු කෙරිණි. සංචරණ සීමා යටතේ ප්‍රවාහන පහසුකම් ලබානොදීම, කොවිඩ් ප්‍රතිකාර සඳහා අවශ්‍ය උපකරණ ලබා නොදීම ඇතුළු ගැටලු ගණනාවක් නොවිසඳීම හේතුවෙන් මෙම වර්ජනය බස්නාහිර, මධ්‍යම, වයඹ හා නැගෙනහිර පළාත්වලද ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ බව සමස්ත ලංකා සුව සේවා සංගමයේ ලේකම් සමන්ත කෝරලේආරච්චි සහෝදරයා පැවසීය. එසේම බහුකාර්ය සංවර්ධන බලකා සාමාජිකයින් සෞඛ්‍ය කාර්යමණ්ඩල රාජකාරී සඳහා අනීතිකව යෙදවීමට ආණ්ඩුව ගත් තීරණයට විරෝධය පළ කරමින් දිස්ත්‍රික් ගණනාවක විරෝධතා උද්ඝෝෂණ පැවැත්වීමට කටයුතු කළ බවද ඔහු වැඩිදුරටත් පැවසීය.

එසේම නුපුහුණු හෙද හෙදියන් කෝවිඩ් ප්‍රතිකාර කරන රෝහල්වල දැඩි සත්කාර ඒකකවල සේවය සඳහා යෙදවීමට එරෙහිව රෝහල් ගණනාවක විරෝධතා ක්‍රියාමාර්ග ගැනීමට සමස්ත ලංකා හෙද සංගමය තීරණය කරන ලදී. ඒ අනුව පේරාදෙණිය රෝහලේ හෙද හෙදියන් පැය 04ක අසනීප නිවාඩු සහිතව එම විරෝධතාවය පැවැත්වීමට කටයුතු කිරීමෙන් පසු බලධාරීන් ගත් තීරණය ආපසු හැරවීමට සමත් වූ බව සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් එස්.බී. මැදිවත්ත සහෝදරයා නියමුවා වෙත පැවසීය.

## ගැටලුවලට විසඳුම් නැත්නම් හෝටල් සේවකයින් මහ පාරට

### හෝටල් සේවක මධ්‍යස්ථානය




හෝටල් සේවකයින්ට රු. 15,000ක සහන දීමනාවක් ලබාදීම, කොවිඩ් එන්නත ලබාදීම, ණය සඳහා පොලී රහිත සහන කාලය දීර්ඝ කිරීම, සේවයේ නියුතු සියලු හෝටල් සේවකයින්ට වැටුප් කප්පාදුවකින් තොරව ලබාදීම, රක්ෂණ ආවරණයක් ලබාදීම යන ප්‍රධාන ඉල්ලීම් ලබාදෙන ලෙස ආණ්ඩුවට බල කර සිටින බව හෝටල් සේවක මධ්‍යස්ථානය පවසයි.

ආණ්ඩුව විසින් කෝටි ගණනින් වන වාහන ගෙන්වා සුඛෝපභෝගී ජීවිතය පවත්වාගෙන යාමට සැලසුම් කරද්දී කිසිදු ආදායමක් නොලබන හෝටල් සේවකයින් සඳහා කිසිදු දීමනාවක් ලබාදීමට මේ දක්වා කටයුතු කර නොමැති බවත් සංචරණ සීමා දමමින් ආණ්ඩුවේ සියලු දේශපාලන වුවමනාවන් සිදු කරගනිමින් තිබෙන බවත් නමුත් හෝටල් සේවකයින්ගේ ජීවත්වීමේ අවම පහසුකම් හෝ ලබාදීමට ආණ්ඩුව කටයුතු කර නොමැති බවත් මේ නිසා මොන සීමාවන් දැම්මත් ඉදිරියේදී හෝටල් සේවකයින් සමග පාරට බැසීමට කටයුතු කරන බවත් හෝටල් සේවක මධ්‍යස්ථානයේ සභාපති නීතිඥ ජානක අධිකාරී සහෝදරයා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය.

මෙම මාධ්‍ය හමුව සඳහා හෝටල් සේවක මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක ජයතිලක රණසිංහ, ටාජ් සමුද්‍රා හෝටලයේ ලේකම් තිලක් විජේසිංහ යන සහෝදරවරු සහභාගි වූහ.

## කොතලාවල පනත පරාජය කිරීමට සියලු බලවේග පෙළගස්වනවා

### මහින්ද ජයසිංහ සහෝදරයා



ආණ්ඩුව විසින් ඉදිරිපත් කර තිබෙන කොතලාවල පනත දරුවන්ගේ නිදහස් අධ්‍යාපනයේ අයිතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීමක් මෙන්ම අධ්‍යාපනය මිලිටරිකරණයට ලක්කිරීමක් බව ලංකා ගුරුසේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ප්‍රකාශ කරයි.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත තිබියෙදී ජෝන් කොතලාවල පනත ගෙන ඒම මගින් පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට ඉඩ ලබාදීමත් මෙන්ම අධ්‍යාපන ආයතනයන්හි තනතුරුවලට ආරක්ෂක අංශයේ නිලධාරීන් යෙදවීමත් මේ පනත මගින් සිදු කිරීමට කටයුතු කරන බවත් ඔහු මෙහිදී පැවසීය.

මෙමගින් නිදහස් අධ්‍යාපනයට බරපතළ ප්‍රහාරයක් එල්ලවීමක් මෙන්ම ශිෂ්‍ය නිදහස සම්පූර්ණයෙන් අහුරන වැඩපිළිවෙලක් බවද මහින්ද සහෝදරයා පෙන්වා දෙයි. සයිටම් සටනේදී අධ්‍යාපන පෞද්ගලිකරණයට විරුද්ධව පෙනී සිටි ඇමතිවරු දැන් කොතලාවල පනතට අත ඉස්සීම ඉතාම පිළිකුල් සහගත බවත් පහුගිය ආණ්ඩුව මෙම පනත ගෙනඒමේදී නැගුණු ජනතා විරෝධය හේතුවෙන් හකුළා ගැනීමට සිදු වූ බවත් දැන් වත්මන් ආණ්ඩුව එම පනතම ගෙන ඒමට දැඩි විරෝධය පළ කරන බවත් මෙම පනත පරාජය කිරීමට සියලු බලවේග සමග එක්ව කටයුතු කරන බවත් මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය.

# එතෙරින්...

## "සෞඛ්‍ය සම්පන්න නිවසක ජීවත්වීමේ අයිතිය, මූලික අවශ්‍යතාවයක්" රෝමයේ පෙළපාලියට ජ.වි.පෙ. සහය




ප්‍රයෝජනයක් නොමැති මහපරිමාණ ව්‍යාපෘති නවතා ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳීමට බලකරමින්ද නිවාස කුලිය ගෙවාගන්නට නොහැකි, මිලදී ගත් නිවසේ වාරික ගෙවා ගත නොහැකි සහ අතහැර දැමූ ගොඩනැගිලිවල ජීවත් වන ජනතාව බලහත්කාරයෙන් ඉවත් කිරීමට එරෙහිවද රෝමයේ නිවාස ගැටලු වෙනුවෙන් මැදිහත්වන ප්‍රගතිශීලී සංවිධාන විසින් කැඳවනු ලැබූ පෙළපාලියක් පසුගිය ජූනි 26වැනි දින රෝමයේදී ඉතාලි සහ සංක්‍රමණික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

විශාල පිරිසක් එක්ව සිටි එම අවස්ථාවට ජනතා විමුක්ති පෙරමුණේ ඉතාලි කමිටුවේ නියෝජිතයන්ද එක්වෙමින් තම ජාත්‍යන්තරවාදී සහයෝගිතාවය ප්‍රකාශ කර සිටියේය.

## ඉතාලියේ කම්කරුවෙකු මරා දැමීමට එරෙහි උද්ඝෝෂණවලට ජ.වි.පෙ.ත් එක්වෙයි!




ඉතාලියේ භාණ්ඩ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රබල වෘත්තිය සමිතියක් වන Si Cobas විසින් සංවිධානය කරනු ලැබූ ජාතික වැඩවර්ජනයක් ජූනි 18වැනි දින ඉතාලිය පුරා පැවැත්විණි. එදින වැඩවර්ජනයේ නියැලුණු කම්කරුවන් තෝරාගත් ස්ථානවලදී උද්ඝෝෂණයන් කරනු ලැබූ අතර Novara නගරයේ සුපිරි වෙළඳසැලක් අසළදී උද්ඝෝෂණයේ නියැලුණු කම්කරුවන් දෙසට බර වාහනයක් ධාවනය කළ රියදුරෙකු විසින් Adil Belakhdim නැමති 37 හැවිරිදි දෙදරු පියෙක් වන වෘත්තිය සමිති ක්‍රියාධරයා මරා දමා තවත් දෙදෙනෙකුට බරපතළ තුවාල සිදුකරමින් පලා ගොස් ලැබ තිබේ.

මීට සති කීපයකට ප්‍රථමද වෘත්තිය සමිති ක්‍රියාකාරීන්ට එරෙහිව පුද්ගලික ආරක්ෂක සේවාවන්ගේ මැරයන් යොදවා පහරදෙන්නට බහුජාතික සමාගමක් විසින් කටයුතු කරනු ලැබීය. ඉතාලියේ වැඩකරන ජනතාවගේ අදහස Adil Belakhdim ගේ මරණය තවත් අනතුරකින් සිදුවූ මරණයක් නොව බහුජාතික සමාගම්වල ලාභය වෙනුවෙන් කරනු ලැබූ අමානුෂික ඝාතනයක් බවයි.

මෙම අමානුෂික ඝාතනයට විරෝධය දැක්වීම සඳහා ජූනි 19 දින රෝමයේදී පැවැත්වුණු පෙළපාලියට විශාල පිරිසක් සහභාගිවූ අතර ජනතා විමුක්ති පෙරමුණ ඉතාලි කමිටුවේ නියෝජිතයන්ද එම අවස්ථාවට එක්වෙමින් තම ජාත්‍යන්තරවාදී සහයෝගය ප්‍රකාශ කර සිටියේය.

1 පිටුවෙන්.. ඉතිරි...

## බියවැද්දීමේ කතා...

ක්‍රියාකාරකම් පමණි. කාබනික පොහොර ආනයනය කිරීම, පාම් ඔයිල් ආනයනය අත්හිටුවීම, ටයිල් ආනයනයට ඉඩදීම, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනය වැනි ක්ෂේත්‍ර ගණනාවක් අරභයා ගන්නා ලද තීරණ ආණ්ඩුව ආපස්සට ගත් අතර මැති ඇමතිවරුන් වෙනුවෙන් සුඛෝපභෝගී වාහන ආනයනය කිරීම සඳහා ගන්නා ලද උත්සාහය, ගෑස් මිල වැඩිකිරීම මහජන විරෝධය හේතුවෙන් හකුළා ගැනීමට ආණ්ඩුවට සිදු විය.

මේ අතරතුර ආණ්ඩුව ඉන්ධන මිල විශාල ලෙස ඉහළ දැමූ අතර සහල්, එළවළු, මස් මාළු ඇතුළු අනෙකුත් දෛනික පරිභෝජන භාණ්ඩවල මිල වේගයෙන් ඉහළ යමින් ඇති අතර ජනතාව ජීවන බරින් බලවත් පීඩාවකට ලක්ව සිටියි. මේ තත්වය තුළ වර්ධනය වන ආණ්ඩු විරෝධය ආණ්ඩුව තුළින්මත් සමාජ මාධ්‍ය සහ ජන මාධ්‍ය තුළින් ප්‍රකාශයට පත්වෙමින් ඇත. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ජාතිය ඇමතීම වැනි අවස්ථාවක් පවා සමාජ මාධ්‍ය තුළ මහත් හාස්‍යයට හේතු වූ අතර ඔහු තවදුරටත් ජනතාව බිය කළ හැකි පාලකයෙකුට වඩා විහිළුවට ලක්වන පුද්ගලයෙකු වී හමාරය.

මීට වසර එකහමාරකට පෙර දැවැන්ත ජන බලයක් ලෙස පෙනුණු ආණ්ඩු හිතවාදී මතවාදය මේ වන විට ක්ෂය වී ගොස් ඇති බැවින් ආණ්ඩුවට එයින් ලැබිය හැකි ආරක්ෂාවක් නොවේ. මේ තත්වය තුළ ආණ්ඩුවේ ඇතැම් ඇමතිවරයෙකුගේ කපුටු තටු කතාවලින් ප්‍රකාශ වෙන්නේ අනෙක් සියලු ක්‍රියාමාර්ගයන් පිළිබඳ අපේක්ෂාභංගත්වයේ ප්‍රමාණයයි. ඔවුන්ගෙන් මර්දනය පිළිබඳ යෝජනා ඉදිරිපත් වෙද්දී ආණ්ඩුවේ ප්‍රාදේශීය නායකයන්ගේ වියරුව මහියංගණය රිදීමාලියද්ද වැනි තැනකදී ප්‍රකාශයට පත් වෙමින් තිබේ. මේ අතරතුර හදිසියේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමටත් ආණ්ඩුව උත්සාහ දරමින් සිටියි.

කෙසේ වුවද මේ සියලු ක්‍රියාමාර්ග සහ උත්සාහයන් තුළින් ආණ්ඩුව ජනතාව අතර තව තවත් පිරිහීම නිසැක කරුණක් වන අතර අමතර වශයෙන් යුරෝපා සංගමයේ ජීඑස්පී ප්ලස් තහනම වැනි ආර්ථික සම්බාධකද කැඳවා ගනු ඇත.

මේ සියලු තත්වයන් මැද ආණ්ඩුවේ ප්‍රධානීන්ගේ කලබලය තේරුම් ගත හැකි කරුණක් වන නමුත් දැන් විය යුත්තේ ජනතාව ඔවුන්ගේ වියරු ප්‍රකාශයන්ට බිය වීම නොව මෙම අසමත් පාලනයන් පෙරළා දමා ජනතාවාදී පාලනයක් නිර්මාණය කර ගැනීම බව මේ පිළිබඳව කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා නියමුවා වෙත ප්‍රකාශ කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අපි කුමක් කරමුද?

බලයට පත්වී වසර දෙකක් ගතවීමටත් පෙර ගෝඨාභය රාජ්‍ය පාලනය සෑම අංශයකින්ම සිය අසමත්කම, බැරිකම, නොහැකියාව පෙන්වා තිබේ. මේ ගැන විස්තර අටුවා, ටීකා අවශ්‍ය නැත. රට හැදීමට ඇති අවසන් අවස්ථාව ලෙස පවසා ඒ සඳහා සිටින එකම සුදුස්සා ගෝඨාභය රාජපක්ෂ බව කී, ඔහුට ඡන්දය දුන් අයම දැන් ඔහු හාස්‍යයට ලක් කිරීම අරඹා ඇත. ගෝඨාභය රාජපක්ෂ නමින් ඇති ඔහුගේම මුහුණු පොතට පැමිණ හාස්‍ය මුහුණු සහිත රූප දමා යාමට දස දහස් ගණන් කටයුතු කිරීමෙන්ම මේ බව පැහැදිලි වේ.

ජන සමාජය තුළ විවිධ හාස්‍ය දනවන කථා, සහිත විශාල විරෝධයක් එල්ලවූ පාලකයා වූයේ ජේ ආර් ජයවර්ධනය. ඒ, ඔහු ඒකාධිපතියෙක් ලෙස සිටිමින් ඉන්දියාවට රට පාවාදීම නිසාය. ඔහු ගැන කථා, කවි, කාටූන් රැසක් නිර්මාණය වුවද ඔහු විහිළුකාරයෙක් බවට සමාජය තුළ පත්වූයේ නැත. එහෙත් දැන් ගෝඨාභය රාජපක්ෂ ජන සමාජය තුළ විහිළුකාරයෙක් බවට පත්කරනු ලැබ තිබේ. ඔහු කියන වචනයක් වචනයක් පාසා ඔහු හාස්‍යයට ලක්වීම සමාජය තුළ සුලබව සිදුවේ. ඔහු දැඩි හමුදා පන්නයේ පාලකයෙකු වේ යයි සිතූ ජනතාව දැන් ඔහු දුර්වලයෙක් ලෙස ගෙන හාස්‍යයට ලක්කරති. ඉන් ඔහුගේ පාලනයේ පිරිහීමේ තරම පෙන්වා තිබේ.

රාජපක්ෂවරුන් බලය ගත්තේ අධිරාජ්‍ය විරෝධී, දේශප්‍රේමී, ජාතිකවාදී, දේශීයත්වයට මුල්තැන දෙන, විනයගරුක, දැඩි පාලනයක් පිළිබඳ ආදී බලාපොරොත්තු ඇති කරමිනි. එහෙත් දැන් ඒ සියල්ල දියවී ගොසිනි.

සැබැවින්ම දැන් ඔවුන්ගේ පාලනය ආර්ථික වශයෙන් නව ලිබරල් හා දේශපාලන වශයෙන් වැඩවසම් ලක්ෂණ හා කොල්ල කල්ලියක ලක්ෂණ සහිත පාලනයකි. එය පරිණත ධනවාදී පාලනයක් හෝ නොවේ. දැන් අර්බුදයට ගොස් අසමත්ව ඇත්තේ එම පාලන ක්‍රමයයි. ජාතිවාදය ආගම්වාදය, මිත්‍යාව ගොඩනැගූ රාජපක්ෂ පාලනය ඒවාද අසාර්ථක කරමින් අර්බුදයට ලක්ව ප්‍රතික්ෂේප වෙමින් තිබේ.

මේ තත්වය කොතරම්ද යත් දැන් පොදු සමාජය තුළින්ම පැනයක් මතුවෙමින් තිබේ. ඒ 'මීළඟට කරන්නේ කුමක්ද' යන පැනයයි. 'අපි කුමක් කරමුද' යනුවෙන් ආණ්ඩුව හැදූ ජනතාවම කල්පනා කරමින් සිටී. ඉන් එහාට ගිය සමහරු විවිධ යෝජනාද ඉදිරිපත් කරති. රාජපක්ෂවරුන්, රාජපක්ෂ පවුල තුළින්ම නායකයින් ඉදිරිපත් කිරීමට උත්සාහ කරද්දී ජනතාව විකල්ප පිළිබඳව කල්පනා කිරීමට පටන්ගෙන තිබේ.

ආණ්ඩුවේ විවිධ බලවේගවල තීරණවලට එරෙහිව ජනතා විරෝධය ඈත ගොවිබිම්වල සිට නාගරික මැද පංතිය දක්වාම මතුවෙමින් තිබේ. එහෙත් තවමත් මේ අර්බුදයට විසඳුම කුමක්ද යන්න පිළිබඳ එකඟතාවකට බහුතරයක් පැමිණ නැත. 'කළ යුත්තේ කුමක්ද' යන ප්‍රශ්නයට විවිධ යෝජනා එන්නේ ඒ නිසාය.

දැන් වටවංගු ගැසීමේ, සත්‍ය මගහැර යාමේ, තේරුමක් නැත. රාජපක්ෂවරුගේ පාලන මොඩලය අසාර්ථකව තිබේ. මෙය පවුල්වාදය සහිත වැඩවසම් ලක්ෂණද සහිත නව ලිබරල් ප්‍රතිපත්ති ක්‍රියාවට නගන පාලනයකි. දැන් එය අසාර්ථකය.

එසේම ඊට පෙර ගොඩනැගීමට පොරොන්දු වූ, ආර්ථිකයෙන් නව ලිබරල් හා දේශපාලනයෙන් ලිබරල් පන්නයේ පාලන රටාවද අසාර්ථක විය. ඒ, මෛත්‍රීපාල - රනිල් පාලන කාලය තුළය. ගෝඨාභය රාජපක්ෂලාට මේ තරම් බලයක් ලැබුණේ මෛත්‍රී - රනිල් පාලනයේ අසමත්කම හේතුවෙනි. කුමන නමින් කුමන රටාවෙන් කවුරු මගින් පැමිණියද නව ලිබරල් ආර්ථික උපාය සහිත මේ ධනවාදී ක්‍රමය දැන් අසමත්ය. එයට රටේ ප්‍රශ්න විසඳිය නොහැක. ආර්ථිකයේ සංවර්ධනයක් ඇති කළ නොහැක. දේශපාලන ක්‍රමයේ අර්බුදයන් මෙම ආර්ථික ක්‍රමයේ අර්බුදයේම ප්‍රතිඵලයන්ය. ආර්ථිකය කොල්ලකාරී වනවිට දේශපාලනයද කොල්ලකාරී හා පාදඩ වේ. මේ ආර්ථික ක්‍රමය පවත්වාගෙන යමින් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී යහපාලනයක් හැදීමට නොහැක. ඒවා සුරංගනා කථාය. එබැවින් දැන් මේ සමස්ත පද්ධතියම වෙනස් කළ යුතුය.

දැනට පවතින ලාබය මත පමණක් පදනම් වූ ආර්ථිකය තුළ පොදු සමාජ වගකීමක් නැත. කොල්ලකාරී බහුජාතික සමාගම් කිහිපයක් හා ජාවාරම්කරුවන් කිහිපදෙනෙක් මෙහෙයවන ඒ වෙනුවෙන් දේශපාලකයන්ට කොමිස් දෙන මෙම ආර්ථිකය වෙනස් කළ යුතුමය. එවිට ඒ මත බිහිව තිබෙන වංචා දූෂණ පිරි කොල්ලකාරී දේශපාලන සංස්කෘතියද වෙනස් කළ හැකි වෙනු ඇත. සමාජ සාධාරණත්වය තිබිය යුත්තේ දේශපාලන කටයුතුවල පමණක් නොවේ. ආර්ථිකයේද සාධාරණත්වය තිබිය යුතුය. ආර්ථිකයේ සාධාරණත්වය තහවුරු වන විට එය සමාජ සාධාරණත්වය බවට පත්වේ.

ආර්ථිකය සංවර්ධනය කොට එහි ප්‍රතිලාභ සැමට සාධාරණව ලැබෙන ක්‍රමයක් නිර්මාණය විය යුතුය. එය නිර්මාණය කළ හැකි වන්නේ සමාජවාදයේ මූලධර්ම මත ආර්ථික විද්‍යාත්මකවය. ආර්ථිකයට රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයද දායක විය යුතු අතර එය සැලසුමක් සහිතව මෙහෙයවීම රජයේ වගකීමක් විය යුතුය. අනෙක් සියලු සමාජ සේවා නිර්මාණය විය යුත්තේ ඒ මත එයට ගැලපෙන ලෙසය. රට වෙනස් කළ හැකි වන්නේ එසේය. එය කළ හැකි, කළ යුතු වෙනසකි.

වර්තමාන අර්බුදය ඉල්ලා සිටින, ලංකාවේ ධනවාදයේ ඉතිහාසය විසින් උගන්වන ලද පාඩම් විසින් ඉල්ලා සිටින එම වෙනස මෙතෙක් රට පාලනය කළ ප්‍රභූ කණ්ඩායම්වලට හෝ ලිබරල් ලෙස පෙනී සිටි ධනපති පක්ෂවලට කළ නොහැක. එය කළ හැකි වන්නේ වමේ ප්‍රගතිශීලී හා දේශප්‍රේමී ජනතා බලවේගයකටය; මහජන ව්‍යාපාරයකටය. එවැනි මහජන ව්‍යාපාරයකට නායකත්වය දීමේ හැකියාව හා සුදුසුකම පවතින්නේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු වමේ ප්‍රගතිශීලී කණ්ඩායම්වලටය. එකී බලවේගය වහ වහා සවිමත් කිරීම ජයග්‍රහණය කරවීමට වර්තමාන අර්බුදයෙන් කම්පාවට පත්ව සිටින සියලුදෙනාම සූදානම් නම් රට නියත ලෙසම දිනනු ඇත.

# ආණ්ඩුව තුළම අපේක්ෂාභංගත්වයක්!

ලාංකේය දේශපාලනය තුළ මෙතෙක් ආණ්ඩු පිහිටුවීමෙන් පසු අපේක්ෂාභංගත්වයට පත්වූයේ එකී ආණ්ඩුවට ඡන්දය දුන් ජනතාවය. එහෙත් මේ වන විට වත්මන් ආණ්ඩුව තුළ සිටින ආණ්ඩු බලය දරන අය තුළම අපේක්ෂාභංගත්වයක් හටගෙන තිබේ. ආණ්ඩුවේ මෑතම හැසිරීම් දෙස බලන විට එය පැහැදිලිව පෙනේ. එක් අතකින් මෙම ආණ්ඩුව පිහිටුවා ගැනීම සඳහා ගෝඨාභය රාජපක්ෂ පිළිබඳව ප්‍රශස්ති ගයා ජනතාව රැවටූ ආණ්ඩුවට සම්බන්ධ කණ්ඩායම් අතරම ප්‍රතිවිරෝධතා හා ගැටුම් මතුව එකිනෙකා විවේචනය කර ගැනීමට පටන්ගෙන තිබේ. අනෙක් අතින් ගෝඨාභය රාජපක්ෂ හැම අතින්ම අසමත් බව ඔහුටත් දැනී අන් අයටත් දැනෙන්නට පටන්ගෙන තිබේ. ඒ සඳහා විකල්ප යෝජනාද ආණ්ඩුව තුළම මතුවී තිබේ.

ආණ්ඩුව ජන ප්‍රසාදය ලබා ගනිමින් ජයග්‍රාහීව සාර්ථකව කටයුතු කරන්නේ නම් හෝ එය කිසියම් සැලැස්මකට සංවිධානාත්මකව මෙහෙය වන්නේ නම් එවිට අභ්‍යන්තර අර්බුද, කලකිරීම්, ප්‍රතිවිරෝධතා ඇතිවීමේ ප්‍රවණතාවය ඉතාම අඩුය. එහෙත් ආණ්ඩුවක් පිරිහෙන විට, ඉලක්කයක්, සැලැස්මක් නැතිව අඳුරේ අතපත ගාන විට ජනතා අප්‍රසාදය එල්ලවන විට තම තමන්ගේ ඇඟ බේරා ගැනීමේ, අන් අය මත වැරදි පැටවීමේ තත්වයක් මතුවේ. වර්තමාන ආණ්ඩුවට වසර දෙක පිරෙන්නටත් පෙර ඇතිවී තිබෙන්නේ එවැනි තත්වයකි. ආණ්ඩුවත් ගෝඨාභයත් අසමත්බව අනියමින් ඔවුන්ටම පිළිගැනීමට සිදුව තිබේ.

පසුගියදා ඉන්ධන මිල ඉහළ දැමීමේ ප්‍රශ්නයේදී එහි වගකීම ආණ්ඩුව මත පැටවෙන එක වළක්වා ජනතාව නොමඟ යැවීම සඳහා එම වගකීම ඇමති උදය ගම්මන්පිල මත පටවා ඔහුට ඉල්ලා අස්වන ලෙස ලිපියක් ලිවීමට පොදු පෙරමුණේ ලේකම් සාගර කාරියවසම්ට සිදුවීමෙන් පෙන්නුම් කළේ ඉහත කී අර්බුදයයි. ආණ්ඩුව ඇතුළේ සමහරුන් සිනහ වෙමින් අතට අත දෙන්නේ 'පිහිය සඟවාගෙන' බව පෙනේ.

ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා ලෙස කොතරම් අසමත්ද ඔහු කොතරම් අපේක්ෂාභංගත්වයකට පත්ව සිටීද යන කරුණ අපට තේරුම්ගත හැකි සිදුවීමක්ද පසුගියදා සිදු විය. ඒ, ගොඨාභය රාජපක්ෂ හදිසියේ 'ජාතිය ඇමතීමය' රාජ්‍ය නායකයෙක් සාමාන්‍යයෙන් ජාතිය අමතන්නේ ජාතියටම බලපාන ඉතාම විශේෂ අවස්ථාවකය. ඒ නිශ්චිත කරුණක් වෙනුවෙනි. එහෙත් ගෝඨාභය විනාඩි 69ක් පුරා කළ 'ජාතිය ඇමතීම' ජාතිය ඇමතීමකට වඩා තමන් තුළ පීඩා ගෙනදෙන හැඟීම් එළියට මුදාහළ අඳෝනාවක් විය. රාජ්‍ය නායකයෙක් සාර්ථක නම් එය ප්‍රකාශයට පත්විය යුත්තේ ජනතාව තුළිනි; තමන් සමග එක්ව වැඩ කරන අය තුළිනි. එසේ නැතිව තමන් අසාර්ථක නැති බව පෙන්වීමට 'උත්තර බැඳීමට' යමෙකුට සිදු වන්නේ නම් ඉන් තහවුරු වන්නේ ඔහු අසාර්ථක බවත් ඒ බව ඔහුගේම හෘදයසාක්ෂිය පවා දන්නා බවත්ය.

ගෝඨාභයගේ අසමත්කම ආණ්ඩුව තුළින්ම ප්‍රකාශ වූ මෑත සිදුවීම වන්නේ ආණ්ඩු පක්ෂයේම පිරිසක් බැසිල් රාජපක්ෂ පාර්ලිමේන්තුවට ගෙන්වාගෙන ආර්ථිකය බාරදීමට කරන ප්‍රකාශයන්ය. පියල් නිශාන්ත, ප්‍රසන්න රණතුංග, ලංසා ඇතුළු බැසිල්ට සමීප කණ්ඩායමක් පසුගිය දිනවල මාධ්‍යවලට ප්‍රකාශ කර තිබුණේ රටේ ආර්ථිකය ගොඩ ගැනීමට නම් ඊට සමත් එකම පුද්ගලයා බැසිල් රාජපක්ෂ බවය. බැසිල් ආර්ථිකය බාරගත් විට රට කිරියෙන් පැණියෙන් ඉතිරෙන බවට අදහස් ඔවුහු පළකරමින් සිටිති. මේ ප්‍රකාශ හා බැසිල් පාර්ලිමේන්තුවට ඒමට සූදානම්වීම (මේ ලිපිය ලියද්දී ඔහු පාර්ලිමේන්තුවට පැමිණ නැත) දෙස බලන විට මේ තුළ හාස්‍යයක් මෙන්ම ඛේදවාචකයක්ද ගැබ්ව ඇති බව පෙනේ.

දැනට ආණ්ඩුව තුළ සිටින අයත්, මේ ආණ්ඩුව ගොඩනැගීමට දායකවූ අයත් මැතිවරණ කාලය පුරාම පරසක්වළ ගසමින් ප්‍රකාශ කළේ මේ රටට ලැබෙන අවසන් අවස්ථාව මෙය බවත් රට ගොඩගත හැකි එකම පුද්ගලයා ගෝඨාභය රාජපක්ෂ බවත්ය. ඔහුගේ දැනුම, විදේශ අත්දැකීම්, විනය, වියත්මගේ සහයෝගය ආදිය ගැන වර්ණනා කළ ඔවුහු රටේ එකම ගැලවුම්කරුවා ගෝඨාභය බව එදා පැවසූහ. එහෙත් දැන් ආර්ථිකය ගොඩ ගැනීමට හැකි එකම පුද්ගලයා බැසිල් රාජපක්ෂ බව ඒ අයම පවසන විට ඉන් කියවෙන්නේ ගෝඨාභය රාජපක්ෂ ඊට අසමත්ව ඇති බව නොවේද? වියත්මග බංකොලොත් බව නොවේද?


එසේම මේ වන විට මුදල් අමාත්‍යාංශය බාරව සිටින්නේ මහින්ද රාජපක්ෂය. 'සල්ලි හොයන හැටි අපි පෙන්වන්නම්' යනුවෙන් වරක් මාධ්‍යවේදීන්ට පැවසුවේද මහින්ද රාජපක්ෂය. අගමැතිද ඔහුය. දැන් ආර්ථිකය ගොඩදැමීමට 'හපනා' බැසිල් බව කියන විට ඉන් කියවෙන්නේ මහින්ද මුදල් ඇමති ලෙස අසමත් බවය. ආණ්ඩුවම අපේක්ෂාභංගත්වයට පත්ව ඇතැයි අප පවසන්නේ මේ තත්වය තුළය.

බැසිල් රාජපක්ෂට හා ඔහුට සමීපතමයන්ට දේශපාලන සැලසුමක් තිබිය හැක. බැසිල්ට ඇමතිකමක් දී බැසිල් පුම්බා ගෝඨාභය අසමත් වීමෙන් හැදෙන රික්තය තවත් රාජපක්ෂ කෙනෙක්ගෙන්ම පිරවීමේ සැලසුමක් තිබෙන්නට පුළුවන. එහෙත් දැනට පවතින ආර්ථික අර්බුදයේ ස්වභාවය අනුව තනි මිනිසුන්ගේ ප්‍රාතිහාර්යවලට මෙහි කිසිවක් කළ නොහැක. සිදුවිය හැක්කේ බැසිල්ද තම බැරිකම පෙන්වීම පමනි. ඒ අර්ථයෙන් ගත් විට බැසිල් දැන් ඇමතිකමක් ගැනීම අනාගත බල ව්‍යාපෘතියට බාධාවක් වීමටද ඉඩ තිබේ. එහෙත් ආණ්ඩුව තුළ අර්බුදය මෝරා ඇත්තේ සියල්ලම බේරාගත නොහැකි මට්ටමටය.

අනෙක් අතට මෙහි තවත් පැත්තක්ද තිබේ. ආර්ථිකය හැදීමට හැකි හපනා බැසිල් බව ප්‍රකාශ කරන ආණ්ඩුවේ ඇමතිවරුන් රටට සඟවන දෙයක්ද තිබේ. ඒ ඇමතිකමක් නොතිබුණද මේ වන විට බැසිල් රාජපක්ෂ මේ ආණ්ඩුවේ ආර්ථිකයට සම්බන්ධ තනතුරු රැසක්ම දරන බවය. උදාහරණ ලෙස ආර්ථික පුනර්ජීවනය හා දිළිඳුකම පිටුදැකීමේ ජනාධිපති කාර්යසාධක බලකායේ ප්‍රධානියා බැසිල්ය. ඊළඟට අත්‍යාවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම් ජනාධිපති කාර්යසාධක බලකායේ ප්‍රධානියාද බැසිල්ය. දේශගුණ විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇති කිරීමේ කාර්යසාධක බලකායේ ප්‍රධානියාද ඔහුය. රටේ ගස් ටික කපා විනාශ කර එළිකළේ ඔහු මෙම වගකීම දරද්දීය. ඊටත් අමතරව කොවිඩ් අරමුදලේ භාරකරුද ඔහුය. ඉදින් තවත් අඩුවට ඇත්තේ කුමක්ද? මේ වගකීම් සියල්ල බැසිල් දරද්දීම රටේ ආර්ථිකය බිඳවැටී දිළිඳුකම වැඩි වී, මහජන සේවාවන් අඩපණ වී ජනතාව පීඩාවට පත්ව සිටී. බැසිල් ඇමරිකාවට (තම රටට) නිවාඩු යන්නේ තත්වය මෙසේ තිබියෙදීය. එබැවින් බැසිල්ට ඇමතිකමක් දීමෙන් කිසිවක් වෙනස් නොවනු ඇත. මන්ද ඇමතිකමක් යනු මැජික් පොල්ලක් හෝ ඇලඩින්ගේ පුදුම පහන නොවන නිසාය.

වියත්මඟට සම්බන්ධ හා පවුල්වාදය නැති පිරිසිදු විනය ගරුක පාලනයක් පිළිබඳ සිහින දුටු අයගේ සිහිනද මින් බොඳවී තිබේ. ලෝකයේ මෙතරම් ලොකු පවුලක් රට පාලනය කරන එකදු රටක් නැත. දැන් ඉතිරි වී සිටින බැසිල්වද ගැනීමට යන්නේ එකී පවුල් පාලනයටය. ලංකාවේ දැන්

12 වැනි පිටුවට



ආණ්ඩුව ජන ප්‍රසාදය ලබා ගනිමින් ජයග්‍රාහීව සාර්ථකව කටයුතු කරන්නේ නම් හෝ එය කිසියම් සැලැස්මකට සංවිධානාත්මකව මෙහෙය වන්නේ නම් එවිට අභ්‍යන්තර අර්බුද, කලකිරීම්, ප්‍රතිවිරෝධතා ඇතිවීමේ ප්‍රවණතාවය ඉතාම අඩුය. එහෙත් ආණ්ඩුවක් පිරිහෙන විට, ඉලක්කයක්, සැලැස්මක් නැතිව අඳුරේ අතපත ගාන විට ජනතා අප්‍රසාදය එල්ලවන විට තම තමන්ගේ ඇඟ බේරා ගැනීමේ, අන් අය මත වැරදි පැටවීමේ තත්වයක් මතුවේ. වර්තමාන ආණ්ඩුවට වසර දෙක පිරෙන්නටත් පෙර ඇතිවී තිබෙන්නේ එවැනි තත්වයකි. ආණ්ඩුවත් ගෝඨාභයත් අසමත්බව අනියමින් ඔවුන්ටම පිළිගැනීමට සිදුව තිබේ.







# YES WE CAN

# ජාතිය ඇමතීම...

දිනය 2021.06.25. මුළු බුකියම රාත්‍රී 8.30 වන තුරු නොවිසිල්ලෙනි. ඒ, රටේ ජනාධිපතිවරයා ජාතිය අමතනවා බැලීමටය. ගමේ භාෂාවෙන් ජාතිය අමතනවා යනු පරුෂ වචනයෙන් බැනීමය. ගම්වල නම් නිතර ජාතිය අමතන පොරවල් ඇත. අඩියක් දාපුවහම ජාතිය අමතන මෙන්ම අමුවටම ජාතිය අමතන පොරවල්ද ඇත. ඔවුන් ජාතිය ඇමතීම ගමට වදයක් වුවද ගමේ බොහෝදෙනෙකුට එය විනෝදජනකය. හාස්‍ය උපදවන්නක්ය. අප රටේ ජනාධිපතිවරයාගේ ජාතිය ඇමතීම නැරැඹීමට රටේ ජනයා බලාසිටියේද ගමේ ජාතිය ඇමතීම නැරඹීමට සූදානම් වන ආකාරයටය. ඒ තරම් ජනාධිපතිවරයාගේ ක්‍රියාකලාපය හාස්‍යජනකය.

ඔහු යුද ජයග්‍රහණයේ නාමයෙන් බලයට පැමිණියේ "යුද්ධයක් කරපු මට රට හැදීම මහ ලොකු කජ්ජක් නොවන බව"ට පුරසාරම් දොඩමිනි. නමුත් මේ වනකම් කරපු කජ්ජක් නැත. පාස්කු ප්‍රහාරයේ මහා මොළකරු සති දෙකෙන් අල්ලනවා යැයි පුරසාරම් දෙඩුවද අල්ලාගත් මොළකරුවෙක් නොමැත. "මහබැංකු හොරු අල්ලනවා" යැයි දෙඩූවද මහ බැංකු වංචාවේ මහා මොළකරු මෑතකදී පාර්ලිමේන්තුවට ආවේ මන්ත්‍රීවරයෙකු ලෙසය.

සහල් මාෆියාව ඇල්ලීමට මේජර් කෙනෙක් පත් කළේය. සහල් පාලන මිලක්ද දැම්මේය. ඒ වෙනුවෙන් ගැසට් පහක් ගැහුවේය. සහල් මාෆියාව කෙසේ වෙතත් අද රටින් සහල් ආනයනය කිරීමට තීරණය කර හමාරය. වරායට හමුදා ප්‍රධානියෙක් පත්කළේද ඒ අයුරින්මය. නමුත් ගිනිගත් නැවක් වරායටම ඇවිත් ගිනිබත් වී අපේ මුහුදු සම්පතද විනාශ කරනා තෙක් හිටපු හමුදා ප්‍රධානියා නොදැන සිටියේය.

ලෝක වෙළඳපොළේ තෙල් මිල සෘණ වූ අවස්ථාවේ මේ ජනාධිපති ජාතිය අමතා සැමන් හා පරිප්පු අඩු කලේ ලෝක වෙළෙඳපොළේ තෙල් මිල වැඩි වූ විට ජනතාවට සහන දෙන පොරොන්දුව මතය. නමුත් සිදුවූයේ ජනතාවට කබලෙන් ලිපට වැටීමටය. පසුගියදා තෙල් මිලද වැඩිකළේය. සැමන් හා පරිප්පුද අඩු මිලට වෙළෙඳපොළේ  නැත.

මැතිවරණ වේදිකාවේ කෑමොර දුන්නේ පොහොර සම්පූර්ණයෙන් නොමිලේ ලබාදෙන බවට සහතික වෙමිනි. නමුත් හදිසියේම ඩොලර් හිඟය නිසා සිදුකලේ රසායනික පොහොර ආනයනය තහනම් කිරීමය. දැන් ගොවියාට නොමිලේ තියා මිලට ගැනීමටවත් පොහොර නැත.

කොරෝනා රෝගීන් 28ක් හමු වූ විට  සිනාසෙමින් කීවේ, ඕක මොකක්ද? යුද්ධය තියන කාලේ එක දවසෙ පනහ හැට මැරුණත් රට නොවැසූ බවත් මෙය ගණන් නොගත යුතු බවත්ය. දැන් රටේ මිනිසුන් 3000 ඉක්මවා මිය ගොසින්ය.

රටේ මත්ද්‍රව්‍ය තුරන්කොට පාතාලය මර්දනය කරන බවටද පම්පෝරි ගැසූ මුත් සිදු කළේ පොසොන් පොහෝ දින මිනීමැරීමට මරණ දඬුවම විඳිමින් සිටි දුමින්ද සිල්වාට ජනාධිපති සමාවදීමය.

මෙසේ ජනාධිපතිවරයා තමන් විසින්ම රට හමුවේ හාස්‍යට ලක් වූ වටපිටාවක් තුළ ජාතිය ඇමතීම රටේ ජනතාවට පෙනෙන්නේ ගමේ පොරවල් අමුවටම ජාතිය අමතන සේය. මේ නිසා ජනාධිපතිවරයාගේ ජාතිය ඇමතීම ඉතාම හාස්‍යයට ලක්විය.

ඉතිහාසයේ කිසිම ජනාධිපතිවරයෙක් මෙසේ හාස්‍යයට ලක් වී නොමැත. මෙතරම් දැඩි හා රළු බවට කලක් විශ්වාස කළ නායකයෙක් මෙසේ හාස්‍යයට ලක්වූයේ ඉතිහාසයේ අන් කවරදාටත් වඩා අපේ රටේ ආර්ථිකය ඉතාම අහිතකර නිසාය. රටේ පාලකයින් ඉතිහාසයට සාපේක්ෂව ඉතා දූෂිත වීම නිසාය. ධනේශ්වර ආර්ථිකයක් පවතින රටවල පාලකයින් ජනතාව ඉදිරියේ කෙතරම් දැඩි මූණක් පෙන්වූවත් මහා පරිමාණ සමාගම් හා කූට ව්‍යාපාරිකයින් ඉදිරියේ දණ නැංවීමට ඔවුනට සිදුවේ. ඔවුන්ගේ වුවමනාවන් සැපිරීමට සිදුවේ. ස්වාධීන ඉතා ශක්තිමත් ආර්ථිකයක් හිමි පාලකයින්ද ධනය ඉදිරියේ දණ නැමුවද ජනතාව ඉදිරියේ මෙතරම් හාස්‍යයට ලක්වන්නේ නැත.

එසේනම් සිදුවිය යුත්තේ පුද්ගලයින් මාරු කරනවා වෙනුවට අසාර්ථක ධනේශ්වර ආර්ථික ක්‍රමයෙන්  ඉවත් වන මං සෙවීමය. ඒ වෙනුවෙන් පුළුල් දැක්මක් සහිත ජනතාවාදී ආර්ථිකයක් සඳහා සාමූහික වැඩපිළිවෙළක් දිනවීම, ඒ වෙනුවෙන් කටයුතු කිරීම මේ මොහොතේ අප හමුවේ ඇති ප්‍රධාන කාර්යයයි.

# අභිමානයේ මාසය හෙවත් Pride Month





සෑම වසරකම ජූනි මාසය යනු ලොව පුරා LGBTIQ ප්‍රජාවන් එනම් සමරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන් විසින් ස්වකීය අභිමානය සමරන මාසයයි. එය Pride Month වන්නේ එබැවිනි. මෙය 1969දී ඇමරිකාවේ නිව්යෝර්ක්හි ස්ටෝන්වෝල් කැරැල්ලෙන් ඇරඹුණු සමරිසි අයිතිවාසිකම් පිළිබඳ අරගලයේ දිගුවකි. අද වන විට මුළුමහත් ලෝකය පුරාම වෙසෙන සමරිසි ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ නිදහස වෙනුවෙනුත් ධනවාදයට එරෙහිවත් හඬ නගන සංකේතීය මාසයක් බවට ජූනි මාසය පත්ව තිබේ.

ධනවාදය විසින් එහි ආරම්භයේදීම සපථ කළේ එම ක්‍රමය තුළදීම පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කරන බවය. මිනිසාගේ ස්වාමියා මිනිසාමය යන පදනම එහි මූලධර්මය විය. සෑම පුරවැසියෙකුම සමානය, සෑම පුරවැසියෙකුටම අයිතිවාසිකම් හිමිය, නීතිය ඉදිරියේ සැවොම සමානය යන උදාන පාඨ ධනවාදය තුළ දක්නට ලැබිණි. නමුත් ධනවාදයේ මුල් කාලය තුළදී බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ආදී ධනවාදී රටවල පවා කාන්තාවන්ට, සමරිසි ප්‍රජාවන්ට, වහලුන්ට හා දුප්පතුන්ට පුරවැසි අයිතිවාසිකම් හිමි වූයේ නැත. ඉන් පසුව අවුරුදු 150-200ට අධික කාලයක් පුරා ධනපතියන්ට එරෙහිව කරන ලද අරගලයේ ප්‍රතිඵලයක් ලෙස පළමු වතාවට සියලු පිරිමින්ට අයිතිවාසිකම් හිමි විය. පසුව කාන්තාවන්, කළු ජාතිකයන් හා දුප්පතුන් ඇතුළු පීඩිත කණ්ඩායම්වලට යම්තාක් දුරකට පුරවැසි අයිතිවාසිකම් දිනාගැනීමට හැකි විය.

එහෙත් මේ වන තෙක්ම සිය අයිතිවාසිකම් අහිමි වූ ප්‍රජාවක් ලෙස සමරිසි ප්‍රජාවන්ට සිය අයිතිවාසිකම් අතරින් හිමිව ඇත්තේ ඉතාමත් අල්පමාත්‍රයකි. අප වැනි දුප්පත් රටවල පමණක් නොව දියුණු ධනපති රාජ්‍යයන් වන බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල පවා මෙම සමරිසි ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය ඇත්තේ ඉතා ඛේදනීය තත්වයකයි. එසේම මීළඟ ප්‍රශ්නය වන්නේ මෙම සමාජ ක්‍රමය තුළින් මෙම ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් දිනාගත හැකිද යන්නයි. එනමුත් යම්තාක් දුරකට හෝ මෙම ක්‍රමය තුළදී පවා එම අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් යම් අරගලයක් කළ යුතුව ඇත.

නමුත් ලෝකය පුරා ධනවාදී රටවල පවතින ආර්ථික අර්බුදය හමුවේ ගෙන යනු ලබන ක්‍රියාමාර්ගය වනුයේ දැනට ඉතිරිව තිබෙන අයිතිවාසිකම් පවා අහෝසි කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීමය. එබැවින් ඒ සඳහා ධනේශ්වර රාජ්‍යයන් විසින් සිය දේශපාලන අරමුණු පෙරදැරිව ජාතිවාදය, ආගම්වාදය හා විදෙස් විරෝධය වැනි මතවාදයන් ගොඩනගමින් හා ඒවා පෝෂණය කරමින් ජනතාව බෙදාහරින්න කරමින් සිටියි. එසේම එම ජාතිවාදී, ආගම්වාදී කොටස්වල වෛරය හා පීඩනය සමරිසි ප්‍රජාවන්ට එරෙහිව එල්ල කරමින් මානව විරෝධී මෙහෙයුමක්ද දියත් කරමින් සිටියි. එබැවින් මෙම සමාජ ක්‍රමය මගින් ලැබිය යුතුමුත්, තවමත් නොලැබී ඇති සමරිසි ප්‍රජාවන්ගේ පුරවැසි අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවෙන් වන අරගලයද පීඩිතයන්ට එරෙහි පොදු අරගලයක් ලෙස එකට එක්ව මෙහෙයවීමේ අවශ්‍යතාවය දැඩිව දැනෙමින් තිබේ.

එහෙයින් සමරිසි හා සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන් විසින් ක්‍රියාත්මක කළ ස්ටෝන්වෝල් කැරැල්ල යනු ධනවාදයට සහ ඊට ආධාර සපයන පාලන ක්‍රමයන්ටද එරෙහිව එල්ල කළ කැරැල්ලක් බව පෙනීයයි. මන්දයත් සමරිසි අයිතිවාසිකම් අත්පත් කර ගැනීමේ අරගලය යනු, ධනවාදයට එරෙහි පංති අරගලයේම කොටසක් මිස වියුක්ත හුදෙකලා සටනක් නොවන බවත් එකී අරමුණ පූර්ණ ලෙස දිනාගැනීම වෙනුවෙන් මුළු මහත් සමාජ ක්‍රමයේම සමස්ත වෙනසක් අවශ්‍ය බවත් ඉතා පැහැදිලිය.



# දුකින් මිදෙන හෙටක්...

උහුලනු බැරි දුක් කඳ
දරමින්, පා ගෙවී පාරට
දාහයද දවා හළුවන
දියෙන්,
රශ්මියෙන්,
අනෝරක් නැතිව,
තෙමෙන, වේලෙන..
බිම්කඩක් අස්වද්දා
පොහොණ් කොට දන කුස්
නිවා ලොවක ගිනි
අහරින්,
දනන් දිවි රැක..
හෙටක් දෙස බලමින්
දෑස් ළඟ දළුලන
මගක් ඇත්දැයි සොයන...
දරාගත්තද කුසගිනි
අන් කුස් පුරවනට තදින්..
අවසන් ගමන් යන දින
දුරක නොව මේ යන මඟ...
සටනක් වෙතොත් හෙට
අත මිදෙනු වස් හැම
මේ දුකින් එතෙරව
හැම රිසි නව ලොවක සිරි
දකිනු හැකි නිසැක
හැම නෙත් ඉදිරිපිට...


## UPDATE

### ඊජිප්තුවේ මමියක් CT ස්කෑන් පරීක්ෂණයකට ලක්කෙරේ



ඊජිප්තුවේ විසූ Ankhekhonsu නම් පූජකයෙකුගේ බවට සැක කෙරෙන මමියක් සීටී ස්කෑන් පරීක්ෂණයක් කර බැලීමට ඉතාලියේ මිලානෝ නුවර පොලික්ලිනිකෝ රෝහල පසුගියදා කටයුතු යොදා ඇත. මීට වසර 3000 කට පමණ පැරණි මෙම මමිය ඊජිප්තු සොහොන් ගැබක තැන්පත් කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. මෙවැනි මමී තුළ ඇති රහස් සොයා බැලීමේ අරමුණින් මෙලෙස මෙය සීටී ස්කෑනරයක් තුළට යවා ඇත. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන පර්යේෂක ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ සබීනා මල්ගෝරා පවසන්නේ මමී යනු ජෛව විද්‍යාත්මක කෞතුකාගාර බවත් ඔවුන් කාල කැප්සූලයක් වැනිය යනුවෙනි.

### කෝවිඩ් 19 නිසා බිහි වූ Grace රොබෝව



රෝගියෙකු වෙත සමීප වෙමින් රෝගියාගේ අවශ්‍ය සත්කාර සේවා ලබා දීමට නවතම මානවරූපී රොබෝවක් නිපදවන්නට හොංකොංහි හැන්සන් රොබෝටික්ස් සමාගම සමත් වී ඇත. හෙදියකගේ නිල ඇඳුමට සමාන නිල්පැහැති ඇඳුම් ඇඳී ඨරණ රොබෝව පසුව් සවි කර ඇති උෂ්ණත්වය මනින කැමරා උපකරණ මගින් රෝගියාගේ ශරීර උෂ්ණත්වය මෙනම රෝගියා වෙත ලබා දිය යුතු ප්‍රතිකාර පිළිබඳ නියමාකාරයෙන් වටහා ගැනීමක් ලබා දෙයි. මීට අමතරව රොබෝව සතුව ඇති කෘත්‍රිම බුද්ධිය මගින් ඉංග්‍රීසි, මැන්ඩරින්, කැන්ටොනීස් යන භාෂාවලින් රෝගියා සමඟ අදහස් හුවමාරු කර ගැනීමට ද හැකිය.

### නියඟයට පිළියමක් ලෙස රතු මුහුදේ ජලයේ ලුණු රසය ඉවතට



ජෝර්දානය රතු මුහුදු ආශ්‍රිතව මුහුදු ජලය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් ඉදි කිරීමට සැලසුම් කර ඇතැයි වාර්තා වේ. මෙම ව්‍යාපෘතිය 2025 වසරේ ඇරඹීමට නියමිත අතර එමගින් වසරකට මුහුදු ජලය කියුබික් මීටර් 250ත් 300ත් අතර ප්‍රමාණයක් පිරිසිදු කිරීමට අපේක්ෂිතය. ඇස්තමේන්තු කර ඇති ආකාරයට මේ සඳහා වැයවන මුදල එක්සත් ජනපද ඩොලර් බිලියනයක් පමණ වේ. ඊට ජල හා වාරිමාර්ග අමාත්‍යංශය මගින් මෙය ක්‍රියාවට නගයි. මෙමගින් ඉදිරි සියවස් දෙක සඳහාම ජෝර්දාන ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සැපිරිය හැකි බව බලධාරීන්ගේ අදහස වී ඇත.

### උතුරු කොරියාව කෝවිඩ් දුරලයි



ජූනි මස 10 වනදා සිට උතුරු කොරියාවේ කිසිදු කෝවිඩ් 19 රෝගියෙකු හමු වූයේ නැති බව එරට බලධාරීන් විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත පවසා ඇත. මෙම කාල සීමාව තුළ 30,000කට අධික පිරිසක් පරීක්ෂා කරන ලද බවත් කිසිදු ආසාධිතයෙකු හමු නොවූ බවත් බලධාරීන් විසින් වැඩිදුරටත් පවසා ඇත. සිය රටෙහි වසංගත පාලන උත්සාහයන් පිළිබඳ අදහස් දක්වන උතුරු කොරියාව පවසන්නේ තමන් විසින් සංචාරකයින් පැමිණීම තහනම් කිරීම, දේශසීමා හරහා සිදුකරන යාම් ඊම් සහ වෙළදාම් අත්හිටුවීම් මෙම ප්‍රතිඵලයට හේතු වූ බවයි.

කොවිඩ් වසංගත තත්වය තුළ ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ පැවැත්විය නොහැකි වීමට නිර්මාණශීලී මැදිහත්වීමක් සිදුකරමින් ජනතා විමුක්ති පෙරමුණ විසින් 'විසඳුම මොකක්ද?' යන මැයෙන් පසුගිය 06වැනිදා **Online** සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු කළේය. එහිදී ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා විසින් පවත්වන ලද දේශනයේ සංක්ෂිප්ත සටහනකි මේ.




ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

# තෝරාගන්නේ **විස දුමද, විසඳුමද** යන්න තීරණය කළ යුත්තේ ජනතාවයි

රටේ සිදුවන සිදුවීම්වලින් අපේක්ෂාභංගත්වයට පත්වූ ජනතාව අසරණභාවයෙන් විවිධ ප්‍රකාශ කරනවා. අපි මොනවද කරන්නේ, මොන මාර්ගයේද යන්නේ, කවර අනාගතයක් උරුම වේවිද වැනි සැකයන්, අවිශ්වාසයන් වර්ධනය වී තිබෙනවා. එක්කෝ පළා යාම, එක්කෝ අත්හැරීම, එහෙමත් නැත්නම් නිද්‍රාශීලීත්වයට පත්වීම බොහෝ දෙනෙක් තෝරාගෙන තිබෙනවා. හැබැයි ඒ මාවතෙන් අපට කිසිවක් ලැබෙන්නේ නැහැ. එම අරාජික අදහස් අපේ රටත් ජන සමාජයත් කිසිසේත්ම ඉදිරියට ගෙන යන්නේ නැහැ. ඒ නිසා 70 වසරකට අධික කාලයක් අපේ රටේ අනුගමනය කරමින් තිබෙන සමාජ ආර්ථික ප්‍රතිපත්තිය රටට විය හැකි සියලුම පන්නයේ විනාශයන් ඇතිකොට හමාරයි. ඒ නිසා අපිට විකල්ප දේශපාලන වැඩපිළිවෙළකට, විකල්ප ආර්ථික වැඩපිළිවෙළකට අවතීර්ණවීම සඳහා අවස්ථාව නිර්මාණය වී තිබෙනවා. අප සියලු දෙනා මේ අවස්ථාව, අභියෝගය, නිසිපරිදි තේරුම් අරගෙන මැදිහත් වෙන්න සූදානම් නම් සහතික වශයෙන්ම අපේ රට ගොඩනැගිය හැකියි.

මේ රට ගොඩනැගීම සඳහා වූ ප්‍රධාන ප්‍රවේශයන් 03කට අපි අවතීර්ණ විය යුතුයි. පළමු ප්‍රවේශය අර්ථික වර්ධනය අත්පත් කරගැනීම හා ආර්ථික සාධාරණත්වය අත්කර ගන්නා නව ආර්ථික උපායමාර්ග යකට මුල පිරිය යුතුයි. දෙවනුව සමාජයට යුක්තිය හා සාධාරණත්වය කැඳවා ගෙන එන සමාජ රාමුවකුත්, තුන්වනුව පවතින දූෂිත දේශපාලන රාමුව වෙනුවට අදූෂිත දේශපාලනයකුත් හඳුන්වා දිය යුතුයි. මේ බල කණු 03 නිශ්චිත පරිදි ස්ථාපනය කළ හැකි වුණොත් නියත වශයෙන්ම මේ රට ගොඩනැගිය හැකියි. එවැනි රාජ්‍යයක් ගොඩනැගීම වෙනුවෙන් එකතු විය යුතු යුගයකට අපි පැමිණ සිටිනවා.

අපේ ජීවිත කාලය තුළ ඕනෑවටත් වඩා වැඩියෙන් මේ ආර්ථික උපායමාර්ගයේ අසාර්ථක බව කියවෙන අත්දැකීම් එකතු කරගෙන තිබෙනවා. මෙතෙක් අනුගමනය කළ ආර්ථික උපායමාර්ගය නිවැරදි බවට කිසිවෙකුටත් හෘදයසාක්ෂියට එකඟව පෙනී සිටින්න බැහැ. රටකට, ආර්ථිකයකට විය හැකි සියලුම පන්නයේ විනාශයන්ට ගෙවුණු වසර 70කට වැඩි කාලය තුළ මේ රට ඇද දමා තිබෙනවා. විශේෂයෙන් 70 මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ ආර්ථික උපායමාර්ගය අපේ රටට වේගවත් විනාශයන් අත්කරදී තිබෙනවා. රජය නිශ්චිත කාර්යභාරවලින් ඉවත්කර නීති සම්පාදනයත් යටිතල පහසුකම් සැපයීමත් වෙනුවෙන් පමණක් සීමා කෙරෙනවා. ආර්ථිකය ඉල්ලුම සහ සැපයුම තරගකාරිත්වය මත සංවර්ධනය වේවි කියන උපායමාර්ගය අනුගමනය කළා. එහි ප්‍රතිඵලයක් ලෙස පැවති ආර්ථික මර්මස්ථාන වසා දැමීම, විකුණා දැමීම නැත්නම් විකුණා වසා දැමීම සිදුකළා. පේෂ කර්මාන්ත පද්ධතිය ඇතුළු අනෙකුත් පද්ධතියම වහලා දාලා පරණ යකඩවලට විකුණුවා. ඇඹිලිපිටිය කඩදාසි කම්හල, කන්තලේ සීනි කර්මාන්ත ශාලාව පරණ යකඩවලට වික්කා.

1992දී අපේ රටේ වතු 449ක් සමාගම් 22කට පවරා දුන්නා. බලශක්ති ක්ෂේත්‍රය, මූල්‍ය ක්ෂේත්‍රය සේවාවන් යන අංශවල ආර්ථික මර්මස්ථාන රජයෙන් අතහැර දැම්මා. මෙහි ප්‍රතිඵලයක් හැටියට රාජ්‍ය ආදායම කඩා වැටෙන්න පටන් ගත්තා. 1960දී රාජ්‍ය ආදායම දළදේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 20% ක් තිබුණා. 2020 වෙනකොට ලංකා ඉතිහාසයේම තනි ඉලක්කමකට ඇවිත් 9%ට අඩුවුණා. 1952 බිලියන 01ක් වූ රාජ්‍ය ණය ප්‍රමාණය අද වෙනකොට බිලියන 15,000ක් වෙලා. විශාල ණය උගුලක හිරවී ණය ගෙවාගන්න බැරි අර්බුදයක් නිර්මාණයවී තිබෙනවා. පසුගිය අවුරුද්දේ ආණ්ඩුවේ මුළු ආදායම රු. බිලියන 1367යි. නමුත් ගෙවීමට ඇති ණය සහ පොලිය වාරිකය පමණක් බිලියන 1900 ඉක්මවනවා. දැවැන්ත ණය අර්බුදයක් නිර්මාණය වී තිබෙනවා.

මේ ආර්ථික ප්‍රතිපත්තියේම තව පැත්තක් විදිහට අපේ නිෂ්පාදන කඩා වැටුණා. ලෝක වෙළඳපොළේ අපේ පංගුව වේගයෙන් හැකිළෙන්න පටන් ගත්තා. 1950දී ලෝක වෙළඳපොළේ ශ්‍රී ලාංකේය පංගුව 0.5%යි. ඒ කියන්නේ ලෝකයේම ඩොලර් 200 වෙළඳාමක් වුණා නම් එයින් ඩොලර් එකක් අපට ලැබුණා. 2020 වෙනකොට ලෝක වෙළඳපොළේ අපේ පංගුව 0.05% දක්වා හැකිළුණා. ඒ කියන්නේ ලෝකයේ ඩොලර් 2,000ක වෙළඳාමක් සිද්ධ වෙනකොට ලංකාවට එන්නේ ඩොලර් එකයි. 1950දී විදේශ වෙළඳාමේ අපේ රටට ඩොලර් මිලියන 50ක ලාභයක් තිබුණා. අපනයන ආදායමට වඩා ආනයන වියදම ඩොලර් මිලියන 50කින් අඩුවෙලා තිබුණා. හැබැයි 2018 වෙනකොට විදේශ වෙළඳාමේ පාඩුව ඩොලර් මිලියන 10,000 දක්වා වර්ධනය වී තිබුණා. පහුගිය අවුරුද්දේදී ඩොලර් මිලියන 6,000ක පාඩුවක් බවට පත්වී තිබෙනවා. මේ ආර්ථික ගමන්මඟ සාර්ථකද?

පසුගිය අවුරුද්දේ විදේශ වෙළඳාමේ පාඩුව අඩුවී තිබෙන්නේ විශාල ආනයන පාලනයක් නිසයි. කොවිඩ් වසංගත තත්වය නිසා වාහන ගෙන්වීම, තෙල් ගෙන්වීම, සුවඳ විළවුන් වර්ග, අමතර කොටස් ආනයනය කහ වැනි ආහාර ද්‍රව්‍ය පවා සීමා කරලයි මේ වෙළඳ හිඟය අඩුකර ගත්තේ. මේ සාධකවලින් පෙන්වන්නේ ආර්ථික උපායමාර්ගයේ අසාර්ථකභාවයයි. වෙළඳ හිඟය වැඩිවෙනකොට ඩොලරයට සාපේක්ෂව රුපියල වේගයෙන් කඩා වැටෙනවා. 1950දී ඩොලර් එකක් සඳහා රු. 4.77ක් ගෙව්වා. මේ වෙනකොට රු. 206 දක්වා ගෙවන්න සිදුවී තිබෙනවා. මේ සියලු දත්තවලින් පෙන්වන්නේ දශක 07කට වඩා වැඩි කාලයක් ගමන් කළ මාර්ගයේ අසාර්ථකභාවයයි. මේ ආර්ථික මාවත වෙනුවෙන් කිසිවෙකුටත් ආවඩන්න, පෙනී හිටින්න අයිතියක් හෝ හැකියාවක් නැහැ.

චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය 1994දී මේ ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දෙන බව කිවුවා. හැබැයි අධිෂ්ඨානයක්, ධෛර්යය, ඉලක්කයක් සහ වැඩපිළිවෙළක් මෙය වෙනස්කිරීම සඳහා තිබුණේ නැහැ. බහුජාතික සමාගම් සහ ලෝකයේ බලවත් රාජ්‍යයන් විසින් අපේ රට මත පටවා තිබෙන වට්ටෝරු ඉදිරියට ගෙනයාමේ ඒජන්තවරුන් බවට පත්වුණා. එක්සත් ජාතික පක්ෂය 17 වසරක් තුළ රාජ්‍ය කර්මාන්ත ශාලා 38ක් විකුණුවා. චන්ද්‍රිකාගේ ආණ්ඩුව 48ක් විකුණුවා. මානුෂික මුහුණුවරක් දෙනවා කිවුවාට ඇය සහ ඇයගේ කණ්ඩායම ගමන් කළේ ඒ මාවතේමයි. මහින්ද රාජපක්ෂ මහත්මයා පසුගිය කාලය පුරා පැවති ආණ්ඩුව විකුණන සියල්ල යළි පවරා ගන්නා බව කිවුවත් සිදුකරමින් සිටින්නේ විකුණන මඟේම ඉදිරියට ගමන් කිරීමයි.
පසුගිය ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා නව ආර්ථික ගමනකට ප්‍රවේශ වෙන්න සූදානම් බව ප්‍රකාශ කර විකුණන ආයතන යළි පවරා ගන්නා බවත් විකිණීම මුළුමනින්ම නතර කර ජාතික නිෂ්පාදනයට යළි පණ දෙන බවත් කිවුවා. හැබැයි ඔවුන් කරමින් සිටින්නේ කුමක්ද?

දැන් මේ රටේ ජනතාවට ආර්ථිකය සම්බන්ධයෙන් තෝරා ගැනීමට මාවත් දෙකක් තිබෙනවා. මේ දක්වා පැමිණි මාවතේම ඉදිරියට යනවාද? මේ මාවතම තෝරා ගන්නවා නම් නැවත වතාවක් ගෝඨාභය රාජපක්ෂ මහත්මයාම හෝ සජිත් ප්‍රේමදාස මහත්මයා තෝරා ගන්න පුළුවන්. ගෝඨාභය රාජපක්ෂගේ දේශප්‍රේමී ජාතිකවාදී හැඩයෙන් ආවත් රනිල් වික්‍රමසිංහලාගේ නව ලිබරල්කරන මාවතෙන් ආවත් සජිත් ප්‍රේමදාසලාගේ සමාජ සුභසාධන කියන මාවතෙන් ආවත් ඔවුන් සියල්ලන්ම එකම මාවතකයි ගමන් කරන්නේ.

එසේ නැත්නම් අපි ඔබට මාවතක් යෝජනා කරනවා. මේ නිශ්චිත සංධිස්ථානයේදී විස දුම පිරුණු මාවතක් තිබෙනවා. අනෙක් පැත්තෙන් විසඳුම රැඳි මාවතක් තිබෙනවා. ඔබ තෝරා ගත යුතු වන්නේ විස දුමාරයෙන් පිරුණු මාවත නම් අවුරුදු 70කට වඩා පැමිණි මාවතේ තවදුරටත් යන්න පුළුවන්. ඔබ තෝරා ගන්නේ අර්බුදවලට විසඳුම තිබෙන මාවත නම් අප ඔබට ආරාධනා කරනවා, ඒ මාවතත් එක්ක එකතු වෙන්න කියලා.

මේ අත්දකින්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ පමණක් අසාර්ථකභාවයන් නොවේ. ඔහුගේ අපරිණතභාවය, ඔහුගේ නොදැනුවත්කම, ඔහුගේ උඩඟුභාවය මෙම අර්බුදය තීව්‍ර කරන්න හේතුවී තිබෙන බව ඇත්ත. හැබැයි මේ අර්බුදයේ මූලිකයා හෝ නිර්මාපකයා ඔහු නොවේ. අනුගමනය කරමින් තිබෙන ආර්ථික උපායමාර්ගය විසින් අර්බුදයේ ගමන් මාවත නිර්මාණය කර තිබෙනවා.

> මේ රට ගොඩනැගීම සඳහා වූ ප්‍රධාන ප්‍රවේශයන් 03කට අපි අවතීර්ණ විය යුතුයි. පළමු ප්‍රවේශය අර්ථික වර්ධනය අත්පත් කරගැනීම හා ආර්ථික සාධාරණත්වය අත්කර ගන්නා නව ආර්ථික උපායමාර්ගයකට මුල පිරිය යුතුයි. දෙවනුව සමාජයට යුක්තිය හා සාධාරණත්වය කැඳවා ගෙන එන සමාජ රාමුවකුත්, තුන්වනුව පවතින දූෂිත දේශපාලන රාමුව වෙනුවට අදූෂිත දේශපාලනයකුත් හඳුන්වා දිය යුතුයි. මේ බල කණු 03 නිශ්චිත පරිදි ස්ථාපනය කළ හැකි වුණොත් නියත වශයෙන්ම මේ රට ගොඩනැගිය හැකියි.


මේ මාවතෙන් නව දිශාවකට පරිවර්තනය වෙන්න ඔබට ආරාධනා කරනවා. ඒ තුළ ආර්ථික වර්ධනයත් ආර්ථික සාධාරණත්වයත් මූලික පදනම් වෙනවා.

ඕනෑම රටක් තමන්ගේ ආර්ථික උපාය මාර්ගය සකස් කරනකොට ප්‍රධාන කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරනවා. කිසිදු රාජ්‍යයක් තව රාජ්‍යයක ආර්ථික උපායමාර්ගයක් කොපි කිරීම වැරදියි. අපේ රට සිංග ප්පූරුවක් බවට පත්කරන්න කතා කළ හැටි මතකයි. නමුත් ඕනෑම රටක් තමන්ගේ ආර්ථික උපායමාර්ගය සකස් කර ගැනීමේදී වැදගත් මූලික කරුණු තුනක් තිබෙනවා. රටේ පිහිටීම, ස්වභාවික සම්පත් සහ මානව සම්පත යන මූලික කරුණුයි. මේ කරුණු මත පදනම් වුණු නව සංවර්ධන මාවතක් අපි මේ රටේ ජනතාවට යෝජනා කරනවා. ඉතිහාසයේදී පවා අපේ රටට විවිද ආක්‍රමණිකයන් ඇවිත් තිබෙන්නේ ආගම් පැතිරවීම හෝ සම්පත් කොල්ලකෑමට එහා ගිය වෙළඳ වුවමනාවන් වෙනුවෙන්. සේන ගුත්තික වෙළෙන්දෝ ආවේ වෙළඳාමට. ලන්දේසින් ආවේ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම මගින්. ඉංග්‍රීසීන් ආවේ ඉංග්‍රීසි පෙරදිග වෙළඳ සමාගම මගින්. මේ හැම එකකම මූලික අරමුණ වෙළඳාමයි. ව.කි.මී. 65,610ක් තිබෙන ජනගහනය කෝටි දෙකකට ටිකක් වැඩි කුඩා රාජ්‍යයක් අපි. අදත් චීනය, ඉන්දියාව, ඇමරිකාව, මේ තරම් සැලසුම්සහගතව උපක්‍රමශීලීව අපේ රටට මැදිහත් වෙන්නේ කුමක් වෙනුවෙන්ද? මේ රට පිහිටා තිබෙන ඉතාම වැදගත් ස්ථානයක් නිසා. හැබැයි මේ රටේ සිටි පාලකයන් රටට අවාසනාව ගෙනත් දී තිබෙන්නෙත් පිහිටි ස්ථානය නිසාමයි.

ඉන්දියාව, යුරෝපය, ඕස්ට්‍රේලියාව සහ ඈත පෙරදිග රටවල්වල මුහුදු මාර්ගයේ සංධිස්ථානය ශ්‍රී ලංකාවයි. ආසන්න වශයෙන් ගත්තොත් වසරකට නැව් 36,000ක් මේ මුහුදු මාර්ගයේ ගමන් කරනවා. ලෝකයේ වෙළඳාමෙන් 30% ක් සිදුවෙන්නේ ඉන්දියන් සාගරයේ

12 වැනි පිටුවට

# පීරූ දක්ෂිණාංශය වමේ ජය වළකන කුමන්ත්‍රණයක




පීරූ රාජ්‍යයේ ජනාධිපතිවරණය පවත්වා දින 20ක් ගත වී ඇතත් බලධාරීන් විසින් තවමත් ජයග්‍රාහකයා ලෙස පෙද්‍රෝ කැස්ටිලෝගේ නම ප්‍රකාශයට පත් කර නොමැත. මෙම ප්‍රමාදය දක්ෂිණාංශික කුමන්ත්‍රණයකට ඉඩ විවර කරන්නක් බව දේශපාලන විචාරකයන්ගේ මතය වී තිබේ. නීතිමය වශයෙන් ජූලි 28 වන විට ජයග්‍රාහකයා ප්‍රකාශයට පත් කළ යුතුය. එසේ නොවුණහොත් මැතිවරණ ක්‍රියාවලිය අහෝසි වන අතර කුමන්ත්‍රණයකට අවශ්‍ය ඉඩ කඩ සකස් වේ.

### පෙද්රෝගේ ජයග්‍රහණය

පසුගිය ජූනි 06 වනදා පැවති ජනාධිපතිවරණයෙන් නිදහස් පීරූ පක්ෂය නියෝජනය කළ වාමාංශික අපේක්ෂක පෙද්‍රෝ කැස්ටිලෝ 50.125%ක ඡන්ද ප්‍රතිශතයක් (ඡන්ද මිලියන 8.83) ලබා ගනිමින් මැතිවරණයෙන් ජයග්‍රහණය කළේය. ඔහු ඔහුගේ ප්‍රතිවාදියා වූ කෙයිකෝ ෆුජිමෝරිට වඩා වැඩි ඡන්ද 44,000ක් ලබාගෙන තිබේ. ඡන්ද මිලියන 8.78ක් ලබා ගනිමින් ජනප්‍රිය බලවේගය පක්ෂයෙන් ජනාධිපතිවරණයට ඉදිරි පත් වූ කෙයිකෝ ෆුජිමෝරි හිටපු ඒකාධිපති ඇල්බර්ටෝ ෆුජිමෝරිගේ දියණියයි. ඇය මෙම මැතිවරණ ප්‍රතිඵලය නොපිළිගන්නා අතර පෙද්‍රෝ කැස්ටිලෝට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලැබුණු ප්‍රදේශවල අක්‍රමිකතා සිදුවී ඇතැයි චෝදනා කරමින් ඡන්ද මධ්‍යස්ථාන 802ක ඡන්ද ලක්ෂ 02ක් පමණ අහෝසි කරන ලෙස ඉල්ලමින් අධිකරණයට ගොස් තිබේ. පීරූ මැතිවරණ අධිකාරිය මගින් අවසන් ප්‍රතිඵලය නිකුත් කර තිබුණද  බලධාරීන් විසින් තේරී පත් වූ ජනාධිපතිවරයා කවුරුන්දැයි මෙතෙක් නිල වශයෙන් ප්‍රකාශ කර නොමැත.

### කුමන්ත්‍රණය ඇරඹේ

මේ අතර ෆුජිමෝරි ඡන්ද දූෂණ පිළිබඳ චෝදනා කරමින් හා පෙද්‍රෝ කැස්ටිලෝට කැපී පෙනෙන ජයග්‍රහණයක් ගෙන දුන් ප්‍රදේශයන්හි ඡන්ද අවලංගු කරන ලෙස ඉල්ලමින් ජාතික මැතිවරණ අධිකරණයට ගොනු කර තිබූ නඩුව විභාග වෙමින් තිබියෙදී පසුගිය 23වැනිදා හදිසියේම ෆුජිමෝරිට හිතවාදීයැයි කවුරුත් දන්නා විනිසුරුවරයෙකු නඩු විභාගයෙන් ඉල්ලා අස්විය. එහි අදහස වන්නේ අධිකරණයට තවදුරටත් නඩුව ඉදිරියට ගෙන ගොස් පෙද්‍රෝ කැස්ටිලෝගේ ජයග්‍රහණය ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වන බවය. ජූලි 28 වන විට ජනාධිපතිවරයා කවුරුන්දැයි ප්‍රකාශයට පත් කළ නොහැකි වුවහොත් පීරුහි කොංග්‍රසය කැඳවා ජනාධිපතිවරයෙක් තෝරා පත් කරගත යුතුවේ. මේ මොහොතේදී කොංග්‍රසයේ වැඩි බලය තිබෙන්නේ දක්ෂිණාංශික කණ්ඩායම්වලටය. එබැවින් ඔවුන්ට තමන් කැමති පුද්ගලයෙකු ජනාධිපතිවරයා ලෙස නම් කර ගනිමින් පෙද්‍රෝ කැස්ටිලෝගේ ජයග්‍රහණය වළකාලිය හැකිය.

මේ මොහොත වන විටත් පීරුහි අග නගරය වන ලීමාවල විශ්‍රාමික යුද්ධ නිලධාරීන් උද්ඝෝෂණය කරමින් සිටින්නේ වාමාංශික පෙද්‍රෝ කැස්ටිලෝට බලය නොදෙන ලෙසත් ආරක්ෂක අංශවලට රටේ බලය බාරග න්නා ලෙසටත් බල කරමින්ය. ඊට ප්‍රථමයෙන් පෙද්‍රෝ කැස්ටිලෝ බලයට පත් වීම වැළැක්වීම සඳහා මැදිහත් වන ලෙසට ඉල්ලා සිටිමින් ලිපි තැපැල් කිරීමේ ක්‍රියාමර්ගයකටද ඔවුන් අවතීර්ණ වී තිබුණි. ජූලි 28 වනදායින් පසු තමන්ට අභිමත ජනාධිපතිවරයෙකු පත් කර ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින කොංග්‍රස් සභාවේ ඇතැම් මන්ත්‍රීවරුද මෙම උද්ඝෝෂණයන්ට සම්බන්ධ වී සිටිති.

### එක්සත් ජනපද මැදිහත්වීම

ජූනි 24 වනදා නිකුත් වූ හඬ පටයක් හේතුවෙන් පීරුහි මැතිවරණ අධිකාරිය යළිත් වරක් අර්බුදයට පත් වී සිටී. හිටපු ඒකාධිපති ඇල්බර්ටෝ ෆුජිමෝරිගේ ළඟම හිතවතෙකු වන හා දැනට සිරගතව සිටින ව්ලද්මිරෝ මොන්ටිසිනෝ ජාතික මැතිවරණ අධිකාරියේ තීරණ වෙනස් කිරීම සඳහා බලපෑම් කරන්නා වූ ආකාරය එමගින් හෙළිදරව් වී තිබේ. එම හඬ පටය මගින් ඔහු කෙයිකෝ ෆුජිමෝරිගේ කාර්ය මණ්ඩලයට උපදෙස් දෙනු ලබන්නේ ජාතික මැතිවරණ අධිකාරියේ නිලධාරීන් කිහිපදෙනෙකු තමන්ගේ හිතවතුන් බවත් ඔවුන් ෆුජිමෝරිගේ ජයග්‍රහණය තහවුරු කිරීමට කටයුතු කරනු ඇති බවත් ඒ සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සහායද ලැබෙන බවත් පවසමිනි. එක්සත් ජනපදය අලුතින් පත් කළ තානාපතිවරිය ලීසා කෙන්නාය. හිටපු එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මයික් පොම්පියෝගේ උපදේශකවරිය වූ ඇය එක්සත් ජනපද මධ්‍යම රහස් ඔත්තු සේවයේ නිලධාරිනියක් ලෙස වසර 09 ආසන්න කාලයක් ඉරාකය තුළ එක්සත් ජනපද රාජ්‍ය නිලධාරීන්ගේ ලේකම් ලෙසද සේවය කර තිබේ.

මෙන්ටිසිනෝ දැනට ඇල්බර්ටෝ ෆුජිමෝරිගේ පාලන සමයේ සිදු කරන ලද වංචා දූෂණයන්ට හා මානව හිමිකම් කඩකිරීම්වලට වරදකරුවෙකු වී නාවුක හමුදා කඳවුරක රඳවනු ලැබ සිටියි. පීරුහි නාවුක බලධාරීන්ට අනුව මොන්ටෙසිනොගේ හඬ පටයට අදාළ දිනයේදී දුරකථන ඇමතුම් ලබාගෙන ඇති බවත් එහෙත් ඒ ඇමතුම ලබා දී ඇත්තේ ඔහුගේ බිරිඳගේ නමට ලියාපදිංචි වී ඇති දුරකථන අංකයට බවත්ය. මේ පිළිබඳව දැනට පරීක්ෂණ ආරම්භ වී තිබේ.

මේ අතර පෙද්‍රෝ කැස්ටිලෝගේ ආධාරකරුවෝද දක්ෂිණාංශික කුමන්ත්‍රණයට එරෙහිව වීදි බැස උද්ඝෝෂණයන්හි නිරතව සිටිති. පසුගිය දශක පහක කාලය තුළදී පීරුහි පැවතියේ අධිරාජ්‍ය ගැති දක්ෂිණාංශික පාලනයන්ය. (1968 - 1975 වකවානුවේ පැවති ජුවාන් අල්වරාදෝගේ පාලනය පමණක් එකම වාමාංශික පාලනය විය.) එබැවින් එක්සත් ජනපදයේ මඟපෙන්වීම ලබන පීරුහි දක්ෂිණාංශික බලවේගය පහසු ලෙස සිය පරාජය භාර ගැනීමට ඇති ඉඩකඩ අඩුය. එසේ වුවත් ජාත්‍යන්තර පරිමාණයෙන්ම අධිරාජ්‍යවාදය මුහුණ දී සිටින අර්බුදය හමුවේ නිවැරදි ලෙස සටන් කළහොත් මැතිවරණ ජයග්‍රහණය තහවුරු කර ගැනීමේ ඉඩ කඩක්ද පවතී.

## කියුබාව: සම්බාධකවලට එරෙහි යෝජනාව වැඩි ඡන්දයෙන් ජය ලැබ




පසුගිය ජූනි 23වැනිදා සමස්ත ලෝකයම දශක 06කට වැඩි කාලයක් පුරා එක්සත් ජනපදය විසින් කියුබාවට පනවනු ලැබ ඇති අමානුෂික සම්බාධකවලට සිය විරෝධය ප්‍රකාශ කළහ. කියුබාව විසින් එකී සම්බාධක හෙළා දකිමින් හා එකී සම්බාධක වහාම ඉවත් කරන ලෙසට බල කිරීමට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය වෙත යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. එම යෝජනාවට පක්ෂව ඡන්ද 184ක් ලැබුණු අතර විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ එක්සත් ජනපදය හා ඊශ්‍රායලය පමණි. රටවල් 03ක් ඡන්දය දීමෙන් වැළකී සිටියහ. මෙය කියුබාව ජාත්‍යන්තර ක්ෂේත්‍රයේදී ලද විශාල ජයග්‍රහණයකි.

## බෙල්ජියම: නේටෝ සමුළුවට එරෙහිව විරෝධතා




උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයේ (NATO- නේටෝ) 31වැනි සමුළුව ජූනි 14වැනිදා බ්‍රසල්ස් නුවරදී පැවැත්විණි. මෙවර සමුළුවේ ප්‍රධාන තේමාව වී තිබුණේ චීනයෙන් එල්ලවන අභියෝගයයි. නේටෝ සංවිධානයේ මෙම සමුළුවට එරෙහිව ජූනි 13වැනි දින බෙල්ජියමේ කොමියුනිස්ට් පක්ෂය හා බෙල්ජියම් කම්කරු පක්ෂය විසින් කැඳවන ලද විරෝධතාවක් බ්‍රසල්ස්හිදී පැවැත්වුණි. ඔවුන්ගේ ප්‍රධාන සටන් පාඨය වී තිබුණේ රුසියාවට හා චීනයට එරෙහිව සීතල යුද්ධයක් එපා! යන්නය. නේටෝ සංවිධානයේ මෙම සමුළුවට එරෙහිව යුරෝපයේ තවත් රටවල් ගණනාවකදීම විරෝධතා පවත්වා තිබුණි.

## එක්සත් ජනපදය: අන්තර් ජාලයට තහංචි පනවා





එක්සත් ජනපදය විසින් ඉරානයේ සහ එම කලාපයේ තවත් ප්‍රවෘත්ති වෙබ් අඩවි ගණනාවක්, වැරදි තොරතුරු බෙදා හරින්නේය සහ ඒවා තමන්ගේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන්නේයැයි ප්‍රකාශ කරමින් අත්පත් කර ගනු ලැබ තිබේ. පසුගිය 22වැනි දින එක්සත් ජනපදය විසින් සිදු කළ මෙම අත්තනෝමතික ක්‍රියාවට දැවැන්ත විරෝධයක් එල්ල වී තිබේ. ඒ පිළිබඳ විරෝධය දක්වන සංවිධාන පවසා සිටින්නේ එක්සත් ජනපදය අන්තර් ජාලය තම සන්තකයේ ඇති දේපළක් සේ සලකා ක්‍රියා කිරීම හෙළා දකින බවය.

## ඉරානය: දැඩි මතධාරියෙකු ජනපති ධුරයට



පසුගිය ජූනි 18 වනදා ඉරානයේ පැවති ජනාධිපතිවරණයෙන් ඊබ්‍රාහිම් රයිස් ජයග්‍රහණය කළේය. ඔහු එහිදී ඡන්ද 61.95%ක ප්‍රතිශතයක් ලබා ගැනීමට සමත් විය. ඉරානයේ 13 වැනි ජනාධිපතිවරණය වූ එහිදී ඡන්දය ප්‍රකාශ කර තිබුණේ ඡන්දදායකයින්ගෙන් 49%ක් පමණි. ඊබ්‍රාහිම් රයිස් දැඩි මතධාරියෙකු වන අතර ඔහු ඉරානයේ වත්මන් 'ප්‍රතිසංස්කරණවාදී ' ආණ්ඩුව විවේචනය කරනු ලැබුවේ රට තුළ මතුවී ඇති කොවිඩ් 19 වසංගත තත්වය නිසි ලෙස පාලනය කිරීමට අසමත් වීම හා ආර්ථිකය බිඳ වැටීමට ඉඩ හැරීම යන කරුණු ඉදිරිපත් කරමිනි.

# ආර්ථිකය කැබලිකර පහසු මිලට විකිණීම



Source: Selendiva Investments Ltd

**'සෙලෙන්දිවා!'**

ආණ්ඩුවක් රටක ඉඩම් කැබලි කර විකිණීමේ පෞද්ගලික සමාගමක් බවට පත්වීම රටක පැවැත්මට කෙසේ වනු ඇත්ද? අද නව ලිබරල් ධනවාදී ආර්ථික ක්‍රියාවලියේදී ලංකාවේ වත්මන් පාලකයින් පත්ව ඇත්තේ ඒ තත්වයටය.

වත්මන් ගෝඨාභය රාජපක්ෂ පාලනය විසින් මෑත කාලයේ ලංකාවේ පත්වූ දුර්වලම පාලකයා බව දැන් හොඳාකාරව ඔප්පු කරනු ලැබ ඇති අතරම ඔහු හා ඔහුගේ ආණ්ඩුව මේ මාතෘභූමිය පඹගාලකද පටලවා හමාරය. එක් පැත්තකින් ඉන්ධන මිල ඉහළ දැමීම මගින් සාමාන්‍ය ජනතාව, ධීවර ජනතාවට ජීවන බර පටවා මරුපහරක් එල්ල කරනු ලැබ ඇත. අනෙක් අතට පොහොර අර්බුදය මගින් ගොවි ජනයා අද මහපාරට කැඳවවනු ලැබ ඇත. එසේම කොරෝනා වසංගතයට නිසි විසඳුම් නොමැතිව රට අවසානයක් නොපෙනෙන සෞඛ්‍ය අර්බුදයකට ඇද දමනු ලැබ ඇත.

ඒ ඉහත අර්බුද සියල්ල අතරේ ආණ්ඩුව මුහුණදෙන විදේශ විනිමය අර්බුදය (ඩොලර් සංචිත හීනවීම) හමුවේ සොච්චම් ඩොලර් ප්‍රමාණයක් ලබාගැනීම වෙනුවෙන් රටේ වටිනා වත්කම්, ඉඩම් දේපළ විකිණීමද ආණ්ඩුව විසින් ආරම්භ කර තිබේ.

කොළඹ වරාය නගරය (පෝට් සිටි) ව්‍යාපෘතිය මගින් කොළඹ වරයට යාබදව හෙක්ටයාර් 269ක අලුතින්ම ඉදිවන නගරය චීන හවුල් ව්‍යාපාරයක් ලෙස චීනය මූලිකව ජාත්‍යන්තර වෙළඳපොළට විකිණීම අරඹා ඇත. එම ව්‍යාපෘතියටම ඇදෙන කොටසක් ලෙස කොළඹ නගරය ඇතුළුව රට පුරා වාණිජ වටිනාකම ඇති රජයේ දේපළ විකිණීමට සෙලෙන්දිවා ආයෝජන සමාගම ආණ්ඩුව විසින් මේ වන විට පිහිටුවා ඇත.

**මොකක්ද මේ සෙලෙන්දිවා?**

රජයේ සමාගම ලෙස රාජ්‍ය ව්‍යාපාර සමාගම ඇති කිරීමේ නීතිමය ක්‍රමවේදයක් ඇත. එයට නීතිමය ලෙස බාධාවක්ද නැත. එම රාජ්‍ය සමාගම පිහිටුවා ඇත්තේ නීතිමය ලෙස ස්ථාපිතවී ඇති සංස්ථා, මණ්ඩල අධිකාරීන් යටතේය. උදාහරණ ලෙස මේ දිනවල ගෑස් ටැංකිවල ලේබල් වෙනස් කිරීමට සහ බර අඩු කිරීමට අදාළව කථාබහට ලක්වී ඇති ලිට්රෝ ගෑස් සමාගම එවැනි රාජ්‍ය සමාගමකි. එය 100% ක්ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යටතේ ඇති සමාගමකි. විදුලි බල මණ්ඩලය යටතේ වන ලෙකෝ ආයතනයද, පශු සම්පත් මණ්ඩලය යටතේ ඇති මිල්කෝ ආයතනයද, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකන් ගුවන් සමාගමද එවැනි රාජ්‍ය ව්‍යාපාරික සමාගම්ය.

සෙලෙන්දිවා ආයෝජන සමාගම පිහිටුවීම ඊට සපුරා වෙනස්ය. පළමු පියවර ලෙස 2020 මාර්තු 04වැනිදා රාජ්‍ය හිමිකාරිත්වයෙන් යුත් දේපළ සමාගමක් පිහිටුවීමට ආණ්ඩුවේ කඩිනම් මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. ඉන්පසු 2020 ජූලි 03 වැනි දින සෙලෙන්දිවා ආයෝජන පුද්ගලික සමාගම සංස්ථාගත කර පිහිටුවා ඇත. එම සෙලෙන්දිවා සමාගම 100% ක් භාණ්ඩාගාරයේ අයිතිය ඇති සමාගමක් ලෙස ස්ථාපිත කර ඇති අතර දැනටමත් රජය සතු (1) හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම (2) කැන්විල් හෝල්ඩින්ස් සමාගම (3) හොටෙල් කොලොම්බු සමාගම මෙම සෙලෙන්දිවා සමාගමේ මූලික වත්කම ලෙස පවරාදී ඇත.

සෙලෙන්දිවා භාණ්ඩාගාර හිමිකම සහිතව ලියාපදිංචි කළ පරිපාලන සමාගම (Holding Company) ලෙස පවතිනු ඇතැයි 2021.05.05 දින මෙම සමාගම් ව්‍යුහයට කැබිනට් අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේම පැහැදිලිව සඳහන් කර ඇත.

**පරිපාලන අනුබද්ධ සමාගම** (SPV)

සෙලෙන්දිවා ආයෝජන සමාගම මව් සමාගම ලෙස කටයුතු කරන අතර එම සමාගමේ අනුබද්ධ සමාගමක් ලෙස (Holding SPV) තවත් සමාගමක් පිහිටුවීමට නියමිතය. පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය යටතේ නිර්මාණය කරන මෙම සමාගම සෙලෙන්දිවා සමාගමට පවරා ගනු ලබන දේපළ රාජ්‍ය වත්කම් විකිණීමේ කටයුතු සිදු කරන ක්‍රියාකාරී යාන්ත්‍රණය වනු ඇත. රාජ්‍ය අයිතිය 100%ක් ඇති රජයේ සමාගමක් යන ව්‍යාජ වෙස් මුහුණු ගැලවෙන්නේ මෙහිදීය. රජයේ අයිතිය විකිණීම සඳහා හැබෑ ලෙසමටම ක්‍රියා කරන්නේ මෙම සමාගමයි. මෙම අතරමැදි සමාගමේ ප්‍රවර්ධන කොටස්වලින් සෙලෙන්දිවා ආයතනයට හිමිවන්නේ 10%ක ප්‍රමාණයක් පමණි.

පරිපාලන සමාගමේ තනි වත්කමක කොටස් වලින් 49% ක් දක්වා නිදහස් කර අනුබද්ධ සමාගමේ කොටස් ප්‍රාග්ධනය සකස් කරන අතර එම සමාගම පුද්ගලික - රාජ්‍ය හවුල්කාරිත්ව (PPP) සමාගමක් වනු ඇත.

**විකිණීමේ මොඩලය! ප්‍රතිව්‍යුහකරණය**

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ නිශ්චිත පනතකින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එය පාර්ලිමේන්තුවට වගකියන ව්‍යවස්ථාපිත ක්‍රමවේදය වේ. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට පවරාදී ඇති බලතල අනුව නිශ්චල දේපළ, ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිගුකාලීන බදු පදනම යටතේ ගිවිසුම් ගතව බදු දෙනු ලැබේ. එම බදු ආදායම නිශ්චිත ව්‍යවස්ථාපිත ක්‍රමවේදයක් මගින් රජයේ ආදායමක් වනු ඇත. එසේ තිබියදී, එම රජයේ ඉඩම් ගොඩනැගිලි ප්‍රතිව්‍යුහගතකරණය නමින් නම් කර කොටස් වෙළඳපොළේ අලෙවි කිරීමේ කටයුත්ත සිදු කරන්නේ මේ කැබිනට් මණ්ඩලයේ පමණක් අනුමතිය ලබා තිබෙන සෙලෙන්දිවා දේපළ ආයෝජන සමාගම විසිනි.

දැනට මූලික ලෙස ඉහතින් සඳහන් කළ රාජ්‍ය සමාගම් 03ක් මේ සඳහා එකතු කර ඇති අතර, ඒ යටතේ ආයෝජන කලාප ලෙස සඳහන් කරන ක්ෂේත්‍ර 03ක කොළඹ නගරයේ වටිනාම ඉඩම් සෙලෙන්දිවා සමාගමට පවරා ගෙන ආයෝජකයින් හට විකිණීමේ බලය මෙම සෙලෙන්දිවා සහ අනුබද්ධ සමාගමට ලබාදී ඇත. ඒ යටතේ,

1 කොළඹ කොටුව Heritage Square ආයෝජන කලාප ස්ථාපිත කිරීම

2 නිශ්චල දේපළ ආයෝජන කලාප

3 රජයට අයත් සත්කාරක අංශය ලෙස ප්‍රධාන අංශ (ආයෝජන කලාප) 3කි.

කොළඹ කොටුව සංස්කෘතික උරුම චතුරශ්‍රය යටතේ අක්කර 1.57ක ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, සහ යෝර්ක් ගොඩනැගිල්ල, අක්කර 0.75ක භූමියක පිහිටි ගෆූර් ගොඩනැගිල්ල සහ කොළඹ මහ තැපැල් කාර්යාලය, අක්කර 1.5ක පමණ වන විදේශ කටයුතු අමාත්‍යාංශ ගොඩනැගිල්ල අයත් වේ.

නිශ්චිත දේපළ සංවර්ධන කලාප යටතේ කොළඹ සීනෝර් රෙස්ටුරන්ට් දේපළ, අක්කර 5ක් වන බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලය හා එම ඉඩම, යාපනයේ කන්කසන්තුරේ ඇති ජාත්‍යන්තර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය අයත්වේ.

ඉහත රජයට අයත් සත්කාරක අංශය ලෙස කොළඹ හිල්ටන් හෝටලය හා ක්‍රීඩා මධ්‍යස්ථානය, දැනටමත් ඉදිකිරීම අවසන් නොවූ කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටලය අයත් වේ.

මෙම ගොඩනැගිලි හා දේපළ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ වන බලතලවලින් ගලවා ඍජුව ආයෝජකයින්ට අලවි කිරීමේදී ඇතිවන ලියවිලි සකස් කර දීමේ සිට සියලුම බදු සහන ලබාදීමේ හැකියාවද කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත. ඒ යටතේ විදේශ ආයෝජකයින්ට බදු සහන ලබා දෙන උපායමාර්ගික සංවර්ධන ව්‍යාපාරික පනතට අනුව ලබා දෙන බදු සහනද ඇතුළත්ය.

**බන්ධනාගාරය හිස් කිරීම!**

සෙලෙන්දිවා ආයෝජන සමාගම කැබිනට් මණ්ඩලයේ අනුමත කරන දිනයේදීම නාගරික සංවර්ධන ඇමති ලෙස මහින්ද රාජපක්ෂ සහ අධිකරණ ඇමති අලි සබ්රි ඒකාබද්ධව ඉදිරිපත් කරන තවත් කැබිනට් සංදේශයකින් අවසර ඉල්ලා ඇත්තේ කොළඹ - බොරැල්ල බේස්ලයින් මාර්ගය ආසන්නයේ ඇති වැලිකඩ බන්ධනාගාර භූමියද එම ස්ථානයෙන් කළුතර මිල්ලනියට ඉවත් කර, එම භූමියද විකිණීමට නිදහස් කර ගැනීමටයි. එම ප්‍රමාණය භූමිය ලෙස අක්කර 42කි. මෙම ඉඩමද ඉහත සෙලෙන්දිවා ව්‍යාපෘතිය ලෙසටම වාණිජ වටිකාම් ලෙස නම් කර අලෙවි කිරීමට නියමිත බව අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින්ම තහවුරු කර ඇත. මිල්ලනිය ප්‍රදේශයේ බන්ධනාගාරය ස්ථාපිත කිරීමට ඇස්මේන්තු කරන වියදම රු. බිලියන 30.6ක් වන අතර එම මුදල කොටස් 03කින් භාණ්ඩාගාරය මගින් ණයක් ලෙස ලබාදෙන අතර, එම ණය ඉඩම බදු දීමෙන් ලැබෙන මුදලින් පියවන බව එහි දැක්වේ. එහිම තවත් තැනක දක්වා ඇත්තේ අදාළ වැලිකඩ බන්ධනාගාර ඉඩම අදියර 03ක් යටතේ සංවර්ධනය කිරීමට දේශීය හා විදේශීය ආයෝජකයින්ට බදු පදනම මත ඉඩම බැහැර කරන බවයි. එසේම මෙම ඉඩම නිදහස් දීමනා පත්‍රයක් මගින් නාගරික සංවර්ධන අධිකාරියට පවරන බවද දැක්වේ.

කලින් ඉදිරිපත් කළ සෙලෙන්දිවා පිහිටුවීමේ කැබිනට් සංදේශයේ දැක්වූයේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති ඉඩම් සෙලෙන්දිවා වෙත පවරා දීමයි. ඒ අනුව ඊළඟ පියවර ලෙස මෙම භූමියද සෙලෙන්දිවා දේපළ සමාගමේ විකිණීමේ තවත් කොටසක් වනු ඇත.

**පෝට් සිටි හා සෙලෙන්දිවා**

මෑතකදී පාර්ලිමේන්තුවේ සම්මත කළ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය (පෝට් සිටි) සහ මෙම සෙලෙන්දිවා ආයෝජන ව්‍යාපෘතිය අතර ඇත්තේද ඓන්ද්‍රීය සම්බන්ධයකි. කොළඹ වරාය නගරයට ආශ්‍රිතව ඇති ඓතිහාසික හා ආර්ථික ලෙස වටිනාම ඉඩම් මෙලෙස අලෙවි කිරීමට නියම කර ඇත්තේ පෝට් සිටි ව්‍යාපෘතියේම තවත් කොටසක් ලෙසම විය හැකිය.

කලින් රජයේ ආයතන පෞද්ගලීකරණය කළ දුබල ධනපති පාලකයින් අද පත්ව ඇත්තේ එක් පසෙකින් කෘෂිකර්මාන්තය දුබල කරමින් ගොවි බිම් බහුජාතික සමාගම් වෙත පවරන ආකාරයටම කොළඹ වාණිජ වශයෙන් වටිනා ඉඩම්ද අලෙවි කිරීමයි.

රජය ආර්ථික ක්‍රියාවලියෙන් ඍජු ලෙසම ඉවත්වීමත්, එසේම ප්‍රාග්ධනයට එම ආර්ථිකයන් අත්පත් කර ගැනීමට දැනට පවත්නා නීතියේ ඇති සීමාවන්, බාධාවන් ඉවත්කර දීමත් නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණයන්ගේ මූලිකම අවශ්‍යතාවයකි. සෙලෙන්දිවා ආයෝජන ආකෘතියද අප තේරුම්ගත යුත්තේ ඒ ධනවාදී ආර්ථික වුවමනාවට සකස් කළ ක්‍රමවේදයක් ලෙසිනි. නාගරික සංවර්ධන අධිකාරයටද දිගුකාලීන බදු පදනමින් ඉඩම් ව්‍යාපාරික අවශ්‍යතාවයන්ට බැහැර කිරීමට හැකි වුවත් එය ඉක්මනින් සූරාකෑම අපේක්ෂා කරන ප්‍රාග්ධනයට සීමාවන් බාධාවන් රැසක් පනවා ඇත. දැන් මේ නව 'ප්‍රාග්ධන ප්‍රතිව්‍යුහකරණ' නාමයන් යොදා සිදු කරන්නේ ඒ බැඳීම් සරල කර දීමයි. අධිරාජ්‍යවාදී ප්‍රග්ධනයට රිසි සේ ආර්ථිකය, ඉඩම්, දිගු කාලයකට ආක්‍රමණයකට ඉඩ හදා දීමයි. ආණ්ඩුවට හුස්ම ගැනීමට අන්තිම පැයේදී හෝ ඩොලර් ප්‍රමාණයක් ලැබේ නම්, ඒ මගින්ම පාලකයින්ට සහ ඔවුන්ගේ චෞර ව්‍යාපාර වළල්ලට කොමිස් ලැබේ නම් ඔවුහු කිසිදු හිරිකිතයකින් තොරව මේ විකිණීමට අත් ඔසවති. අඩු තරමේ පාර්ලිමේන්තුවේ ජනතා නියෝජනය මත සම්මත කළ

12 වැනි පිටුවට



"හොඳ දෙයක් වෙනුවට හොඳ දෙයක් දීම කාටත් කළ හැක. එහෙත් නරක දෙයක් වෙනුවට හොඳ දෙයක් දිය හැක්කේ නිර්භීත මිනිසුන්ට පමණි."

**රුසියානු කියමනක්**

# සියලුම දරුවන්ට අධ්‍යාපනයේ අවස්ථා සමානව ලැබිය යුතුයි

'අයිතීන් උදෙසා කාන්තාවෝ' සංවිධානයේ විධායක කමිටු සාමාජිකා
විශාකා ගෝතමී අබේරත්න



මේ වන විට කොවිඩ් වසංගතය නිසා වසර 1 1/2 ක පමණ කාලයක් පාසැල් වසා දමා තිබෙනවා. දරුවෝ පාසැල් ගියා නම් යහළුවන් ඇසුරු කරනවා, සෙල්ලම් කරනවා, කෑම බීම, පෑන පැන්සල බෙදා හදා ගන්නවා. නමුත් දැන් මේ සියල්ල නැතිවෙලා. ඒ නිසා දරුවෝ ඉන්නේ දැඩි කනස්සල්ලෙන්. ඒ කියන්නේ දරුවො සමාජානුයෝජනය වීම සම්පූර්ණයෙන් නතර වෙලා. දැන් ඔවුන් දකින්නේ ඇසුරු කරන්නේ පවුලේ සාමාජිකයින් පමණයි. ඒ වගේම මේ වසංගතය නිසා දෙමාපියන් ඉන්නෙත් ලොකු පීඩනයක. තමන්ගේ කාර්යාලයේ කටයුතු, ගෙදර දොරේ කටයුතු, එදිනෙදා ජීවත් වෙන්නේ කොහොමද කියන එක, ණය ගෙවා ගැනීමේ ගැටලු, ඒ වගේම මේ වසංගතයෙන් බේරෙන එක, මේ නිසාම දරුවෝ තමන්ගේ පීඩනය දෙමාපියන් මතින් සහ දෙමාපියන් ඔවුන්ගේ පීඩනය දරුවන් මතින් මුදා හරින තත්වයට පත් වෙලා.

මේ සියළු තත්වයන් මැද අද දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන්න වෙලා තියෙන්නේ ඔන්ලයින් මගින්. එතකොට ඒ මාර්ගයෙන් ඉගෙනුම ලබන දරුවන්ට මෙන්ම උගන්වන ගුරුවරුන්ටත් එයට අදාළ පහසුකම් තිබිය යුතු වෙනවා. නමුත් ආණ්ඩුවේ බලධාරීන් කියන විදියට නම් ඔන්ලයින් අධ්‍යාපනයට සම්බන්ධ වෙන්නේ අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් 22%ක් පමණ පිරිසක් විතරයි. ඒ කියන්නෙ දරුවන්ගෙන් 78% ක් අධ්‍යාපනයෙන් පිටමං කරලා කියන එකයි. එක පැත්තකින් පැවති සහ පවතින ආණ්ඩුවෙත් මූලික අරමුණ නැති බැරි අය අධ්‍යාපනයෙන් පිටමන් කිරීම නිසා එගොල්ලොන්ගෙ වැඩ පිළිවෙලත් එක්ක මේ ඔන්ලයින් අධ්‍යාපනය හොඳින් සමපාත වෙනවා.

ඇත්තටම මේක යට තියෙන්නේ ධනවාදී ආර්ථික ක්‍රමයේ අර්බුදයමයි. රටේ ආදායම් බෙදීයාමේ විෂමතාවය පෙන්වන කැඩපතක් බවට අද ඔන්ලයින් අධ්‍යාපනය පත්වෙලා තියෙනවා. මේ තත්වය යම් තරමකට හෝ සමනය කර ගන්න ලංකා ගුරු සේවා සංගමය ඉදිරිපත් කරපු සියලු රූපවාහිනී නාලිකා, අධ්‍යාපන වැඩසටහන් වෙනුවෙන් වෙන් කරන්න, විධිමත් කාල සටහනකට දරුවන්ට උගන්වන්න කියන යෝජනාවත් ආණ්ඩුව නොසලකා හැර තියෙනවා.

ඒ නිසා සියලුම දරුවන්ට අධ්‍යාපනය සමානව ලැබෙන වැඩපිළිවෙලක් හදන්න කියන යෝජනාව මේ ආණ්ඩුවට කියනවාට වඩා එසේ කර ගත හැකි පාලනයක් පිහිටුවා ගැනීමට පීඩාවට පත් වුණු සියලු දෙනා පෙළගැසිය යුතුයි.

## ඔන්ලයින් කඳුළු



මං එකට ගිය ගමන් ඉස්කෝලෙ වැහැව්වා
තාත්තාගෙ අසනීපෙ ලණු ඇදේ රිදෙව්වා
අම්මාගේ රස්සාව හැමදාම සැගෙව්වා
දවසකට එක වරක් ලිපි ගිනි මෙලෙව්වා

නිවාඩුව ලොකු නිසා ඔන්ලයින් තිබුණාලු
මං වගෙම තව ළමයි අසරණව උන්නාලු
ගුරුතුමී හැමදාම අපේ ගැන ඇහුවාලු
එකේ හිටියෙම නැතුව අපි දෙකටම දැම්මාලු

දෙකේ පන්තියෙ වුණත් දවස් කීයද ගියේ
බැරි නිසයි අන්තිමේ අම්ම මේ ණය වුණේ
තුන් දෙනෙක් ඉන්නවා විසඳුමක් නෑ අනේ
අන්තිමේ අක්කටයි පළමු තැන හිමි වුණේ

ශිෂ්‍යත්වෙ ලියන්නට තවම කල් තියෙනවා
අක්කා මේ දෙසැම්බර් විභාගය ලියනවා
"ඕක දීපන් පුතේ" අම්මා දුක කියනවා
මං ඉතින් කාටවත් නොපෙනෙන්න අඬනවා

පංතියේ ලස්සනට අකුරු ලිව්වේ මමයි
නටන්නට ගයන්නට මමත් හපනෙක් තමයි
ඔන්ලයින් නොඑන මට අකුරු තහනම් හැඩයි
හිත පුරා මම දුටුව හීන මට දුර වැඩියි

# මව්වරුන්ගේ කඳුළු වියලෙන්නේ කවදාද?

මෙතෙක් කලක් ඇමතුමක් ලබා ගන්නට, අන්තර්ජාලයට පිවිසෙන්නට, ඡායාරූපයක් ගන්නට වැනි කටයුතු සඳහා යොදාගත් ස්මාර්ට් දුරකථන, ටැබ්, ලැප්ටොප්, ඩෙස්ක් පරිගණකයන් වර්ථමානයේදී පන්ති කාමර බවට පත් කරමින් සුපුරුදු ලෙස අධ්‍යාපනය ලබා දුන් පාසල් ඇතුළු අධ්‍යාපන ආයතන වැසී තිබේ.

සමහරුන් මහත් ආඩම්බරයෙන් "අපේ දරුවෝ ඔන්ලයින් ඉගෙන ගන්නවා"යැයි ප්‍රකාශ කළත් රටේ බහුතරයක් දරුවන්ගේත්, දෙමව්පියන්ගේත් කතන්දරය ශෝකාලාපයකි. කොවිඩ් වසංගතය තත්වය තුළ දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටීමේ ඛේදවාචකය තුළ වැඩිම මානසික පීඩාවට පත්වන්නේද මව්වරුන්ය.

තවද තමන්ට හිමි වැටුප් පවා පැවති ආණ්ඩු විසින් උදුරාගත් පසුබිමක් තුළ සොච්චම් වැටුපක් ලබන ගුරුවරු මේ අතිශය දුෂ්කර මොහොතේ කුමන හෝ අයුරකින් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ වගකීම තම උරමතට ගෙන කටයුතු කරමින් සිටිති.

ලංකාවේ දරුවන්ගෙන් ඔන්ලයින් අධ්‍යාපනයට පිවිසෙන්නේ 22% ක ප්‍රමාණයක් බව අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයාම පසුගියදා පිළිගෙන තිබුණි. නමුත් ඉතිරි 78%ට ලබාදෙන විසඳුම කුමක්දැයි ආණ්ඩුවට හෝ අධ්‍යාපන බලධාරීන්ට පිළිතුරක් නැත.

වසර 1 1/2ක් පුරා කොවිඩ් වසංගතය හේතුවෙන් තම එදිනෙදා ජීවිකාව පවා අහිමිව ඇති වූවන්ට අලුතින් ජංගම දුරකථනයක් මිලදී ගැනීම තබා තුන් වේල කෑමත් සිහිනයකි. එය මිලදී ගත්තද මීළගට ඒ සඳහා මුදල් වියදම් කිරීම තවත් ගැටලුවකි. නොකා නොබී හෝ මේ සියල්ල සපුරා ගත්තද ඊළඟ දුෂ්කර කාර්යය වන්නේ දුරකථන සංඥා සොයා ගැනීමයි.



මොනරාගල, බදුල්ල ප්‍රදේශයේ දරුවන් තම මව්වරුන්ද සමග කිලෝ මීටර් හයක් පමණ දුරක් ගෙවා කුකුල් ඇට කන්දට නගින්නේ දුරකථන සංඥා සොයාගෙනය. තවත් ගමක සංඥා තිබෙන්නේ එහි ඇති ගව ගාලක් අසළට පමණකි. දරුවන් පැදුරු එළා ගවගාලේ අධ්‍යාපනය ලබයි. තවත් ප්‍රදේශයක සංඥා හමුවන්නේ ගස් උඩය. ඒ නිසා රෑ පැල් රකින්නට මෙන් ඉණිමගක් තබා උදේ සවස ගස් බඩගාන්නට දරුවන්ට සිදුවේ. දරුවන් අවදානමේ ගස් නගිනවිට අම්මලාගේ පපුවෙහි කෙතරම් නම් ගින්නක් ඇවිලෙනු ඇත්ද?

ඔන්ලයින් මගින් අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන්ද එයට අවශ්‍ය උපකරණ, දත්ත හා සංඥා සොයා ගැනීමේ ගැටලුවලට මුහුණ දෙමින් සිටියද, ආණ්ඩුවෙන් ගුරුවරුන් සඳහා කිසිදු සහනයක් ලබා දෙන්නට මෙතෙක් කටයුතු කර නැත. එසේම එම ගුරුවරුන්ටද ඔන්ලයින් මගින් අධ්‍යාපනය ලබන දරුවන් සිටී නම් නිවසේ තත්වය තවත් බරපතළය.

එක් දරුවෙකුට වඩා ජීවත්වෙන නිවසක එකම දුරකථනයකින් දරුවන් දෙදෙනා හෝ තුන්දෙනාටම අධ්‍යාපනය ලැබීමට සිදුවන්නේ නම් තත්වය කෙබඳු විය හැකිද? බොහෝවිට සිදුවන්නේ ආසන්නතම ජාතික මට්ටමේ විභාගයට පෙනී සිටින දරුවෙක් ඇත්නම් ඔවුන්ට ප්‍රමුඛස්ථානය දී අනෙක් දරුවන්ගේ කටයුතු ඇනහිටීමයි. මව්වරුන් මේ තෝරා ගැනීම සිදු කිරීමේදී කෙතරම් නම් පීඩාවකට ලක්වෙනවා ඇත්ද?

එසේම ඔන්ලයින් අධ්‍යාපනයේ යෙදෙන දරුවන්ට සෞඛ්‍ය මෙන්ම මානසික ගැටලු ගණනාවකට මුහුණදීමට සිදුව ඇත. පසුගිය දවසක ප්‍රවෘත්ති ප්‍රකාශයක පළවූ ප්‍රවෘත්තියක වීඩියෝවක් සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය වුණි. එහි සඳහන් වූයේ ඔන්ලයින් අධ්‍යාපනයේ නියැලෙන දරුවන් වැඩි වැඩියෙන් පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහි වී ඇති බවයි. එහිදී මවක් හැඬු කඳුලින් පැවසුවේ ඉතාම කීකරු දරුවෙකු වූ ඇගේ පුතා දැන් දෙමව්පියන් නුරුස්නා බවත් ඔවුන් මරාදැමීමට තරම් මානසිකත්වයක් දරුවාට ඇති විය හැකි බවත්ය.

දුරකථනයෙන් බලනවට වඩා ටැබ් එකෙන් බලන එක හොඳයි. ඊට වඩා ලැප්ටොප් එක හොඳයි. ටීවී එක තව හොඳයි. ප්‍රොජෙක්ටර් එකක් භාවිතා කර

12 වැනි පිටුවට

## සිව්දෙසින්

## සම අයිතිය ඉල්ලා ස්විස් කාන්තාවෝ අරගලයක




ස්විට්සර්ලන්තයේ ජිනීවා, බාසෙල් සහ සූරිච් නගර ඇතුළු නගර 40ක පමණ කාන්තාවන් ප්‍රමුඛ කරගත් විරෝධතා මාලාවක් පසුගියදා පැවැත්විණි. මෙම විරෝධතාවන්හි ප්‍රධානම අරමුණ වූයේ කාන්තාවන්ට සම වැටුප් ලබාගැනීම, සේවා ස්ථානයන්හිදී කාන්තාවන්ට සිදුවන අතවර හා ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව විරෝධය ප්‍රකාශ කිරීම සහ කාන්තාවන් විශ්‍රාම යන වයස වසර 65 දක්වා වැඩි කිරීමට විරෝධතාවය ප්‍රකාශ කිරීමයි. විරෝධතාකරුවන් ප්‍රකාශ කරන්නේ ස්විස් කාන්තාවන්ට ඡන්ද බලය ලැබී වසර 50ක් ගතවී තිබියදීත්, ව්‍යවස්ථාවට සමානාත්මතාවය පිළිබඳ සංකල්පය ඇතුළත් කර වසර 40ක් ගතවී තිබියදීත්, පළමු කාන්තා වැඩවර්ජනයට වසර 30ක් ගතවී තිබියදීත්, 2019 පැවැත්වූ විශාල කාන්තා වැඩවර්ජනයට වසර 02ක් ගතවී තිබියෙදීත් මෙම සමානාත්මතාවය පිළිබඳ ඉල්ලීම් අදටද වලංගු බවයි. එසේම පැතිර යන කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ කාන්තාවන් තවදුරටත් අයුක්තියට අසාධාරණයට ලක්ව ඇති බවත් ඔවුහු ප්‍රකාශ කරති. එසේම එරට වෘත්තීය සමිති ෆෙඩරේෂණයද ප්‍රකාශ කරන්නේ ස්විට්සර්ලන්තය තුළ කාන්තාවන්ට පිරිමින් හා සමාන වැටුප් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමේ ප්‍රගතියක් දක්නට නොමැති බවයි.

## අන්තර්ජාල ඡායාරූප හේතුවෙන් දකුණු කොරියානු කාන්තාවෝ පීඩාවක




මානව හිමිකම් පිළිබඳ හියුමන් රයිට්ස් වොච් ආයතනය ඉදිරිපත් කරන ලද 'මගේ ජීවිතය ඔබේ කාමෝද්දීපනය සඳහා නොවේ: දකුණු කොරියාවේ ඩිජිටල් ලිංගික අපරාධ' නම් වාර්තාවක දැක්වෙන පරිදි දකුණු කොරියාවේ අන්තර්ජාලය සහ ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් සිදුකරන ලිංගික අපරාධ (උදා- ස්පයිකැම් ආදිය භාවිතයෙන් සිය කැමැත්තෙන් තොරව ලබාගෙන අන්තර්ජාලය තුළ පළ කරනු ලබන ඡායාරූප හා වීඩියෝ) හේතුවෙන් දකුණු කොරියානු කාන්තාවන් සහ ගැහැනු ළමුන් පීඩාවට පත්වන තත්වයක් ඇතිවී තිබේ. එසේම අපරාධ නීති පද්ධතිය තුළ කටයුතු කරන නිලධාරීන් බොහෝදුරට පිරිමි පාර්ශවය වන අතර ඔවුන් මේවා බරපතළ අපරාධ ලෙස පිළිනොගැනීමත් මෙම අපරාධවලට ගොදුරු වන කාන්තාවන්ට යුක්තිය ඉටුකරවා ගැනීමට බාධාවක් වී ඇති බව මෙම වාර්තාවේ දැක්වේ. තවද මෙම ඡායාරූප සංසරණය වීම පාලනය කිරීමට අපහසු තත්වයක් ඇතිවී තිබෙන බවද මෙම වාර්තාව පෙන්වා දෙයි. මෙම අපරාධවලට ගොදුරුවූවන් සහ විශේෂඥයින් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා මෙම වාර්තාව සකස් කිරීමට පාදක කරගෙන ඇත. 'මගේ ජීවිතය ඔබේ කාමෝද්දීපනය සඳහා නොවේ' යන තේමාව ඔස්සේ 2018 වර්ෂයේ අගභාගයේ දකුණු කොරියාව තුළ විරෝධතා රැල්ලක්ද වර්ධනය විය. අනෝන්‍ය ගෞරවය මිනිසුන් තුළින් බැහැර කළ තම ආරක්ෂාව සහ තම පැවැත්ම පමණක් වැදගත් යැයි සිතීමට හුරු කරවූ ධනපති සමාජ ක්‍රමය තුළ මෙකී තත්වයන් විරල නොවන අතර ඉදිරියේ තවදුරටත් වර්ධනය වීමේ හැකියාවද පවතී. ලංකාව ඇතුළු තවත් රටවලද මෙවැනි සිදුවීම් නිරීක්ෂණය කළ හැකිවේ.

## ස්ත්‍රී දූෂණයන්ට එරෙහිව ඊශ්‍රායලයේ විරෝධතා



පසුගියදා ජෙරුසලමේදී සිය ගණනක් කාන්තාවන් වාර්ෂිකව පවත්වන 'ස්ලට්වෝක්' පාගමනට එක් වූයේ ස්ත්‍රී දූෂණ සංස්කෘතියට සහ කාන්තාවන්ට සිදුකරන ප්‍රචණ්ඩත්වයට එරෙහිව විරෝධතාවය පළකිරීම සඳහායි. මෙම පාගමන ප්‍රථම වරට පවත්වන ලද්දේ 2011 වසරේදීය. ඒ කැනේඩියානු පොලිස් නිලධාරියෙකු විසින් සිදු කරන ලද ප්‍රකාශයකට එරෙහිවය. ඔහු ප්‍රකාශ කළේ කාන්තාවන්ට ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු නොවීමට අවශ්‍ය නම් ඔවුන් කාමෝදීපනය කරන ඇඳුම් ඇඳීමෙන් වැළකිය යුතු බවයි. මෙයට සමගාමීව ලොව පුරා විරෝධතා ඇති වූයේ කාන්තාවන් හිංසනයට ලක්වන්නේ ඔවුන්ගේම වරදින්ය යන මතයට එරෙහිවය. ජෙරුසලමේ පැවති මෙම විරෝධතා පාගමනට කාන්තාවන් විවිධ ආකරයේ ඇඳුම්වලින් සැරසී සහභාගි වූ අතර ඒවා කාමෝදීපනය කිරීමට සමත් යැයි සැලකෙන ඇඳුම්වල සිට ආගමානුකූල ඇඳුම් දක්වා විවිධත්වයෙන් යුක්ත විය. ආගමික මතයන්ට අනුගතව සැරසී සිටි කාන්තාවන් විසින් ප්‍රකාශ කළේ එම ඇඳුම විසින් තමාට ලබාදෙන ආරක්ෂාවක් නොමැති බවය. එසේම විරෝධතාකරුවන් ප්‍රකාශ කළේ කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවල වගකීම ආණ්ඩුව විසින් භාරගත යුතු බවයි.

# නීතියේ සාධාරණත්වය පිළිබඳ මිත්‍යාව හා යථාර්ථය

නීතියේ සාධාරණත්වය පිළිබඳ මෙරට ජනතාව තුළ ගොඩනගා තිබූ අන්ධ විශ්වාසයන් දිනෙන් දිනම බිඳවැටෙන්නට පටන්ගෙන තිබේ. ලාංකේය ධනේශ්වර ක්‍රමය තුළ නීතිය මේ තරම් හාස්‍යයට ලක්කළ කාලයක් තිබුණේ නම් ඒ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපති ධුරය දැරූ කාලයේය. දැන් ගොඨාභය මේ ආරම්භ කර තිබෙන්නේ ජේ.ආර්. ඉක්මවා යාමේ කටයුත්තය.

**එක රටක්! එක නීතියක්**

වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ බලයට පත්වූයේ විනයගරුක, ප්‍රජාතන්ත්‍රවාදී රටක් සහ එක රටක් එක නීතියක් යන සටන් පාඨය පෙරටු කොට ගෙනය. ඔහුගේ වසර දෙකකට ආසන්න පාලන කාලය තුළ එකම රටක එක නීතිය මිත්‍යාවක් බවත්, නීතිය යනු පාලකයින්ගේ කැමැත්තම බවත් ඔප්පු කෙරෙමින් තිබේ. කොරෝනා නිරෝධායන නීති ක්‍රියාවට නැගීමේ සිට, දූෂිතයන්ට එරෙහි නඩු විභාග දක්වා සියලු කටයුතුවලදී නීතිය පාලකයින්ගේ කැමැත්තට අනුව වෙනස්වන හැටි පෙන්වනු ලැබෙමින් තිබේ. ජනාධිපතිවරයා පසුගිය පොසොන් පොහොයදා සිරකරුවන් කිහිපදෙනෙකුට 'ජනාධිපති සමාව' ප්‍රදානය කරමින් යළිත් නීතිය හාස්‍යයට ලක්කළේය.

තව මාස දෙක තුනකින් නිදහස්වීමට නියමිතව සිටි එල්.ටී.ටී.ඊ. සිරකරුවන් දාසයදෙනෙකු ඇතුළු සිරකරුවන් 93කට පොසොන් පොහොය වෙනුවෙන් ජනාධිපති සමාව යටතේ නිදහස් කිරීමට පියවර ගැනිණි. ජනාධිපතිවරයා විසින් ඒ සමගම මිනීමැරුම් චෝදනාවකට මරණ දඬුවම නියම වී එකී දඬුවම ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ද තහවුරු කර තිබූ දුමින්ද සිල්වාද නිදහස් කරන ලදී. මේ සිදුවීමත් සමග නීතියේ අපක්ෂපාතිත්වය හා ආණ්ඩුව නීතිය හසුරුවන ආකාරය පිළිබඳව විවිධ මත හා විවේචන පළවෙමින් තිබේ.

**නීතිය කාගේ කැමැත්තද?**

සිරකරුවන්ට සමාවදීම සඳහා ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට ලබාදී ඇති බලය මේ දක්වා සියලු ජනාධිපතිවරු විසින් පාවිච්චි කරනු ලැබ ඇත්තේ තම විරුද්ධවාදීන් සිරගත කිරීමට කටයුතු කරමින් සමහර අහිංසකයන් හිරේ සිටියෙදී තම හිතවතුන් නිදහස් කර ගැනීම සඳහාය. එබැවින් ලංකාව තුළ හෝ වෙනත් ඕනෑම රටක නීතියේ ගැටලු තේරුම් ගත යුත්තේ සිදුවීමෙන් සිදුවීමට නොව එහි සමස්ත අරමුණ හා පදනම හඳුනා ගැනීමෙනි.

නීතියේ සාධාරණතාව පිළිබඳව, ස්වාධීනත්වය පිළිබඳව කෙතරම් විග්‍රහ නිර්වචන හා චිත්තාකර්ෂණීය වදන්මාලා තිබුණද සත්‍යය නම් පංති සමාජය තුළ නීතිය පංතිමය උපකරණයක් වන බවය. ධනවාදය තුළ නීතිය බැලූ බැල්මට ස්වාධීන ලෙස පෙනෙන අවස්ථා නැතුවා නොවේ. ධනවාදී සමාජයක් තුළ ධනපති දේපළවලට, ධනපති රාජ්‍යයට, ධනපති පංතියට, ධනපති මතවාදයට අභියෝගයක් නොවන සාමාන්‍ය අපරාධ හෝ වැරදිවලදී නීතිය සාධාරණ හා ස්වාධීන බව පෙනෙනු ඇත. එහෙත් ධනේශ්වර පංතියට හෝ පාලක කණ්ඩායම්වලට කුමන හෝ ආකාරයක අභියෝගයක් එල්ල වන විට පාලක පංතිය සිය කැමැත්ත නීතිය බවට පත්කර ගනියි. සත්‍ය එයයි. 'නීතිය යනු පාලක පංතියේ කැමැත්ත වන්නේය' යනුවෙන් මාක්ස්වාදය තුළ උගන්වනු ලබන්නේ මෙම සත්‍යය වේ. අධිකරණයට අපහාස කළේ යැයි දඬුවම් ලබා සිටින රංජන් රාමනායක සිරගතව සිටියදී මනුෂ්‍ය ඝාතනයකට වැරදිකරු වී සිරගතව සිටි දුමින්ද සිල්වාට ජනාධිපති සමාව ලැබෙන්නේ අප ඉහතින් සඳහන් කළ 'පාලක පංතියේ කැමැත්ත' එය වන නිසාය.

**දේපළ ජීවය කරගත් නීතිය**

ලොව නීතිය බිහිවූයේ 'රජය' බිහිවීමත් සමගය. ලොව තුළ රජය බිහිවූයේ සමාජය දේපළ මත පංතීන්ට බෙදී දේපළ හිමි පංතිය හා දේපළ අහිමි පංතිය අතර ගැටුම් ඇතිවන විට දේපළ හිමි පංතිය වෙනුවෙන් දේපළ අහිමි පංතිය පාගා පාලනය කිරීමටය. ඒ නිසා නීතිය උපතින්ම පක්ෂපාතීය. ඒ දේපළ හිමි පංතියටය. නැතිනම් පාලක පංතියටය. එහි ස්වාධීනත්වය යනු එහි ඇත්ත ස්වභාවය සඟවා තබා ගැනීමේ කඩතුරාවක් පමණි. ජනතාව නීතියෙන් 'සාධාරණත්වය' බලාපොරොත්තු නොවිය යුත්තේ ඒ නිසාය. පංති සමාජය තුළ නීතිය හා යුක්තිය එකක් නොවේ; දෙකකි. යුක්තිය හා සාධාරණය වඩාත් වැඩියෙන් නීතිය බවට පත්වීමට නම් සමාජය පංතිමය අර්ථයෙන් පරිවර්තනය විය යුතුය. වඩාත් සාධාරණ වන්නේ නීතියෙන් පාලනය වන සමාජයක් නොව සිරිත් විරිත් හා ආචාර ධර්ම මගින් හැසිරෙවෙන සමාජයකි. ඒ සඳහා පංති සමාජය අහෝසි වී පොදු දේපළ සහිත, පංති රහිත සමාජයක් නිර්මාණය විය යුතුය.

කෙසේ වෙතත් ධනවාදය තුළ නීතියේ ස්වභාවය පිළිබඳව කාල් මාක්ස් සිය ප්‍රාග්ධනය කෘතිය සඳහා සකස් කළ අත්පිටපත්වල සඳහන් කර තිබේ. එම අදහස 1867දී ප්‍රකාශයට පත්කළ එස්.එන්. ලින්ෂේ (Simon-Nicholas Linguet) නැමැත්තාගේ කෘති තුළද දැකිය හැක. ලින්ෂේ මාක්ස්වාදියෙකු නොව ධනේශ්වර ලිබරල් චින්තකයෙකි. කෙසේ වෙතත් මාක්ස් හා ලින්ෂේ යන දෙදෙනාම 'නීතීන්ගේ ජීවය දේපළ වේ' යනුවෙන් සඳහන් කර ඇත. නීතියේ අරමුණ පෞද්ගලික දේපළ හා එම ක්‍රමය ආරක්ෂා කිරීම බව ඉතා පැහැදිලිව පෙන්වාදෙන ඔවුන් පවසා ඇත්තේ 'නීතීන් පවතින්නේ (පෞද්ගලික දේපළවල) මුලින් බලෙන් පැහැර ගැනීමේ පාප ශෝධනයටත් නව බලෙන් පැහැර ගැනීම් වැළැක්වීමටත්ය' යනුවෙන්ය.

නීතියේ පදනම පෞද්ගලික දේපළත් ඊට අදාළ සමාජ ක්‍රමයත් රැකීම වූ විට නීතිය පාලකයින්ගේ, පාලක පංතීන්ගේ කැමැත්ත වීම වැළැක්විය නොහැක.

**විධායක ජනාධිපති ක්‍රමය හා නීතිය**

නීතිය යනු පාලක පංතියේ කැමැත්ත වුවත් පීඩිතයින් එම නීතිය යටතේ තබා ගැනීමේ වුවමනාව නිසා විශේෂයෙන් ධනවාදී සමාජය තුළ 'නීතිය සාධාරණ හා අපක්ෂපාතී' ලෙස අර්ථ ගන්වන ලදී. එසේම හැකි සෑම විටම පෙනුමෙන් නීතිය සාධාරණ බව පෙන්වීමටද කටයුතු කරන ලදී. ඒ, පංතිමය අර්ථයෙන් අභියෝගයක් නොවන අවස්ථාවලය. දියුණු ධනපති රටවල මාර්ග නීති කැඩූ විට අගමැතිවරයාටද දඩ නියම කිරීම, වංචා දූෂණවලට අසුවන ඉහළ අයටද දඬුවම් දීම වැනි දේවල් ඊට උදාහරණ වේ.

එහෙත් ලංකාව වැනි පසුගාමී ධනපති රටවල එම සංකේතාත්මක සාධාරණත්වය හෝ පවත්වාගෙන යාමට පාලකයින්ට නොහැක. ඔවුන් අමු අමුවේ නීතිය තමන් අතට ගන්නේත් තමන්ට අවශ්‍ය ලෙස 'නීතිය නවන්නේත්' ඒ අනුවය.

ලංකාවේ නීතිය හාස්‍යයට හා අවමානයට පත්කරන ප්‍රධාන තනතුර වන්නේ විධායක ජනාධිපති තනතුරය. එය ව්‍යවස්ථාවෙන්ම නීතියට 'ඉහළින්' තබා තිබේ. ජනාධිපතිවරයාට සිය ධුර කාලය තුළ කරන ලද හෝ නොකර හරින ලද වැරැද්දක් සම්බන්ධයෙන් නඩු පැවරීමට නොහැකි කර තිබේ. 'නීතිය කාටත් එකයි' යන සංකල්පය එතැනින්ම බිඳ දමනු ලැබ තිබේ. එසේම සිරකරුවන්ට සමාව ප්‍රදානය කිරීම සඳහා ජනාධිපතිවරයාට ලබාදී ඇති බලයද අධිකරණය හැල්ලුවට ලක්කිරීමකි. අධිකරණයේ ඉහළම අධිකරණය විසින් පවා නඩු විභාග පවත්වා කරුණු විමර්ශනය කර නඩු වාර්තා ලියා මරණීය දඬුවම ලබා දෙන අයෙකුට ඊට පසුදිනම සමාව දී ගෙදර යැවීමේ බලය ජනාධිපති සතු වූ විට අධිකරණය නඩු විභාග කිරීම තේරුමක් නැති දෙයක් බවට පත්වේ.

**තමන්ගේ මිනිසුන් ගෙදර යැවීම**

මරණ දඬුවමට ලක්වූවන් ඇතුළු සිරකරුවන්ට සමාව දීම සඳහා ජනාධිපතිවරයාට ලැබී ඇති බලය ඔවුන් යොදා ගන්නේ නීතියේ දුර්වලකමක් නිසා දඬුවම් විඳින අහිංසකයෙක් නිදහස් කර ගැනීමට නම්, අසාධාරණ ලෙස සිරගත කළ අයෙක් නිදහස් කර ගැනීමට නම් එහි කිසියම්ම හෝ සාධාරණයක් තිබිය හැක. එහෙත් අපේ රටේ ජනාධිපතිවරුන් මෙම බලය යොදවා ඇත්තේ තම හිතවතුන්, හිතවත් මැරයින්, තම පංතියේ අය නිදහස් කර ගැනීමටය. ජේ.ආර්. ජයවර්ධන සමයේ පාතාල නායකයෙක් හා ස්ත්‍රී දූෂකයෙක් වූ ගෝනවල සුනිල් නැමැත්තාට සමාව දීම මෙහි හාස්‍යජනකම උදාහරණය වේ. ඉන්පසුද එවැනි දේ සිදුවිය. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට වැරදිකාරිය වූ ඇමති බිරියකට සමාව දීම සිදුකළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාය. ඔහු තවත් හිතවතුන් කිහිපදෙනෙක්ම එලෙස නිදහස් කළේය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාද රෝයල් පාක් ඝාතනයේ සැකකරුට සමාව දුන්නේය. දැන් ගෝඨාභයද ඒ දේම කර තිබේ.

මෙවැනි තත්වයක් තුළ නීතියේ ස්වාධීනත්වය ගැන සිහින දැකීම විකාරයකි. මේ ධනපති ක්‍රමයේ හැටිය. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් පිළිබඳ විශ්වාස කරන අය ඉදිරියේ ඇත්තේ එක් විකල්පයකි. ඒ, පවතින පාලන ක්‍රමය වෙනස් කිරීමය.

ධනවාදය මෙලෙස පවතිද්දී අධිකරණයේ කන්‍යාවට සැබෑ ලෙසම කටයුතු කිරීමට සිදුව ඇත්තේ එහි නිර්මාතෘවරු විසින් චිත්‍රණය කර ඇති පරිදි සුරතින් කඩුවක්ද වමතින් තුලාවක්ද රැගෙන දෑස් බැඳ සිටින කන්‍යාවක් ලෙසින් නොව ධනපති පාලකයන් විසින් දූෂණය කොට සිය වසඟයට ගෙන තම විරුද්ධවාදීන්ට එරෙහිව යොදවා ඇති කඩුවක් අමෝරා ගත් පදික වේදිකාවේ සිටින අබිසරු ලියක් ලෙසිනි. අපේ රටේ ජනතාව දැන් යළිත් මුහුණ දෙමින් සිටින්නේ එම කටුක සත්‍යයටය.



**ලංකාවේ නීතිය හාස්‍යයට හා අවමානයට පත්කරන ප්‍රධාන තනතුර වන්නේ විධායක ජනාධිපති තනතුරය. එය ව්‍යවස්ථාවෙන්ම නීතියට 'ඉහළින්' තබා තිබේ. ජනාධිපතිවරයාට සිය ධුර කාලය තුළ කරන ලද හෝ නොකර හරින ලද වැරැද්දක් සම්බන්ධයෙන් නඩු පැවරීමට නොහැකි කර තිබේ. 'නීතිය කාටත් එකයි' යන සංකල්පය එතැනින්ම බිඳ දමනු ලැබ තිබේ. එසේම සිරකරුවන්ට සමාව ප්‍රදානය කිරීම සඳහා ජනාධිපතිවරයාට ලබාදී ඇති බලයද අධිකරණය හැල්ලුවට ලක්කිරීමකි.**



"අප මෙම නිර්ධන පංති අරගලය ගැන කථා කරන්නේ ඉතාමත් අවංක ලෙසිනි. අපගේ පැත්ත, නැතහොත්, අනෙක් පැත්ත තෝරා ගැනීම ඒ ඒ පුද්ගලයාට භාර කටයුත්තකි. පැත්තක් ගැනීම මඟහැරීමට දරන සෑම ප්‍රයත්නයක්ම කෙළවර වනු ඇත්තේ අමාරුවේ වැටීමෙනි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**11වැනි වෙළුම,**
**83-84 පිටු**

# පො ලිටිකල් පංතිය

පොලිටික්ක සිලබස් කවර් කරන්න අමතර පංතියක් දාල තිබුණ කොරෝනා කාලෙමේ. ඉගෙන ගන්න උනන්දු ළමයි නිසා කට්ටිය උදේම පංතියට ඇවිත් පොලිටික්ක පරක්කු හින්දා කඩ කඩා හිටිය. පොලිටික්ක හරි හදිස්සියෙන් වගේ පංතියට ඇතුල් වුණාට හිමීට කොරිඩෝව දිගේ වැනි වැනි එනව කීපදෙනෙක් දැකල තිබුණ.

"ගුඩ් මෝනිං සර්... ගුඩ් මෝනිං සර්" දෝංකාරෙ වගේ ළඟ ළඟම දෙපාරකට ඇහුණට එතන වසන්තියගෙයි අනුරුද්දියගෙයි කටහඬවල් දෙකක්.

"ආයුබෝවන් ළමයිනේ, ඔයාලා සනීපෙන්ද?" පොලිටික්ක මේසෙ උඩ හම් මල්ල තියල පුටුව පස්සට අදින ගමන් කිව්ව.

"සර් මාස්ක් එක නිකටට වැටිල නේද?" කාටත් පෙනිච්ච දේ වුණාට කිව්වෙ කනිය.

"නිකට මොකද... කට මොකද?" පොලිටික්ක හිනාවෙන්ම ඉස්සුව.

"සර්... නහය වැහුණෙ නෑ" කනියගෙන්නෙ බේරෙන්න බැරි.

"ඔය ළමයි මොනව ඉගෙන ගත්තෙ නැතත් ඒකනම් හරියට දන්නව" හීනි නොක්කාඩුවක් කියන ගමන් පොලිටික්ක මාස්ක් එක හැදුව... "ඒක නෙමෙයි ළමයිනේ ඔය ළමයි රිය කතාව බැලුවද?"

"මොන කතාවද සර්... නාඩගම්කාරයොද?" මංජුව කතාවට පැන්න... "දුවමු මිතුර දුවමු" අභිනයෙන් දුවන ගමන්.

"සර් ඇහුවෙ දෙවෙනි ඉනිම ගැනද?" වසන්තිය මුණට වැටුණු කොණ්ඩ රැල්ලක් කොණ්ඩෙට අලවන ගමන් කිව්ව.

"මගු... කියවනව" පොලිටික්ක කටින් පැන්න වචනෙ ගිල්ල... "මම කිව්වෙ ජනාධිපතිතුමාගෙ ජාතිය ඇමතීම ගැන"

"අයියෝ සර්... ඇමතුව නේද ඇමතිල්ලක් විනාඩි 69ක්ම" කනිය දිග පෙන්නුවෙ තනි අතින්.

ඔය ළමය කතාව බැලුවද? පොලිටිකගෙ ඇස් ලොකු වුණා.

"අපේ ගෙදර නං ඔක්කොම බැලුවෙ නෑ සර්. බලපු අයගෙ කියල තිබුණෙ" කනිය කන කැහුව.

"අපේ ගෙදරත් විනාඩි දහයක් විතර බලල ටීවී එක වැහුව සර්" මංජුව වහපු විදිහත් පෙන්නුව "එකමනෙ කියන්නෙ කියල තාත්ත විනාඩි දහයක් විතර බැන බැණත් හිටිය"

"නැහැ ළමයිනේ... කියපු දේවල් ඇහුව කවුරුත් නැද්ද?" පොලිටික්ක ආයෙත් ට්‍රැක් එකට ගන්න බැලුව.

"මොනවද ඉතින්... පසුගිය, පසුගිය, පසුගිය, පසුගිය රජය..." පිටිපස්සෙ පේලියෙන් ඇහුණට කවුද කිව්වෙ කියල කවුරුවත් දැක්කෙ නෑ.

"අනේ අපි බලන් හිටියා ගිය සැරේ පර්ජපුයි සැමනුයි අඩු කරපු නිසා මේ සැරේ වැඩි කරපු තෙල්වත් අඩු කරයි කියලා" අනුරුද්දිය ගෙදර වෙච්ච කතාවක් තමන්ගෙ වගෙ කිව්ව. නැත්තම් පයින් එන අනුරුද්දියට මොන තෙල්ද?


"මම නං සර්ට වැරැද්දක් කියන්නෙ නෑ..." සමන කියනකොට පොලිටික්ක මැදට පැන්න.

"මට කවුරුවත් මුකුත් කිව්වෙ නෑනෙ සමන්" පොලිටික්ක පපුවට අත තියාගත්ත.

"නෑ නෑ මම කිව්වෙ සර් ගැන නෙමෙයි... සර්ගෙ සර් ගැන" පොසොන් පෝය දවස නොවුණත් සමන පොලිටික්කව නිදොස් කොට නිදහස් කළා. "එයාට විතරක් වැරැද්දක් කියන්න බෑ. මේ සිස්ටම් එක ඇතුලෙ කාටවත් මැජික් පෙන්නන්න බෑ. එකම දේ එයා ඒක කියන්නෙ නැතිව වටේ යන එක. දීපු පොරොන්දු ගෙනියන්න බැරි තරම් බර වැඩියි. අවුරුදු 73ක් හොම්බෙන් යවපු රටක් ඇතුලෙ හරි දැක්මක් නැති කෙනෙකුට කරන්න පුළුවන් 'පසුගිය, පසුගිය, පසුගිය... පසුගිය රජය' වගේ කලින් බාසුන්නැහේට බනින වැඩක් තමයි. හැබැයි පෝර නිකං දෙනව කියල පොරොන්දු වෙලා බලයට ඇවිත් ගොවියො දැන් පෝර ඉල්ලනකොට... පරිසරයට ආදරෙයි කියල පැල හිටෝලා පෙන්නල ගෝලයො ලව්ව පරිසරය විනාශ කරනකොට... බඩු මිලට සහන දෙනව කියල ප්‍රසිද්ධියේ කියල දැන් හැටට හැටේ නග්ගනකොට මිනිස්සුන්ට මල පනිනව තමයි. එතකොට ගෝලයො ලව්ව කපුටු පිහාටු වල්ලන්න ඕනෙ වගේ කතා කියල මේක බේරන්න බෑ. මිනිස්සුන්ගෙ ප්‍රශ්නවලට උත්තර නැත්නම් ජාතිය අමතන්න යන්නෙ නැතුව හිටියනම් හරි. ජාතිය අලුතෙන් සර්ව අමතන්න පටන්ගත්තොත් ඒ හින්දනෙ..." සමනගෙ කතාව ඉවරවෙනකොට ෆේස් මාස්ක් එක මුළු මූණම වැහෙන්න දාගන්න තරම් ලොකුවට තිබුණානම් කියල පොලිටික්කට හිතුණ.

## කවුළුව හැරුම් තබමි

# අපේ යුගයේ අසාමාන්‍ය මිනිස් සිතන්නා...



ජූලි 14 යනු රෝහණ විජේවීර නම් අසහාය මිනිසා, අසහාය විප්ලවවාදියා සහ ශ්‍රී ලාංකේය ඉතිහාසයේ දියුණුම මිනිස් සිතන්නා මෙලොවට බිහි වූ දිනයයි. ඔහු මේ සමාජයට කොතරම් නම් දේශපාලන බලපෑමක් කළේදයත් එදා ඔහුට විරුද්ධව ආඩපාලි කියූ, අවලාද නැගූ හතුරන් පවා ඔහුගේ වටිනාකම් ප්‍රකාශ කිරීමට පටන්ගෙන තිබේ. ඔහුට වැරදුණාද, ලංකේය ඉතිහාසයට වැරදුණාද යන්න අනාගතය විසින් තීන්දු කරනු ඇත. ඒ කෙසේ වතුදු විජේවීරයන් අහිමි කර ගැනීම යනු ලාංකේය මිනිසා කළ බරපතළම වැරැද්ද බව මේ වනවිට යළි යළිත් සනාථ වෙමින් තිබේ. ලංකේය විකාරරූපී දේශපාලනයට දාර්ශනික අරුතක් එක්කළ මුල්ම විප්ලවවාදී දේශපාලනඥයා විජේවීරයන් යයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවනු ඇත. ඔහු යනු ඔහුමය. ඔහුගේ නිර්මාණකරුවාද ඔහුමය. ලාංකේය දේශපාලන ඉතිහාසයේ ඔහු අති විශේෂයක් වන්නේ එනිසාමය. "හදන්න! අපි පසුපස ගාටන අය නොව, අපිව ඉක්මවා යන අය."මේ වරක් ඔහුගේ මුවින් පිටවූ විප්ලවීය වදන් වැලයි. තවමත් අපි එය ඉටුකිරීමට සමත්වී ඇත්තෙමුද? මේ ප්‍රශ්නය වරනැගීම සහ උත්තර සෙවීම ඔහුට පුදන ලොකුම උපහාරයයි.

# වියරු මිනිසා...

ප්‍රාභවය කරා ඇදී යන හැම මෘග පාලකයෙක්ම තම අවසන් කාලයේ උමතු වැටී කරන කියන දේවල් කිහිපයක් තිබේ. ඉන් එකක් නම්, තමන්ට 'පොළේ' යන මාධ්‍යවලට වරදාන පුදන ගමන් විරුද්ධ මත දරන මාධ්‍ය මර්දනය කිරීමය. මේ වනවිට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවද තමන්ට හිසරදයක් වූ සමාජ මාධ්‍ය මර්දනය කිරීමට පටන්ගෙන තිබේ. ඉතා ආසන්නයේම දිය හැකි උදාහරණය වන්නේ මුහුණු පොත ඔස්සේ "දැන් සැපද?" කියා ඇසූ තරුණයෙකුව අල්ලා හිරේ දැමීමය.

බුද්ධිමත් පාලකයෙක් නම් කරන්නේ තමන්ට එල්ලවන විවේචන මැදිහත් සිතින් විමසා බලා තම වැරදි සහ අඩුපාඩුකම් අවම කර ගැනීමට පියවර ගැනීමය. අවංකව ස්වයං විවේචනාත්මකව බලා තම වැරදි නිවැරදි කර ගැනීමය. සමහර රටවල දියුණු දේශපාලන සිතිමක් සහිත පාලකයන් එසේ කර ලොවට ආදර්ශ සැපයූ අවස්ථා බොහෝ ඇත. ජනතාවගේ ආරක්ෂාව බල්ලට දමා සියල්ලටම ප්‍රථම තම රජ පවුලේ උදවියට කොවිඩ් එන්නත විදගත් ස්වාර්ථකාමී පාලකයන්ගෙන් නම් එවැන්නක් කිසිදා අපේක්ෂා කළ නොහැක. නූගත්කමයි, උඩඟුකමයි, බලලෝභයයි උතුරා ගිය පාලකයින් ඉතිහාසයේ වේදිකාවෙන් බැස ගියේ 'ඇඩ්‍රුස්' පවා නැතිවය. නමුත් බෙදවාචකය නම් රටේ ජනතාවටද ඇඩ්‍රුස් නැතිකර ඔවුන් චුතවී යාමය.



# කා කතා - චන්ද සලාම්...



මේ සිරිලංකාවේ වංචාවෙන් භාණ්ඩ විකිණීම දැන් හඳුන්වන්නේ නවෝත්පාදන වෙළඳපොළට සපයනවා කියාය. බර අඩුකර, මිල වැඩිකර මේ දිනවල අලුතින්ම වෙළඳපොළට ආ ගෑස් සිලින්ඩරය ලංකාවේ වෙළඳ ඇමති බන්දුල ගුණවර්ධන විසින් හඳුන්වා දුන්නේ නවෝත්පාදන භාණ්ඩයක් ලෙසය. එක අතකින් මෙය පුදුමයට කාරණයක්ද නොවේ. මන්ද අලුත් නිෂ්පාදනයක් උපන්නේකට කරන්න ඉඩ නොදෙන, එවැනි දේවල් දැක නැති මෙවැනි අමන පාලකයින් විසින් කරවන රටක හොර බඩුවලට තවත් නමක් ලෙස නවෝද්පාදන කියා භාවිත කළද අප පුදුම විය යුතු නැත. කිසිදු නිෂ්පාදනයක් නැති රටක 'නවෝපාදන භාණ්ඩ' යනුවෙන් කුඩු පැකට් හොර අරක්කු පැකට් හෙට දිනයේ වෙළඳපොළට හඳුන්වාදීමට තරම් කුසාග්‍ර බුද්ධියකින් හෙබි වෙළඳ ඇමතිවරයෙකු සිටීම ගැන ලංකිකයන් වශයෙන් කෙසේ ආඩම්බර නොවී සිටින්නද? හොර ගෑස් සිලින්ඩර පවා නවෝත්පාදන ලෙස හඳුන්වා දෙන පාලකයින් සිටින රටක " කා කතා... චන්ද සලාම්" කියනවා හැරෙන්නට වෙන මොනවා කියන්නද?

# පුරාජේරු කයිවාරු එපා... මහපොළොවේ ඇත්ත ගැටලුවලට විසඳුම් දෙන්න

පාර්ලිමේන්තු මන්ත්‍රී
විජිත හේරත් සහෝදරයා

*(රාජ්‍ය යාන්ත්‍රණය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් මතුව ඇති අර්බුදය පිළිබඳ කල්තැබීමේ විවාදයට සහභාගි වෙමින්)*

කොරෝනා එක්ක රටේ ප්‍රශ්න රාශියක් පැන නැගිලා තියෙනවා. සියලුම ජනතාව පීඩාවට ලක්වෙලා ඉන්නේ. කොරෝනා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ බොහෝ අඩුපාඩු තියෙනවා. කොරෝනා මධ්‍යස්ථානවල බොන්න වතුර ටික හරියට නැහැ. බොහෝ තැන්වල වැසිකිලි ප්‍රමාණවත් තරම් නැහැ. කොරෝනා මධ්‍යස්ථාන තෙමෙනවා. පීසීආර් පොසිටිව් වෙලා බොහෝ අය ගෙවල්වල ඉන්නේ. පීඑච්අයි මහත්වරුන්ට දැනුම් දුන්නාම ඒ අය කියන්නේ වාහන නැහැ කියලා. පුද්ගලික වාහනවලින් ගෙනියන්න කවුරුත් කැමැති නෑ. ප්‍රශ්න ගොඩයි.

ආණ්ඩුව මොන උත්සාහයක් දරනවා කිවුවත් ඇත්ත තත්වය මේක තමයි. වසංගතය ව්‍යාප්තවීමත් එක්ක ප්‍රශ්න ගණනාවක් පැනනැගිලා. දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ සියලුම පාසැල් දරුවෝ විශාල පීඩාවකට ලක්වෙලා. ඔන්ලයින් අධ්‍යාපනය සාර්ථක එකක් නෙවෙයි. යම්කිසි හැකියාවක් තියෙන අයට ලබාගන්න පුළුවනි. සාතිශය දරුවන්ට පහසුකම් නැහැ. එක පවුලේ ළමයි තුන් හතරදෙනා ඉන්න තැන්වල එක ෆෝන් එක බෙදාගන්න බැහැ. තාත්තා වැඩට ගියොත් ඒ ෆෝන් එක පාවිච්චි කරන්න විදිහක් නැහැ. අපි නිරන්තරයෙන් කිවුවා පාසල් අධ්‍යාපනය විධිමත් කරන්න රජයේ මැදිහත්වීමෙන් රූපවාහිනී නාලිකාවක් ආරම්භ කරන්න කියලා. අයි චැනල් එකේ ඉගැන්වූවාට ඒක විධිමත් ක්‍රමයක් නොවෙයි.

අපේ රටේ පාසල් දුවාදරුවෝ අධ්‍යාපනයේ අසමානතාවකට මේ කාලයේ ලක්වෙලා ඉන්නේ. ඒ නිසා විභාග ප්‍රතිඵල එන කොට බරපතළ ප්‍රතිවිපාක එන්න පුළුවන්. ඒ නිසා අපි යෝජනා කරන්නේ එක්කෝ ඔන්ලයින් පහසුකම් නොමිලේ ලබා දෙන්න. නැත්නම් වඩාත්ම සුදුසු දේ රූපවාහිනිය තුළින් අධ්‍යාපන වැඩසටහන් ලබාදීමයි. මේ වෙනුවෙන් රජය වහාම මැදිහත් විය යුතුව තිබෙනවා.

තවත් ගැටලු ගණනාවක් ඇතිවී තිබෙනවා. සෝමාලියානු කොල්ලකරුවන්ගෙන් නැව්වලට ආරක්ෂාව සපයන කුප්‍රකට ආයතනයේ ජාවාරමක් සිදුවෙනවා. නැව්වලට ආරක්ෂාව සපයන අය ගොඩබිමට ගෙනඒමේ ජාවාරමක් සිදුවෙනවා. ඒ අයට පීසීආර් පරීක්ෂණ තියලා අපහසුතාවට පත්කරලා, පුංචි කොම්පැනි පැත්තකට දාලා, කුප්‍රකට සමාගම බිස්නස් එකට බහිනවා. සමහර අය මේ වන කොට දහවතාවක් විතර කොරොන්ටයින් කරලා. පුංචි පුංචි සමාගම්වල බිස්නස් එක අර කියන කුප්‍රකට කොම්පැනියට ගන්න කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවා.

**කොරෝනා වසංගතය තියෙද්දී සංචරණ සීමා දාලා යන්න එපා කියලා අපිට කියනවා. නමුත් ගාමන්ට් ෆැක්ටරි විධිමත් පාලිත ක්‍රමවේදයක් නැතිව වැඩ කරනවා. කටුනායක, සීදූව, බියගම කලාප තුළ දහස් ගණනක් කාන්තාවෝ පුංචි කාමරවල ඉන්නේ. ෆැක්ටරියේ වැඩට ගෙනියන්නේ එකට. වැඩ කරන්නේ එකට. පොසිටිව් නැති අයට පොසිටිව් වෙනවා. දවස ගානේ මේ කාලය තුළ කොරෝනා රෝගීන් වැඩිවෙනවා. ඒ පවුල්වල අයට ඊට පස්සේ පොසිටිව් වෙනවා. පාලනය කරන්න ක්‍රියාමාර්ග ගත්තා කිවුවාට ආර්ථිකය ගැන හිතලා මේ ගන්න වැරදි තීරණත් එක්ක නැවත බරපතළ විදිහට රෝගය ව්‍යාප්ත වෙනවා.**

මේ සම්බන්ධ තීරණ ගනිද්දී ලෝකෙ රටවල් කෙටි කාලීන වාසි බැලුවේ නැහැ. දිගු කාලීන වාසි බලලයි ක්‍රියාමාර්ග ගත්තේ. ඒත් අපේ රටේ එහෙම නැහැ. ඇඟළුම් කර්මාන්ත ශාලාවල ගර්භණී කාන්තාවන්ට වැඩට එන්න බල කරලා තියෙනවා. ඒ තත්වයත් එක්ක ඔවුන් විශාල පීඩනයකට පත්වෙලා ඉන්නවා. පුද්ගලික ආයතනවල සේවකයන් ගෙන්වීම සඳහා යාන්ත්‍රණයක් හදන්න ඕනෑ. එහෙම නැතිව තවදුරටත් යාම තුළ ව්‍යාප්ත වෙනවා මිස පාලනය වීමක් වෙන්නේ නැහැ. මරණ ගාණ වැඩිවෙනවා. පීසීආර් පොසිටිව් ගාණ වැඩිවෙනවා. ඒ අයගේ පවුල්වල ආශ්‍රිතයින්ටත් දවස ගානේ පොසිටිව් වෙනවා. කොච්චර සංචරණ සීමා දැම්මත් වැඩක් වෙන්නේ නැහැ.

කොරෝනා වසංගතයෙන් පීඩාවට පත්වෙලා ඉන්න අතරේ ධාරානිපාත වර්ෂාවෙන් ගංවතුර නිසා විශේෂයෙන්ම බස්නාහිර පළාතෙත් අනිකුත් පළාත්වලත් ජනතාවට පීඩාවට පත්වෙලා. ඒවා ස්වාභාවික හේතු මත සිදු වුණු දේවල් නෙවෙයි. උදාහරණයක් හැටියට ගම්පහ දිස්ත්‍රික්කයේ අවුරුදු 35 - 40ක් තුළ මෙවැනි ගංවතුරක් ඇතිවෙලා නැහැ. මේ ගංවතුර ඇතිවුණේ අවිධිමත් සංවර්ධනය නිසයි. උත්සවයකදී එක්තරා ඇමතිවරයෙක් කිවුවා, අර වටිනා ගහ ඉවත්කරන්න නොදුන්න නිසා ගංවතුර ඇතිවුණා කියලා. ඒ කියන්නේ කඩවත ඉඳලා මීරිගම දක්වා මහ විශාල පත ගහක්ද තියෙන්නේ. මේ ගංවතුර ඇතිවෙලා තියෙන්නේ ඒ ගහ හින්දා ජල පහර ගලාගෙන යන්න බැරිව බාධා වෙලාද? ඒ වගේ මෝඩ තකතීරු කතා කියන රජයේ ඇමතිවරුන් ඉන්නවා. පරිසරය ගැන, සංවර්ධනය ගැන ඔවුන්ගේ අවබෝධයේ මට්ටම මොකක්ද කියලා හිතාගන්න පුළුවන්. අධිවේගී පාරවල් හැදීමේදී එකඟතාවට ආපු කණු උඩ පාර යනවා කියලා කියූ තැන්වල දැන් පස් පුරවලා තියෙන්නේ. වේයන්ගොඩ ඉඳලා මීරිගම දක්වා යන කලාපයේ කිලෝමීටර් දෙකක් විතර කණු උඩ යනවා කිවුව පාර දැන් පස් පුරවලා තියෙනවා. ඒ නිසා වතුර පාර යන්න ක්‍රමයක් නැහැ. වැව් වගේ අඩි හය හතක් උසට ජල ගැලුම් ඇති වෙලා.



ඒ වගේම අනවසර ගොඩකිරීම් ප්‍රාදේශීය සභා, නගර සභාවලින් දෙන අනවසර බලපත්‍ර එක්ක තමයි අවධිමත් සංවර්ධනය ඇති වෙලා තියෙන්නේ. ඒ නිසයි ගම්පහ නගරය අද යටවෙන තත්වයට පත්ව තියෙන්නේ. ප්‍රධාන නගරයක් වුණු ගම්පහ නගරය අද පුංචි ගංවතුරකටත් යටවෙනවා. ඒ, අවිධිමත් සංවර්ධනය නිසා මිස ගස් හින්දා ඇතිවූ දෙයක් නොවෙයි. ඒ නිසා මේ ගැටලුවට ස්ථිර විසඳුම් දෙන්න වහාම පියවර ගත යුතුයි. ජාඇල පිටාර ගලලා මහ ව්‍යසනයක් ඇතිවුණේ අවුරුදු ගණනක් තිස්සේ ස්ථිර විසඳුමක් ඉල්ලා සිටියත් නොදුන් නිසයි. තාවකාලිකව වැලි කොට්ට පුරවනවා. ගංවරතුරක් ආපු ගමන් හැමදාම ජනතාව පීඩාවට පත්වෙනවා. ඒ නිසා මේ සඳහා පැහැදිලි විසඳුමක් අත්‍යාවශ්‍ය වෙනවා.

ඒ වගේම නැව ගිනි ගැනීමෙන් දැවැන්ත පරිසර විනාශයක් වුණා. ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුව තියෙනවා. තවමත් ආණ්ඩුව මේ නැව ලංකාවට ගෙන්වූ නියෝජිතයා කවුද කියලා හඳුන්වා දී නැහැ. අපිට ආරංචි විදියට ඊට මැදිහත්වෙලා තියෙන්නේ අර්ජුන හෙට්ටිආරච්චි කියන පුද්ගලයෙක් සහ ඔහුගේ සෙට්මිල් ගෲප් කියන සමාගමයි. දැනට තියෙන්නේ මේ කොම්පනිය ගැන තොරතුරු එච්චරයි. ආණ්ඩුව පැත්තෙන් ඒ ගැන පැහැදිලිව රටට කිව යුතුව තිබෙනවා. ලංකාවේ නියෝජිත ආයතනය කවුද කියලා. අදාළ ඒජන්තවරයා දත්ත හැංගුවේ ඇයි කියලා හොයන්න. ඊමේල් පණිවුඩ වෙනස් කළේ ඇයි කියලා අධිකරණය ප්‍රශ්න කරනවා. මෙතන බරපතළ අපරාධයක් සිද්ධවෙලා තියෙන්නේ. ඒක මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් විතරක් නෙවෙයි. අපරාධ නීතිය යටතේ දඬුවම් දියහැකි වරදක්.

ඒ නිසා ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගය මේ රටේ ජනතාව දැනගන්න ඕනෑ. කවුද මේ ඒජන්තවරයා? අර්ජුන හෙට්ටිආරච්චි මහත්තයගේ සෙට්නිල් ගෲප් එකද? එහෙම නැත්නම් වෙන මොකක් හරිද? එතන දත්ත හැංගුවා නම් එහෙම නැත්නම් වෙනස් කළා නම් ඔවුන්ට විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ග මොකක්ද කියන එක මේ සභාවට කියන්න ඕන.

ඒ වගේම පොහොර ප්‍රශ්නය නිසා ගොවි ජනතාව විශාල පීඩාවකට පත්වෙලා ඉන්නවා. කාබනික පොහොර පිළිබඳ කිසිම විරුද්ධත්වයක් නැහැ. කාබනික පොහොර පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් අපි එකඟයි. හැබැයි සෞභාග්‍යයේ දැක්මේ තියෙන්නේ මොකක්ද? "වසර දහයක කාලය තුළ ක්‍රමානුකූලව කාබනික පොහොර ලබාදීමට පියවර ගනු ලැබේ". ඒක තමයි ප්‍රතිපත්තිය. නමුත් දැන් සිද්ධවෙන්නේ ඒක නෙවෙයි. එතනයි ප්‍රශ්නය තියෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කාබනික පොහොර පිළිබඳ සාකච්ඡාවේ කියපු ප්‍රකාශය මට හොඳට මතකයි. පොහොර ආනයනය කරන්න යන වියදම නතර කරගෙන ගොවියන්ට නොමිලේ කාබනික පොහොර දීලා අඩුවෙන අස්වැන්නට වන්දි ලබාදුන්නත් ලාබයි කියලා තමයි කිවුවේ. ගණන් හැදුවේ ඒ වගේ. රසායනික පොහොරවලින් වෙන වකුගඩු රෝගය, ශාරීරික හානි ගැන නෙවෙයි කිව්වේ. ඔබතුමන්ලා ඉන්නේ සල්ලි මතයි. ඒක එහෙම වෙන්න ඕන නැහැ.

ක්‍රමානුකූලව මේ පියවර ගන්න කිසිම ප්‍රශ්නයක් නැහැ. ප්‍රතිශතාත්මකව කාබනික පොහොර ප්‍රමාණය වැඩිකරමින්, රසායනික පොහොර ප්‍රමාණය අඩු කරමින් යනවා නම් මේ රටේ ජනතාව කැමතියි. මහ කන්නයට පොහොර දෙන්න නෙවෙයි, මේ කන්නෙට පොහොර නැහැ. මුළු රටේම ප්‍රශ්නයක්. උතුරෙත් තියෙනවා. ගොවි ජනතාව ඉල්ලන්නේ පොහොර. තමන්ගේ ජීවනෝපාය රැකගන්න. ඒ ප්‍රශ්නයට උත්තරයක් නොලැබුණොත් දැවැන්ත ආහාර හිඟයක් එන්න පුළුවනි. ආහාර හිඟයකින් ආර්ථිකය තවත් වැටෙනවා. දැන් ඩොලර් යනවා කියලා මේ විදියට වැරදි තීන්දුවක් ගත්තොත් ඉන් ඇතිවෙන ආහාර අර්බුදය ඊට වඩා භයානකයි.

ඒ නිසා ඒ වැරදි දේ කරන්න එපා. ඒ වගේම ජීවානුහරණය කළ කාබනික පොහොර ගේන කතාවක් තියෙනවා. ඒ කියන්නේ ක්ෂුද්‍ර ජීවීන් ඉවත් කළ කාබනික පොහොර. මේක මොන විහිළුවක්ද? බයෝ කොම්පෝස්ට් අපේ රටේ හදන්න පුළුවනි. මේවා පිටරටින් ගෙනල්ලා වෙන හානිය වැඩියි. ආක්‍රමණික ශාඛ බීජ අපේ රට තුළ ව්‍යාප්ත වෙනවා. ඒකෙන් කෘෂිකර්මාන්තයට වෙන හානිය බරපතළයි. එදා ගෙනාව යෝධ නිදිකුම්බා තවමත් විනාශ කරගන්න බැරිව ඉන්නේ. ඒ නිසා ඒ අපරාධය කරන්න එපා. අපේ රටේ කාබනික පොහොර හදමු. ක්ෂුද්‍ර ජීවීන් මගින් කාබනික පොහොර නිෂ්පාදනය කරන්න පුළුවන් ක්‍රම තියෙනවා. හැබැයි ඒක එකපාර කරන්න බැහැ. ඇලඩින්ගේ පුදුම පහන වගේ විජ්ජාවලින් කරන්න බැහැ.

ඒ නිසා ඒක හරියට තේරුම් අරගෙන මැදිහත්වෙන්න. එහෙම නැතිවුණොත් රටත්, ජනතාවත් බරපතළ අර්බුදයකට යන බව අවධාරණය කරනවා. කොරෝනා අර්බුදය එක්ක අතුරු ආර්ථික හා සමාජ ප්‍රශ්න ගොඩක් ඇතිවී තියෙනවා. ඒ සියල්ල පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමුකරලා කඩිනම් විසඳුම් දෙන්න. පුරාජේරු කයිවාරුවලින් උත්තර හම්බවෙන්නේ නැහැ. මහපොළොවේ තියෙන ඇත්ත ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබාදෙන්න කියලා බලකරනවා.

## ආණ්ඩුව තුළම...

03 පිටුවෙන්...



ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වන අතර ඔහු ආරක්ෂක ඇමතිකමට අමතරව තාක්ෂණ ඇමතිකමද අතේ තබාගෙන සිටී. මහින්ද රාජපක්ෂ අගමැතිකමට අමතරව මුදල් ඇමතිකම ඇතුළු ඇමතිකම් කිහිපයක් දරයි. චමල් කැබිනට් ඇමතිකමක් හා රාජ්‍ය ඇමතිකමත් තිබේ. නාමල්ට කැබිනට් ඇමතිකමක් හා රාජ්‍ය ඇමතිකමක් තිබේ. ශෂේන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිවරයෙකි. රාජපක්ෂ පවුලේ ඉතිරි අයටද විවිධ තනතුරු දී තිබේ. පවුලේ පාලනයක් ගොඩනොනගන බවට සහතික දුන් ගෝඨාභයගේ පාලනය එසේය. මෙය බොරුව මත බොරුව ගොඩනගා හැදූ පාලනයකි; හොරා පිට හොරා නැග සිටින පාලනයකි; බොරුව හා රැවටීම ආගම කර ගත් පාලනයකි. ධනවාදයේ අර්බුදය තුළ පසුගාමී ධනපති රටක් තුළ දේශපාලනය ජාවාරමක් වූ තත්වයක් තුළ මීට වැඩි දෙයක් බලාපොරොත්තු විය නොහැක. ජනාධිපති, අගමැති, ඇමතිවරු ආණ්ඩුව පමණක් නොව සමස්ත ක්‍රමයම අසාර්ථකය; අසමත්ය.

පවතින ක්‍රමය තුළ රාජපක්ෂ පාලනය රැකගනිමින් අලුත් ගැලවුම්කරුවන් සෙවීම හෝ රාජපක්ෂ පාලනය වෙනුවට මේ ක්‍රමයම රකින වෙනත් ගැලවුම්කරුවන් සෙවීම නිරර්ථක උත්සාහයකි. ජනතාවගේ විකල්ප බලයක් නිර්මාණය කළ යුත්තේත් ජනතාවාදී පාලනයක් සඳහා පෙළගැසිය යුත්තේත් මේ නිසාය.

## ආර්ථිකය කැබලිකර...

07 පිටුවෙන්...



පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කළ ආයතනයක් ලෙස අදාළ නීති වෙනස් කිරීමට යළි පාර්ලිමේන්තුවම එම නීති සංශෝධනය කළ යුතු බවවත් ඔවුහු නොතකති. ඒ තරමටම ජනතාවගේ බලය ඔවුන් හැල්ලු කර පයින් ගසා ඇත.

එසේනම් මේ අභිමි කරන්නේ අවුරුදු 05ක සීමා සහිත බලයක් යොදාගෙන පරම්පරා ගණනක අයිතියකි; අභියෝගයට ලක් කරමින් සිටින්නේ ජනතාවගේ බලයයි. ඒ නිසාම විකිණීමේ මෙවැනි දුෂ්ට වුවමනාවන් පරාජය කළ හැක්කේද මෙවැනි දුබල බලලෝභී පාලකයින් පමණක් නොව මෙම දූෂිත ආර්ථික ක්‍රමයද පරාජය කරන මහජන බලවේගයක් ගොඩනැගීමෙන් පමණි.

## මව්වරුන්ගේ කඳුළු...

08 පිටුවෙන්...

ලොකු ස්ක්‍රීන් එකකට අදාළ පාඩම ප්‍රක්ෂේපණය කර ගත හැකිනම් දරුවන්ගේ දෑස්වලට වඩාත්ම හොඳ බව වෛද්‍යවරු පවසා සිටිති. එසේනම් අමාරුවෙන් හෝ ඔන්ලයින් පහසුකම ලබා ගත්තද ඒ සඳහා භාවිතා කරන උපකරණ අනුවද අදාළ පාඩමට හොඳින්ම සම්බන්ද විය හැකි බව එයින් ගම්‍ය වේ. වෙළඳ සමාගම්ද මේ තත්වය උපයෝගී කර ගනිමින් "ඔබේ දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන්" යැයි පවසා ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍යයයි පවසමින් විවිධ තාක්ෂණික මෙවලම් අලෙවි කිරීම මගින් දෙමව්පියන් සූරා කමින් සිටිති. එයට නොදෙවෙනි වෙමින් විවිධ දුරකථන සමාගම්ද ඒ බව පවසමින් නොයෙක් මාදිලියේ ඩේටා පැකේජ ඉදිරිපත් කර සූරා කෑම තීව්‍ර කරයි. රටේ ජනතාවගේ ඉටු දෙවියන් මෙන් පෙනී සිටින රූපවාහිනී නාලිකාද නක්ෂත්‍ර, රූප ලාවණ්‍ය, ඉවුම් පිහුම්, චිත්‍රපටි ආදිය පෙන්වන කාලයෙන් බිදක් වෙන් කර තම වපසරිය තුළ හෝ දුවා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරනවා පෙනෙන්නට නැත.

ඔන්ලයින් අධ්‍යාපනය ලබා ගැනීමේ අසමානතාවයන් කෙතරම් පැවතියත් අවසානයේ සියලුම දරුවන්ට පහ වසර ශිෂ්‍යත්වය, අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ යනාදී විභාගයන් සඳහා කිසිදු බේදයකින් තොරව සමාන ප්‍රශ්න පත්‍රයක් ලැබෙනු ඇත. ඒවාට ලැබෙන පිළිතුරු පත්‍ර මගින් අසමානතාවයේ ප්‍රමාණය වඩාත් හොඳින් දැක ගත හැකි වෙනු ඇත.

කෙසේ නමුත් හැකි ඉක්මනින් බලධාරීන් අධ්‍යාපනය සඳහා විධිමත් වැඩපිළිවෙළක් ඉදිරිපත් නොකළහොත් අනාගතයේ සමාජයට දායාද වන්නේ මානසික රෝගීන් විය හැකිය. එසේ නැතහොත් ඉතා අඩු වයසින් අධ්‍යාපනය අතහැරදමා වෙනත් ජීවනෝපායක් සොයාගන්නවුන් පිරිසක් විය හැකිය. මේ සියලු ව්‍යසන හමුවේ ලංකාවේ කුටුම්භයක් තුළ දැනටත් පවතින පීඩනයන් පුපුරාගොස් දරුවන්ගේ මව්වරුන්ද සියදිවි නසාගන්නා මට්ටමට පත්වීමට ඉඩකඩ තිබේ.

සැබැවින්ම සිදුව ඇත්තේ කොවිඩ් වසංගතය හරහා අධ්‍යාපනයේ විෂමතාවය වට ගණනාවකින් තීව්‍ර වීමයි. එබැවින් මෙම වසංගතය මගින් ප්‍රකාශ වන අධ්‍යාපනයේ අර්බුදයන්ට සැබෑ විසඳුම් ඇත්තේ සියලුම දරුවන්ට අධ්‍යාපනය සමානව ලැබෙන වැඩපිළිවෙළක් තුළය. කෙසේ නමුත් නව ලිබරල් ආර්ථිකයක් කර තබා දිව යන පාලකයින්ගෙන් මෙවැන්නක් බලාපොරොත්තු විය නොහැක. එනිසා ජනතාවාදී පාලනයක් පිහිටුවා ගැනීමෙන් තොරව මව්වරුන්ගේ දෑසෙහි උනන කඳුළු කිසි දිනෙක නොවියළෙනු ඇත.

## ජනාධිපතිවරයාගේ අදූරදර්ශී...

13 පිටුවෙන්...

ප්‍රතික්ෂේප වීමේ අනතුර අද මතු වී තිබෙනවා.

රසායනික පොහොර සහ යෙදවුම්වලින් ඉවත්වීමේ තීන්දුවක් ගන්නවා නම් කාබනික පොහොර සහ යෙදවුම්වලට ඔරොත්තු දෙන බීජ සම්බන්ධ සැලැස්මක් අවශ්‍යයි. මේ කාබනික යෙදවුම් සහ පොහොර නිෂ්පාදනය කරන්නේ කොහොමද? ඊට අදාළ තාක්ෂණය එක්රැස් කරගන්නේ කොහොමද? ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙළ කුමක්ද යන කිසිවක් කෙරෙහි ජනාධිපතිවරයා අවධානය යොමු කර නැහැ.

ගෝඨාභය රාජපක්‍ෂ මහත්මයා ජනාධිපතිවරණයේ දී ගොවි ජනතාවට පොරොන්දු වුණේ පොහොර සහනාධාරය යටතේ රු. 500ට ලබාදුන් පොහොර මිටිය නොමිලේ ලබාදෙන බවයි. ඔහු ප්‍රකාශ කළේ සියලු පොහොර වර්ග නොමිලේ ලබාදෙන බවයි. වත්මන් විපක්‍ෂ නායක සජිත් ප්‍රේමදාසද සියලු පොහොර නොමිලේ ලබාදෙන බව ප්‍රකාශ කළා. ඒ මොහොතේත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි ප්‍රකාශ කළේ පොහොර සහනාධාරය ලබාදෙමින් ක්‍රමානුකූලව කාබනික යෙදවුම් ප්‍රමුඛතාවයට ගෙන දිරි ගන්වන බවයි. පක්‍ෂයක් හැටියට අපේ වැඩපිළිවෙළේ මූලික අරමුණු 3ක් තිබෙනවා. ආහාර සුරක්ෂිතභාවය එයින් මූලිකයි. එය ජාතික ආරක්‍ෂාවෙත් ප්‍රධානතම කොටසක්. ඊළඟට කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාවගේ ජීවන තත්වය සහ සමාජ තත්වය උසස් කිරීමයි. තුන්වැනිව ජනතාවට වස විෂවලින් තොර ආහාර වේලක් ලබාදීම.

ජීවනෝපාය බවට කෘෂිකර්මාන්තය පත්කරගත්, රටේ ආහාර සුරක්‍ෂිතභාවය නියෝජනය කරන සහ අපනයන සම්බන්ධයෙන් බලපාන ක්ෂේත්‍ර පිළිබඳව මතුවන ගැටලුවලට විවිධ පිළිතුරු සැපයීමට යාමෙන් තව තවත් අර්බුද ඇතිවී තිබෙනවා. මේ තත්වයන් කෙරෙහි වහාම පිළිතුරු ලබාදෙන ලෙස අපි ජනාධිපතිවරයාට බල කරනවා."

## රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය...

13 පිටුවෙන්...

ආණ්ඩුව රට වළ පල්ලට ගෙනයන බව. මෙතෙක් බලයේ සිටි ආණ්ඩු පවත්වාගෙන ගිය වැරදි ක්‍රමය වෙනස් කර රට රකින, රට ගොඩනගන ජනතා විමුක්ති පෙරමුණ පමණයි ජනතාවගේ පැත්තේ සිටින්නේ. මේ බව දකින අවංක අයගෙන් අපි ඉල්ලා සිටිනවා, රට රැක ගනිමින් ගොඩනැගීමට එකතු වෙන අතර මර්දනකාරී ප්‍රතිපත්තිවලට විරෝධය පළ කරමු කියලා."

## තෝරාගන්නේ විස දුමද...

05 පිටුවෙන්...

පිහිටා තිබෙන වරායවල් ආශ්‍රිතවයි. කොළඹ වරාය ලෝකයේ 24වැනි ස්ථානය හොබවනවා. අපේ පිහිටීම සහ වරාය කේන්ද්‍ර කරගත් නව සංවර්ධන සැලැස්මක් අපි හදන්න ඕනෑ. ඒ තුළින් ආර්ථික උපායමාර්ගයේ ප්‍රධාන කරුණු දෙකක් ඉලක්ක කරනවා. ආර්ථික වර්ධනය සහ ආර්ථික සාධාරණත්වය. ආර්ථික සාධාරණත්වය ඇතිකළ හැක්කේ මේ රටේ සියලු පුරවැසියන් ආර්ථිකයට මැදිහත් වීමේ සමාන අවස්ථාවන් නිර්මාණය කිරීමෙනුයි. ආර්ථිකයෙන් විතැන් වෙන මිනිස් පුළුටක් බවට කිසිවෙක් පත් නොවිය යුතුයි. ආර්ථික වර්ධනය වගේම ආර්ථික ප්‍රසාරණයත් සිදු කළ යුතුයි. ඒ තුළින් විතරයි ග්‍රාමීය ජනතාවගේ දුප්පත්භාවය තුරන් කළ හැක්කේ. කොළඹ කේන්ද්‍රගත කරගත් ආර්ථික වර්ධනයකින් ග්‍රාමීය ජනතාවට ලැබෙන්නේ ඇඟිලි අතරින් පෙරී වැටෙන කුඩා බිඳුවක් විතරයි. ඔවුන්ට මරණය තෝරා ගැනීම සඳහා බලකර තිබෙනවා. ඒ නිසා ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීම අපේ ආර්ථික උපායමාර්ගයේ ප්‍රධාන කොටසක්. එය කළ හැකි වන්නේ ආර්ථික වර්ධනයෙන් විතරක් නෙවෙයි. ආර්ථික ප්‍රසාරණයක් ඇති කිරීමෙන්.

ග්‍රාමීය දිස්ත්‍රික්කවල බහුතර ජනතාවක් කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය බවට පත්කරගෙන සිටිනවා. ඔවුන්ගේ ආර්ථිකය සහ සමාජ තත්වය වර්ධනය කළ හැක්කේ කෘෂිකර්මාන්තය වර්ධනය කිරීමෙන් පමණයි. ඉඩම්, ජලය, භූමිය, යෙදවුම්, ගබඩාකරණය පසුඅස්වනු නාස්තිය වළකා ගැනීම සහ වෙළඳපොළ ආදී අට වැදෑරුම් වැඩපිළිවෙළක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුළින් ගොවි ජනතාවගේ ජීවිත නගා සිටුවිය හැකියි. ඒ වගේම දිස්ත්‍රික් ගණනාවක කුඩා තේ වතු හිමියන්ගේ ජීවනෝපාය වර්ධනය කළ හැක්කේ එය සංවර්ධනය කිරීමෙන් පමණයි. ඒ සඳහා වූ දැක්ම අපි ඉදිරිපත් කර තිබෙනවා. මුහුදුකරයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික උපායමාර්ගය ධීවර කර්මාන්තයයි. තාක්‍ෂණය එකතු කරමින් මත්ස්‍ය අස්වැන්න නෙළා ගැනීම, මත්ස්‍ය අභිජනනය, ගබඩාකරණය සහ වෙළඳපොළ ක්‍රමවත් කිරීමෙන් ඒ ජනතාවගේ ජීවිතය නගා සිටුවිය හැකියි. මේ නිසා ජනතාව නියැළී සිටින ආර්ථික ප්‍රභවය සංවර්ධනය කිරීම අපගේ ප්‍රධානම ආර්ථික උපායමාර්ගයයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් පරම්පරාවක් තරුණ තරුණියන් ඉලක්කගත කරගෙන නිර්මාණය කරන්න ඕනෑ. ප්‍රාග්ධනය, තාක්‍ෂණය, දැනුම සහ ලංකාවට තුළ පමණක් නොවෙයි විදේශීය වෙළඳපොළක් ඉලක්කගත කරගෙන සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ජාලයක් ස්ථානගත කරන්න ඕනෑ. ආර්ථික වර්ධනය අත්පත්කර ගැනීමට අපේ පිහිටීම වගේම සම්පත් නිසි ලෙස යොදා ගැනීමත් කරන්න ඕනෑ. උදාහරණයක් හැටියට පුල්මුඩේ ඛනිජ වැලි අඳත් ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් කියන මූලික නිස්සාරණයත් අපනයනය කිරීමට සීමා වී තිබෙනවා. නමුත් ටයිටේනියම් ඔක්සයිඩ් බවට පරිවර්තනය කර අද තිබෙන මිල වගේ පස් ගුණයක් ලබාගන්න පුලුවන්. හැබැයි දශක 05කට වඩා වැඩි කාලයක් මේ දියුණුව අත්කරගෙන නැහැ. එතැනට ප්‍රාග්ධනය, තාක්‍ෂණය කැඳවන්න ඕනෑ. අපි සතු හුණුගල් පද්ධතිය වෙනුවෙන් සිමෙන්ති සමාගම්වලින් ලබාදෙන රාජ්‍යභාගය කොපමණද? හුණුගල් කිලෝ එකක් ශත 60ට ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ ශත 60න් රාජ්‍ය භාගය හැටියට අයිති වෙන්නේ 5%යි. ඒ කියන්නේ ශත 03යි. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 50ක් නිෂ්පාදනය කිරීමෙන් අපට ලැබෙන්නේ රු. 3ක් වගේ මිලක්. ඒනිසා අපේ රටේ සම්පත් ජාතික ආර්ථිකය ගොඩනැංවීමට යොදා ගැනීමේ සැලැස්මක් ඕනෑ. කාලාන්තරයක් තිස්සේ විකුණන මිනිරන් ග්‍රැෆීන් බවට පරිවර්තනය කරන්න පුළුවන් නම් අද මිනිරන් ටොන් එකක් විකුණන ඩොලර් 2,000ක මිල වෙනුවට ග්‍රැෆීන් කිලෝ එකක් ඩොලර් 5,000කට විකුණන්න පුලුවන්. නමුත් තාමත් අමු මිනිරන් ලෙස පිටරට යවනවා.

අපේ රටේ වැදගත් මානව සම්පතක් ඉන්නවා. දැනුම, තාක්‍ෂණය ලබාදෙන්න ලැහැස්ති නම් ලෝකයේ දියුණුතම ශ්‍රම වෙළඳපොළෙන් පංගුවක් අපට අත්පත් කරගත හැකියි. ලෝකයේ නුපුහුණු ශ්‍රම වෙළඳපොළ වෙනුවෙන් දියුණුතම ශ්‍රම වෙළඳපොළ අත්පත් කරගන්න ඕනෑ. සමහර වාර්තාවල සඳහන් වෙනවා මිලියන 03ක් විදේශ රැකියා කරනවා කියලා. තවත් සමහර වාර්තාවල මිලියන 2.5යි. නිශ්චිත වාර්තා නැහැ. නමුත් ලක්‍ෂ 20කට නම් වැඩි බව උපකල්පනය කරන්න පුළුවන්. මේ තුළින් ලංකාවට ලැබෙන්නේ ඩොලර් බිලියන 7.8යි. ලෝක වෙළඳපොළේ ඉතාමත් පහළ ශ්‍රම වෙළඳපොළට අපේ අය සේවය සපයනවා. නමුත් ශ්‍රී ලංකාව තුළ විදේශිකයන් කුඩා ප්‍රමාණයක් රැකියා කරමින් ඩොලර් මිලියන 1,000කට ආසන්න මුදලක් වසරකට ගෙනියනවා. අතිවිශාල පිරිසක් විදේශ රැකියා කරලා ඩොලර් මිලියන 7,800ක් ගේනවා. ලෝක වෙළඳපොළේ දියුණුතම ශ්‍රම සැපයුමකට අධ්‍යාපනයේ පූර්ණ වෙනසක් ඇති කළ යුතුයි. පළවැනි පන්තියට ඇතුල්වන දරුවෙක් වෘත්තීය නිපුණතාවයක් හෝ අධ්‍යාපනයේ ඉහළ ප්‍රමුඛතාවයක් අත්පත් කර නොගෙන එළියට නොදැමිය යුතුයි. ඒ වගේම නිරෝගී ජීවිතයක් වෙනුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සිදුකළ යුතුයි.

මේ ගමන් කරමින් තිබෙන අසාර්ථක ආර්ථික උපායමාර්ගය වෙනුවට නව ආර්ථික උපායමාර්ගයකට අපේ රට අවතීර්ණ කරන්න අපි සූදානම්. රාජ්‍ය පෞද්ගලික ව්‍යවසායකයින් වගේම තරුණ පරපුර ඒකාබද්ධ කළ මෙහෙයුමක් දියත් කරන්න ඕනෑ. ඒ වගේම අවුරුදු 10කින් අපේ රට ගෙනියන තැන ගැන ඉලක්කයක් තියෙන්න ඕනෑ. මේ ගමන් කරමින් තිබෙන ආර්ථික මාවත වෙනුවට නව ආර්ථික මාවතක රට ගොඩනැගීම සඳහා අපට තිබෙන පළමු යෝජනාව මෙයයි. ඒ තුළ ආර්ථික වර්ධනය සහ ආර්ථික සාධාරණත්වය අවශ්‍යයි. එයින් තොරව ඉස්සරහට යන්න බැහැ.

සමාජ සාධාරණත්වය අපේ උපාය මාර්ගයේ මූලික පදනමක්. මේ වනවිට ආදායම් බෙදීයාම අතිශය අසාධාරණයි. ජනගහනයෙන් ඉහළම 10% ජාතික ධනයෙන් 36.5%ක් භුක්ති විඳිනවා. පහළම 10% ජගහනයට ලැබෙන්නේ ජාතික ධනයෙන් 1.1%යි. පසුගිය අවුරුද්දේ කොරෝනා වසංගත පසුබිම තුළත් ඉහළම ආදායම් ලබන අයගේ ආදායම් තවත් වැඩිවී තිබෙනවා. රටේ ජාතික ධනය ඉතා කුඩා කණ්ඩායමක් අත සංකේන්ද්‍රණය වී තිබෙනවා. සමාජ යුක්තිය සහ සාධාරණත්වය ඇති කරන්න නම් ආදායම් බෙදී යාමේ විශාල පරතරය අවසන් කළ යුතුයි. මේ කියන්නේ ආදායම් සමානව බෙදී යාම පිළිබඳ සාකච්ඡාවක් නොවෙයි. නමුත් සාධාරණව බෙදී යාමට සැලැස්විය යුතුව තිබෙනවා. ආර්ථිකයේ සාධාරණත්වයක් නැතිව සංවර්ධනයක් අත්පත් කරගන්න බැහැ. සමාජ යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් ආර්ථික සාධාරණත්වය අතිශය වැදගත්.

අධ්‍යාපනය සාධාරණ ලෙස ලබාගැනීමේ හැකියාවත් තිබිය යුතුයි. මේ සමගම නීතිය ඉදිරියේ සැම දෙනාම සමානත්වය තහවුරු විය යුතුයි. ඊයේ පෙරේදා බැලුවත් ඒ අසමානත්වය පැහැදිලි වෙනවා. නීතියේ සාධාරණත්වයක් නොමැති තැනක සමාජ යුක්තිය සහ සාධාරණත්වයක් අපේක්ෂා කරන්න බැහැ. අපි නීතියේ සාධාරණත්වය ඇති කිරීම සඳහා ශක්තිමත් ව්‍යූහයක් ඇති කරනවා. නීතියේ සාධාරණත්වය තුළින් යුක්තිය සහ සාධාරණත්වය හැම දෙනාටම තහවුරු කරනවා. සමාජ සාධාරණත්වය ඇති වන්නේ ඒ තුළින් පමණයි. එකිනෙකා ඉදිරියේ නැමෙන, වහල්ලු ලෙස සිටින සමාජයකට ඉදිරි ගමනක් නැහැ. ඒ නිසා සමාජයේ සංවර්ධනයක් වෙනුවෙන් අපි අලුත් ප්‍රවේශයක් ලබාදෙන්න ලැහැස්තියි.

අපේ රට අතිශය දූෂිතභාවයට පත් රාජ්‍යයක් බවට පත්වී තිබෙනවා. රට විනාශය කරා ඇදගෙන යන මේ දේශපාලනය වෙනස් කරන්න ඕනෑ. දූෂණයෙන් සිදුවන පාඩුවට වඩා දූෂිත ව්‍යාපෘතිවලින් දිගුකාලීන පාඩු සිදුවී තිබෙනවා. කිසිදු ඵලකට නැති ව්‍යාපෘතිවලට මහා ධනස්කන්ධයක් ණය අරගෙන තිබෙනවා. ඒ නිසා පවතින මේ දූෂිත දේශපාලනය වෙනුවට අදූෂිත දේශපාලනයට වහාම අවතීර්ණ විය යුතුව තිබෙනවා. නව ආර්ථික උපායමාර්ගයක් සමාජ සාධාරණත්වයක් අදූෂිත දේශපාලනයත් කියන විසඳුම් ක්‍රියාත්මක කළ හැකි වන්නේ සාමූහිකවයි. තනි තනි ඉන්ද්‍රජාලිකයන්ට මේ රට බාර දෙන්න එපා. රට ගොඩනැගීම සාමූහික ක්‍රියාවලියක්.

රටක් ගොඩනැගීමට සාමූහික දේශපාලන නායකත්වයක් සහ සාමූහික ක්‍රියාවලියක් අවශ්‍ය වෙනවා. මේ රටේ සාමූහික දේශපාලන නායකත්වයක් තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන සහ අපි ඒකරාශී වී තිබෙන බලවේගයන්ට පමණයි. මේ රටේ සාමූහික දේශපාලන නායකත්වයක් ගොඩනගන්න ඉඩ දෙන්න. ඒ තුළ කර්මාන්තකරුවන්, ආයෝජකයන්, මේ රටේ රාජ්‍ය සේවාව ඒකරාශී කරගන්න ඕනෑ. මේ රට ගොඩනැගීම කළ හැක්කේ අපි හැම දෙනාම යම් කැපකිරීමක් මෙහෙයවීමක් කිරීම තුළින් පමණයි. දේශපාලකයින් හැටියට අපිට පැවරරෙන කොටස වෘත්තීයවේදීන්ට පැවරෙන කොටස, පෞද්ගලික අංශයට පැවරෙන කොටස සහ පොදු මහජනයාට පැවරෙන කොටස තේරුම් ගත යුතුයි. අන්න ඒ සාමූහිකභාවයේ නායකත්වය දෙන්න අපි සූදානම්. අතිශය අසාර්ථක මේ මාවත මුළුමනින්ම අපි වෙනස් කරමු.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර පැලවත්ත, බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





අසාධාරණ තෙල් මිල වැඩි කිරීමට එරෙහිව...




දැයේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන්...




සමුදුරු විනාශයට ඉඩදීමට එරෙහිව...



මැති ඇමති වාහන ආනයනයට එරෙහිව අධිකරණයට



ගොවිජන දුකට හඬක් වී...




දිවි පිදූ සිසු විරුවන් සමරා...

# ජනාධිපතිවරයාගේ අදූරදර්ශී තීන්දුව නිසා, ගොවි ජනතාව ගොවිතැන අත්හැරීමේ අවදානමක් තිබෙනවා



**ජනතා විමුක්ති පෙරමුණේ නායක**
**අනුර දිසානායක සහෝදරයා**

කාබනික පොහොර සැපයුමක් තහවුරු නොකර ජනාධිපතිවරයා විසින් පොහොර සම්බන්ධයෙන් ගත් ක්ෂණික තීරණය නිසා රටට අවශ්‍ය අවශ්‍ය ආහාර ප්‍රමාණය නිෂ්පාදනය කර ගැනීමේ ගැටලුවක් මතු විය හැකි බවත් ගොවි ජනතාව කෘෂිකර්මාන්තය අත්හැරීමට පෙළඹිය හැකි බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ජනාධිපතිවරයා විසින් සිදු කර ඇත්තේ ගොවි ජනතාව කෘෂිකර්මාන්තයෙන් පළවා හැර ඒ ඉඩම් බහුජාතික සමාගම්වලට පවරා දීමේ සැලැස්මේ කොටසක් දැයි සැක උපදින බව පෙන්වා දුන්නේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 04වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"අපේ රටට 60-70 දශකවල ඉතාමත්ම හොඳ කෘෂි ව්‍යාප්ත සේවයක් තිබුණා. කෘෂි උපදේශක යාන්ත්‍රණයක් තිබුණා. දැන් එය මුළුමනින්ම කඩා වැටිලා. රූපවාහිනී දැන්වීම් සහ කඩේ මුදලාලි අදාළ කෘෂි රසායන ගැන ගොවි ජනතාවට කරුණු කියන්න පටන් ගත්තා. කෘෂි ව්‍යාප්ත සේවය බිඳ වැටීමෙන් ඒ උපදේශකයින් බවට පත්වුණේ ව්‍යාපාරික සමාගම්. ඒ තුළින් මේ මහ පොළොව වස-විෂවලින් පිරී ගොවි ජනතාවට ජීවත් වීමේ ආදායම් මාර්ග අහිමි වීමත් පාරිභෝගික ජනතාවට වස විෂවලින් පිරි ආහාර ලැබීමත් සිදුවුණා.

මෙයට විසඳුම් වශයෙන් කාබනික පොහොර භාවිතයට යොමු විය යුතු බවට සාකච්ඡාවක් මතුවුණා. මේ දක්වා ස්වේච්ඡාවෙන් මැදිහත් වී කාබනික ගොවිතැන ප්‍රචලිත කළ විශාල පිරිසක් ඉන්නවා. එයට අපේ පක්ෂයත් ප්‍රබල දායකත්වයක් ලබා දෙමින් තිබෙනවා. ක්‍රමානුකූලව කාබනික ගොවිතැන පිළිබඳව සමාජයේ අවධානයත් යොමු වී තිබෙනවා. හැබැයි ජනාධිපතිවරයා රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක ආනයනය මුළුමනින්ම නතර කිරීමේ ගැසට් නිවේදනයක් මැයි මාසේ 06වැනිදා ප්‍රකාශයට පත්කළා. ඒ තුළින් සමාජය තුළ ආන්දෝලනයක් ඇතිවී තිබෙනවා. ඔහුගේ මේ ක්ෂණික තීරණය නිසා කාබනික ගොවිතැන මුළුමනින්ම

*12 වැනි පිටුවට*

# රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට යුරෝපා සංගමයෙන් බලපෑම් එන තුරු සිටිය යුතු නැහැ



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්**
**ටිල්වින් සිල්වා සහෝදරයා**

ආණ්ඩුව තමන්ගේ විරුද්ධවාදීන් මර්දනය වෙනුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කරමින් සිටින බවත් රට තුළ ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස කටයුතු කරමින් සිටින බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට යුරෝපා සංගමයෙන් බලපෑම් කරන තුරු සිටි යුතු නැති බවත් යුරෝපා සංගමය විසින් ජී.එස්.පී. ප්ලස් සහනය නතර කළහොත් එහි වගකීම ආණ්ඩුව විසින් බාර ගත යුතු බවත් අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"යුරෝපා සංගමයට මෙතරම් විශාල ඡන්ද සංඛ්‍යාවක් සහිතව අපේ රටට විරුද්ධව යෝජනා සම්මත කරගන්න හැකි වෙන්නේ ආණ්ඩු දිගින් දිගටම මානව හිමිකම් කඩ කරමින් ගෙනගිය ක්‍රියාමාර්ග නිසා. මේකෙන් සිද්ධ වෙන ආර්ථික හානියට ආණ්ඩුව වගකියන්න ඕනෑ. ඒ යෝජනා සම්මතයන් ගැන ප්‍රශ්නයක් නැහැ කියලා ආණ්ඩුව කයිවාරු ගහයි. නමුත් මේකෙත් බරපතල ප්‍රශ්නයක් තියෙනවා. ලංකාවේ අපනයන ආදායම යුරෝපා සංගමය තුළින් යුරෝ බිලියන 2.3ක් ලැබුණා. ජී.එස්.පී. ප්ලස් සහනයෙන් යුරෝපා සංගමයට වැඩිපුරම අපනයනය කළේ ඇඟළුම් සහ මත්ස්‍ය නිෂ්පාදන. ජී.එස්.පී. සහනය නතර කළොත් අපේ ඇඟළුම්වලට කෝටා එක නැති වෙනවා. විවෘත වෙළඳපොළේ තරග කරන්න සිදුවෙනවා. මත්ස්‍ය නිෂ්පාදනයටත් එහෙමයි. මේ නිසා යුරෝබිලියන 2.3ක ආදායම අහිමි වීමෙන් මේ රටේ වැඩ කරන ශ්‍රම බලකායට විශාල බලපෑමක් සිදුවෙනවා. යුරෝපා සංගමය කියන්නේ දෙවන විශාලතම අපනයන වෙළඳපොළයි. මේ වෙළඳපොළ නැතිවෙන්නේ රට ණය බරින් මිරිකිලා බංගලිදේශයෙනුත් ණය ගන්නා තත්වයකදීයි.

රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර මානව හිමිකම් ආරක්ෂා කර, කොරෝනා නීති පවා ආණ්ඩු විරෝධීන් මර්දනය කිරීමට යොදා ගැනීම වහාම නවත්වන්න ඕනෑ. මේ මර්දනකාරී ප්‍රතිපත්ති වහාම හකුළා ගන්න කියලා අපි ආණ්ඩුවට බල කරනවා. අපි ජනතාවට කියන්නේ

*12 වැනි පිටුවට*

# තෙල් මිල අඩුවීමේදී අයකරගත් මුදලින් ජනතාවට සහන දිය යුතුයි



**ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික**
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

පහුගිය කාලයේ තෙල් බැරලයක මිල ඩොලර් 40ට අඩුවුණු මෙහොතේ එම සහනය ජනතාවට ලබා ලබා නොදුන් ආණ්ඩුව පසුකාලීනව තෙල් මිල වැඩිවූ අවස්ථාවලදී සහන ලබාදීම වෙනුවෙන් ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල නමින් අරමුදලක් හදන බව ප්‍රකාශ කළ බව මතක් කර දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ආණ්ඩුව එම අරමුදල පිළිබඳව කිසිවක් ප්‍රකාශ නොකරන බවත් එම අරමුදලින් ජනතාවට සහන ලබා දිය යුතුව ඇති බවත් පෙන්වා දුන්නේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

"මහ බැංකු වාර්තාවේම සඳහන් කර තිබෙන්නේ "වෙළඳපොළේ සැලකිය යුතු ලෙස පහළ ගොස් තිබෙන ඛනිජ තෙල් මිල ගණන්වලින් ප්‍රතිලාභ ලබමින් මාස 06ක් තුළ බිලියන 200ක මුදලක් රැස් කිරීමේ ඉලක්කය ඇතිව රජය විසින් ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල පිහිටුවනු ලැබේ" කියලා. ඉන්ධන මිල ස්ථාවරය පවත්වාගෙන යෑමේ අරමුදල මිල අඩුවුණු වෙලාවේ පිහිටවූවා. දැන් ඒ අරමුදලට මොකද වුණේ?

මාස කිහිපයකට කලින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බිලියන 33.9ක මෙහෙයුම් ලාභයක් තිබුණා නම්, අනික් පැත්තෙන් කෝටි 20,000ක අරමුදලක් හැදුවා නම් ජනතාවට දෙනවා කියූ සහනය දැන් දෙන්න ඕනෑ. ඒ වගේම මේ මිල වැඩිකිරීමෙන් ඉන්දියාවේ අයි.ඕ.සී. සමාගමටත් විශේෂ වරප්‍රසාද ලබාදී තිබෙනවා. මේ අනුව මිල වැඩි කිරිමෙන් විතරක් අයි.ඕ.සී. සමාගම පෙට්‍රල් ලීටරයකින් 12.84ක අමතර ලාභයක් ලබනවා. ජනතාවට සහන දෙන්න ඕන වෙලාවේ තෙල් සංස්ථාවට කොටසක් ලබාගන්න අතර අයි.ඕ.සී. එකට විශාල ලාභයක් ලබාගන්න ඉඩ හදලා දෙනවා.

ආණ්ඩුව කරලා තියෙන්නේ ජනතාවට පාරට බහින්න බැරි කරලා කොරෝනා වසංගතය පිට දාලා තවත් බර පැටවීමයි. අපි කවුරුත් එකතු වෙලා මුළු රටක් හැටියට විරෝධය පාන්න ඕනෑ."

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.